

ගම්පහ විකුමාරච්චි
දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

கம்பஹா விக்ரமாராச்சி
சுதேச மருத்துவப் பல்கலைக்கழகம்

GAMPAHA WICKRAMARACHCHI
UNIVERSITY OF INDIGENOUS MEDICINE

වාර්ෂික වාර්තාව හා ගිණුම්

ஆண்டறிக்கையும் கணக்கும்

ANNUAL REPORT & ACCOUNTS

2022

දැක්ම...

“දේශීය වෛද්‍ය ක්‍රමය සහ සේවා පිළිබඳ අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම”

මෙහෙවර...

“ජාතික සහ ගෝලීය අවශ්‍යතාවන් සපුරාලන දැනුම, කුසලතා සහ ආකල්පවලින් පොහොසත් වෘත්තිකයින් බිහි කිරීම පිණිස දේශීය වෛද්‍ය ක්‍රමය සහ විද්‍යා පිළිබඳ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ඉගෙනුම් පරිසරයක් සැලසීම සහ නවීන පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම”

විශ්වවිද්‍යාලයේ ඉලක්ක...

01 වැනි ඉලක්කය දේශීය වෛද්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම

02 වැනි ඉලක්කය දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම හරහා දේශීය වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනයට ඇති ප්‍රවේශය වැඩි කිරීම

03 වැනි ඉලක්කය දේශීය වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදනය හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම

04 වැනි ඉලක්කය ඉහළ ගුණාත්මක, කාර්යක්ෂම මානව ප්‍රාග්ධනය සමඟ විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම

05 වැනි ඉලක්කය ශක්තිමත් නිපුණතාවයෙන් පොහොසත් උපාධිධාරියෙකු බිහි කිරීම

06 වැනි ඉලක්කය කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණ සංස්කෘතියක් අත්කර ගැනීම පිණිස ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති හරහා විශ්වවිද්‍යාලයේ පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම



උපකුලපතිතුමාගේ සමාලෝචනය



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව නිකුත් කිරීම මාගේ ඉමහත් ප්‍රීතියට කරුණකි. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය නවීන ජීවිතයේ අභියෝග ජයගැනීම පිණිස වර්ෂ ගණනාවක් තිස්සේ යොදා ගන්නා දේශීය දැනුම් පද්ධතිවල ප්‍රගතිය වෙනුවෙන් කැපවී සිටින ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනයකි. අධ්‍යයන ක්‍රියාකාරකම්, පර්යේෂණ සහ සමස්ත ගුණාත්මකභාවය යනා දී අංශ අනුව සැලකීමේ දී විශ්වවිද්‍යාලය සීඝ්‍ර ඉදිරි ගමනක් වෙනුවෙන් පියවර ගෙන ඇති බවට අනාවරණය වේ. එහි මූලාරම්භයේ අද්විතීයත්වය අඛණ්ඩ සුරකිමින්, ආයතනය එහි භෞතික යටිතල පහසුකම් සහ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කර ඇති අතර අවසානයේ දී ජාතික විශ්වවිද්‍යාලයක් මට්ටම අත්කර ගෙන ඇත. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය අපරදිග සහ බටහිර දැනුම පාදම් දෙකම ඇදා ගනිමින් ඉගෙනුම් සහ පර්යේෂණ සංස්කෘතියක් ගොඩනගා ඇත. මෙම නව විශ්වවිද්‍යාලය ඉදිරි වසර කිහිපය තුළ දී විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. මානව ශිෂ්ටාචාරයේ ප්‍රගමනය වෙනුවෙන් සිය සේවාවන් කැපකිරීමට සමත් දැනුමින් පොහොසත්, දක්ෂ නිපුණ වෘත්තිකයින් උත්පාදනය කිරීමට විශ්වවිද්‍යාලය ඉලක්ක කරයි. මෙම වාර්තාව මඟින් අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන ව්‍යායාමයන් අනුව පීඨ හතර මඟින් අත්කර ගෙන ඇති ජයග්‍රහණ අවධාරණය කරනු ලබයි. විශේෂයෙන්ම වර්තමාන ජාතික සහ ගෝලීය දුෂ්කරතාවන් සැලකීමේ දී විශ්වවිද්‍යාලය ඉතාම කෙටි කාලයක් ඇතුළත අති විශිෂ්ට දියුණුවක් සාක්ෂාත් කර ගෙන ඇත.

නැසී ගිය ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මැතිතුමා වර්ෂ 1929 දී ජාතියේ අවශ්‍යතාවක් සපුරාලමින් “ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය” ස්ථාපිත කරමින් මෙම විශ්වවිද්‍යාලය සඳහා පදනම ආරම්භ කරන ලදී. විශ්වවිද්‍යාලයේ පළමු උපකුලපති වන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ “කැළණිය විශ්වවිද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය” 2021 වර්ෂයේ දී රාජ්‍ය විශ්වවිද්‍යාලයක් මට්ටමට උසස් කිරීම සඳහා ඉමහත් සේවයක් ඉටු කරන ලදී.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ ඉහළ අධ්‍යාපන ප්‍රමිති, පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රදර්ශනය කරනු වස් දේශීය දැනුම විද්‍යාව පාදක තාක්ෂණය සමඟ මුසු කර ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය සම්බන්ධයෙන් පදනමක් ස්ථාපිත කිරීම පිණිස වේ. විශ්වවිද්‍යාලය පීඨ හතරකින් සැදුම්ලත් වේ: දේශීය වෛද්‍ය විද්‍යා පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය එම පීඨ වේ. දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය බණ්ඩාරගම පිහිටා ඇති අතර අනෙකුත් පීඨ තුන යක්කල ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. සියලුම පීඨ හතර අධ්‍යයන දෙපාර්තමේන්තු 14කින් සමන්විත වේ. විශ්වවිද්‍යාලය

2021 වර්ෂයේ දී ප්‍රථම උපාධිධාරීන් සඳහා නව උපාධි වැඩසටහන් කිහිපයක්ම හඳුන්වා දී ඇති අතර පසුව ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම් සඳහා නව පාඨමාලා හඳුන්වා දී ඇත.

ජයග්‍රහණ

- දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨයේ සහ දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨයේ 2020/2021 පළමු ශිෂ්‍ය කණ්ඩායම සඳහා වූ දිශානුගත වැඩසටහනේ සමාරම්භක උත්සවය සාර්ථකව පවත්වන ලදී.
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල සම්මාන උළෙළ 2022.03.01වැනි දින පවත්වන ලදී.
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සංවිධානය කළ දේශීය දැනුම් පද්ධති පිළිබඳ බහු-විෂය ප්‍රවේශ පිළිබඳ 1වැනි අන්තර්ජාතික පර්යේෂණ පරිසංධානය (IRSIKS 2022) සාර්ථකව පවත්වන ලදී. මෙම පරිසංධානය විශ්වවිද්‍යාලයේ පළමු වැනි සංවත්සරයට සමගාමීව සංවිධානය කරන ලදී.
- දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය බණ්ඩාරගම පිහිටි සර්වෝදය උසස් ඉගෙනුම් ආයතනයේ (SIHL) නව පරිශ්‍රයට නිල වශයෙන් මාරු කරන ලදී.
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය ගම්පහ ඉදිගොල්ල හි දී අභිනවයෙන් ස්ථාපිත කරන ලදී.
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය විදේශීය විශ්වවිද්‍යාල රාශියක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.
- ප්‍රජාවගේ සුභසිද්ධිය නංවාලනු වස් නුදුරු අනාගතයේ දීම යක්කල ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ "ආයුර්වේද කලාපයක්" දියත් කිරීමට නියමිත වේ.
- රූපලාවන්‍ය කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා රූපලාවන්‍ය විද්‍යාව ආශ්‍රිත දැනුම, හැකියාවන් සහ නිපුණතා ඇති සුදුසුකම් සපුරාලන උපාධිධාරීන් සහ නිපුණතා සහිත වෘත්තිකයින් සහ ව්‍යවසායකයින් බිහි කිරීමේ අරමුණු ඇතිව රූපලාවන්‍ය විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහනේ විෂය නිර්දේශය සහ විෂයමාලාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පළමු වැනි ප්‍රථම උපාධිධාරී පර්යේෂණ කොලෝකියම (Research Colloquium (URCFIM 22) සාර්ථකව පවත්වන ලදී.
- රුසියාවේ රෂියන් චුවාෂ් ස්ටේට් පෙඩගොගිකල් විශ්වවිද්‍යාලය (Russian Chuvash State Pedagogical University) රුසියානු භාෂාව සහ සංස්කෘතිය පිළිබඳ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

විශ්වවිද්‍යාලයේ විශේෂ අවස්ථාවන්

❖ **2022.12.30** වැනි දින පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.



❖ මිශ්‍ර අධ්‍යාපනය සඳහා පුහුණුව, සැලසුම්කරණය, සංවර්ධනය සහ පාඨමාලා ලේඛන" කෙටුම්පත් කිරීම **2022.12.17** වැනි දින



❖ විකුම් අභිමන් **2022**



❖ සංචාරක දිනය සැමරීම





මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න
උපකුලපති

පටුන

දැක්ම … i

මෙහෙවර … i

විශ්වවිද්‍යාලයේ ඉලක්ක … i

උපකුලපතිතුමාගේ සමාලෝචනය ii

1. හැඳින්වීම – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 1

1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය 2

1.2 විශ්වවිද්‍යාලයේ සන්ධිස්ථාන 3

2. විශ්වවිද්‍යාලයේ සාරධර්ම 4

3. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය 5

4. පාලක සභාවේ සාමාජිකයින් – **2022** 6

5. විශ්වවිද්‍යාලයේ නිලධාරීහු - **2022** 7

6. පීඨ සහ අධ්‍යයන අංශ 8

7. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන් 9

8. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් 9

9. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා 9

10. දේශීය ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – **2022** 10

11. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර 11

12. උපාධිධාරී නිමැවුම – **2022** 11

13. පශ්චාත් උපාධි නිමැවුම – **2022** 11

14. මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – **2022** 12

15. ශිෂ්‍ය කටයුතු 13

15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2022 14

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2022 14

16. මානව සම්පත් 15

16.1 **2022.12.31** දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 16

17. පර්යේෂණ සහ සංවර්ධනය 17

17.1 පර්යේෂණ කවුන්සිලය 18

17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර 20

17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර 22

18. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන 24
18.1 පුස්තකාලය 25
18.2 ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය 28
18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය 30
18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 35
18.5 වෛද්‍ය මධ්‍යස්ථානය 37
18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය 37
18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය 40
18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) 42
18.9 සමාජ සංහිදියා මධ්‍යස්ථානය (SRC) 43
18.10 තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය 45
18.11 ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් මධ්‍යස්ථානය (ELTC) 50
18.12 මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය 51
18.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC) 52
19. ගිණුම් **2022** 54
19.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 55
19.2 ප්‍රාග්ධන වියදම පිළිබඳ විස්තර 55
19.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) 55
19.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) 56
19.5 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2022 56
19.6 ඒක ශිෂ්‍ය පිරිවැය 2018 – 2022 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ඇතුළුව) 56
20. මූල්‍ය ප්‍රකාශන **- 2022** 57
21. තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූල වීම **2022/2023** 80
22. විගණාධිපති වාර්තාව **- 2022** 88
23. 2022 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු 96

කෙටි යෙදුම්

GWUIM	-	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
FIM	-	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
FIHST	-	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය
FISSMS	-	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය
FGS	-	පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
SDC	-	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ICTC	-	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය
CGU	-	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
CGEE	-	ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය
SRC	-	සමාජ සංහිඳියා මධ්‍යස්ථානය
CQA	-	තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය
DR	-	නියෝජ්‍ය ලේඛකාධිකාරී
SAR	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
SAL	-	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
SAIA	-	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
AR	-	සහකාර ලේඛකාධිකාරී
AB	-	සහකාර මූල්‍යාධිකාරී



1. හැඳින්වීම – ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය



විශ්වවිද්‍යාලය කොළඹින් කිලෝ මීටර 30ක් පමණ දුරින් කොළඹ - නුවර මාර්ගයේ යක්කල ප්‍රදේශයේ පිහිටා ඇත. අභාවප්‍රාප්ත වූ ආයුර්වේද චක්‍රවර්ත්‍රී පණ්ඩිත ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929 වර්ෂයේ දී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ලෙස මෙම ආයතනය ස්ථාපනය කිරීම සමඟ මෙම ආයතනය ආරම්භ කරන ලදී. ඒ සාම්ප්‍රදායක වෛද්‍යවරුන් හට ඔසු ඖෂධ සකස් කිරීම සහ චිකිත්සාව ඇතුළු අෂ්ඨාංග ආයුර්වේදය පිළිබඳ දැනුම සහ නිපුණතා ලබාදීම පිණිස යක්කල පිහිටි තම පෞද්ගලික ඉඩමේ දීය. ඖෂධ නිෂ්පාදන ඒකකයක්, රෝහලක් සහ දුර්ලභ ඖෂධ පැළ එකතුවකින් සැදුම්ලත් ඖෂධ උද්‍යානයක් ආයතනය ආරම්භක අවස්ථාවේ දී ආයතනය සතුවූ අගනි සම්පත් විය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ නැඟී එන නව ප්‍රවණතා සහ එමඟින් ජාතික සෞඛ්‍ය අංශයට දක්වන අති විශාල දායකත්වය හඳුනා ගනිමින් 1951 වර්ෂයේ දී විද්‍යාලය රාජ්‍ය පිළිගත ආයතනයක් බවට ප්‍රකාශ කරනු ලැබුවේ එකී ආයතනයෙන් පිරිනමන ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය අංශයේ ආයුර්වේද රෝහල්වල සේවයට සුදුසුකම් සපුරාලන වෘත්තිකයින් බවට පත් කරමිනි. 1982 වර්ෂයේ දී සම්මත කළ 1982 අංක 30 දරන පාර්ලිමේන්තු පනත මඟින් විද්‍යාලය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය ලෙස සංස්ථාගත කරන ලදී. වර්ෂ 1995 පෙබරවාරි 23 වැනි දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ආයතනය කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමත් සමඟ එය විශ්වවිද්‍යාල විද්‍යායතනයක තත්ත්වයට උත්ශ්‍රේණිගත කරන ලදී.

2020.07.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට සමගාමීව යක්කල, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම සඳහා තීරණය කරන ලදින් වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා වූ එකී නියෝගය 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් නිකුත් කරන ලදී.

නව විශ්වවිද්‍යාලයට පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 13ක් ඇතුළත් වන අතර ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 09ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

නිර්මාතෘ පණ්ඩිත ජී පී වික්‍රමාරච්චි ශ්‍රීමතාණන්. ඔහු ඉටු කළ කාර්යභාරයට ඉතා පුළුල් පිළිගැනීමක් හිමි වූ අතර ඔහු ආයුර්වේද වෛද්‍යවරයෙක් සඳහා පිරිනමන ඉහළම ගෞරවය වන ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පිරිනමන ‘ආයුර්වේද චක්‍රවර්ති රාජ වෛද්‍ය’ යන අභිධානය ප්‍රදානය කළ පළමු වැන්නා විය. (ඡායාරූපය සීමාසහිත ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද ඖෂධ (පුද්ගලික) සමාගමෙන් ලබා ගන්නා ලදී).



1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය

“සෞභාග්‍යයේ දැක්ම” වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම ඉහළම ප්‍රමුඛතාව විය. ඒ අනුව, 2020 ජූලි 08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී විද්‍යායතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමට තීරණය කරන ලදී. නව විශ්වවිද්‍යාලය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය යටතේ 2021 මාර්තු 01 වැනි දින සිට ස්ථාපනය කරනු ලැබූ අතර

2021 පෙබරවාරි මස 28 වැනි දින සිට 1995 පෙබරවාරි මස 23 දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් අවලංගු කරන ලදී.

දේශීය වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සහ අනාගත ඉල්ලුම සපුරා ලිය හැකි එකී ක්ෂේත්‍රවල මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය වේ. විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායක විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක නොවේ. ඇතැම් උපාධි වැඩසටහන් පැවැත්වීම සහ නේවාසිකාගාර පහසුකම් සලසා ලනු පිණිස පෞද්ගලික රාජ්‍ය හවුල්කාරත්ව (PPP) වැඩසටහන් ඇති කර ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත. ශිෂ්‍යයින්ට කථිකාචාර්යවරුන්ගේ සහ කාර්මික විද්වතුන්ගේ අධීක්ෂණය යටතේ ආධුනිකයෙක් වශයෙන් වැඩ කරන අතරතුර ඔහු/ ඇය පන්ති කාමරය තුළ දී අත්කර ගන්නා න්‍යායාත්මක දැනුම සැබෑ ලෝකයට අදාළ කර ගැනීමට අවස්ථාව හිමි වන "ඉගෙනුම අතර වැඩ කිරීම" සංකල්පය ලෙස නව සංකල්පයක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි.

1.2 විශ්වවිද්‍යාලයේ සන්ධිස්ථාන

1929 •ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929.07.19 වැනි දින ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ආරම්භ කරන ලදී.

1951 •ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ ඩිප්ලෝධාරීන්ට රජයේ ආයුර්වේද රෝහල්වල සේවය කළ හැකි පරිදි ආඥාඩුව මඟින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිළිගැනීම

1982 •අංක 30 දරන පර්ලිමේන්තු පනත මඟින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය යටතට ගැනීම.

1995 •1995 පෙරවාරි 23 දිනැති අංක 859/12 මඟින් 1995.03.01 දින සිට බලාත්මක වන පරිදි විද්‍යාලය "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය" කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීම.

1998 •ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ (BAMS) 1වැනි ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගැනීම (BAMS)

2002 •පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී.

2018 •ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහන (BAMS) ඉන්දියානු වෛද්‍ය මධ්‍යම කවුන්සිලය (CCIM) මඟින් අනුමත කිරීම

2021 •2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනය "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" ලෙස උසස් කිරීම.

2. විශ්වවිද්‍යාලයේ සාරධර්ම

විශ්වවිද්‍යාලයේ සාරධර්ම සංවිධානය විශ්වාස කරනු ලබන්නේ කුමක් ද, සංවිධානය තුළ සිටින තැනැත්තන් එකිනෙකා සමඟ, ගනුදෙනුකරුවන් සමඟ සහ සැපයුම්කරුවන් සමඟ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශව සමඟ කටයුතු කිරීමට අපේක්ෂා කරන්නේ කෙසේ ද යන්න අර්ථදක්වයි.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සාරධර්ම හතර පහත අර්ථ දක්වා ඇත.

1. **අවංකභාවය (Integrity)**

   අපට අවංකභාවය සහ විශ්වාසනීයත්වය හරහා උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගත හැකි බවට අපි විශ්වාස කරන්නෙමු

2. **අභිප්‍රේරණය (Motivation)**


   අපි අභිප්‍රේරණය හරහා විශිෂ්ටත්වය කරා ගමන් කරන්නෙමු

3. **නවෝත්පාදනය (Innovation)**


   අපි නව මංපෙත් විවර කර ගැනීම සඳහා නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය හරහා නව දැනුම උත්පාදනය කරන්නෙමු

4. **ගරු කිරීම (Respect)**

   අපි කණ්ඩායම් වැඩ සහ එකිනෙකා සඳහා ගෞරවය ඇති කරවන සාමූහික පරිසරයක් තුළින් සාරධර්ම අත්කර ගන්නෙමු



3. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



4. පාලක සභාවේ සාමාජිකයින් – 2022

උපකුලපති

i. මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා (වැඩබලන) - 01.10.2021 – 06.06.2022

ii. මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා - 07.06.2022 – මේ දක්වා

පීඨාධිපතිවරු

i. පීඨාධිපති - දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

ආචාර්ය ඩබ්ලිව්.ජේ. වික්‍රමාරච්චි මහත්මිය - 23.12.2021 - මේ දක්වා

ii. පීඨාධිපති - දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

ආචාර්ය එන්.ටී.බී. මධුශංක මහතා - 29.09.2021 - මේ දක්වා

iii. පීඨාධිපති - දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

ආචාර්ය ජී.කේ. ජයතිලක මහත්මිය - 01.10.2021 - මේ දක්වා

iv. පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්. චන්ද්‍රසිරි වැලිවිට මහතා - 01.03.2021 – මේ දක්වා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන්

i. මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන මහතා
ii. වෛද්‍ය එච්. ධර්මවිජය මහතා
iii. සිරිමල් සේනාරත්න මහතා
iv. ආචාර්ය පී.ඩබ්ලිව්.ඩබ්ලිව්. දිසානායක මහතා
v. ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා
vi. සුනිල් ජයලත් මහතා
vii. ගීතා කරදවල මහත්මිය
viii. වෛද්‍ය අනුෂා වික්‍රමාරච්චි මහත්මිය


සනාතන සභා නියෝජිතයන්

i. ආචාර්ය රණුක හේවගේ මහතා
ii. ආචාර්ය ශාලික පතිරත්න මහතා

ලේඛකාධිකාරී (ලේකම්)

බී.ඒ.එන්. ක්‍රිෂාන්ත මහතා

5. විශ්වවිද්‍යාලයේ නිලධාරීහු - 2022

උපකුලපති	මල්වතු පාර්ශවයේ අති පූජ්‍ය සාහිත්‍ය චක්‍රවර්ති, ආචාර්ය නියන්ගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අනුනායක ස්වාමීන්වහන්සේ	
උපකුලපති	මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා	
පීඨාධිපතිවරු		
පීඨාධිපති, දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආචාර්ය ඩබ්ලිව්.ජේ. වික්‍රමාරච්චි මහත්මිය	
පීඨාධිපති, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ආචාර්ය එන්.ටී.බී. මධුශංක මහතා	
පීඨාධිපති, සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	ආචාර්ය ජී.කේ.ජයතිලක මහත්මිය	
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්.සී.වැලිවිට මහතා	
ලේඛකාධිකාරී	බී.ඒ.එන්.ක්‍රිෂාන්ත මහතා	
වැඩබලන පුස්තකාලයාධිපති	ආචාර්ය ජී. ආර්. පද්මසිරි මහතා (2022.09.01 සිට)	
මූල්‍යාධිකාරී	සී.ජී.කොතලාවල මහතා	

6. පීඨ සහ අධ්‍යයන අංශ

දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

- ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය
- ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය
- චිකිත්සා අධ්‍යයන අංශය
- ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
- කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
- භාෂා අධ්‍යයන අංශය
- දේශීය චිකිත්සා අධ්‍යයන අංශය
- රෝග විඥාන අධ්‍යයන අංශය

දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

- දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය
- තාක්ෂණ අධ්‍යයන අංශය

දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

- දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය
- කළමනාකරණ අධ්‍යයන අංශය
- තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය



7. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන්

පීඨය	උපාධි වැඩසටහන
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS)
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය
	ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය
	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

8. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන්

පීඨය	පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
	කායචිකිත්සා පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
	පංචකර්ම පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
	ශල්‍යතන්ත්‍ර පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
	කායචිකිත්සා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

9. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා

පීඨය/ඒකකය/මධ්‍යස්ථානය	පාඨමාලාව
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ ඩිප්ලෝමාව
	ආයුර්වේද ඖෂධ පිළිබඳ ඩිප්ලෝමාව
	යෝග සහ සංයම අභ්‍යාස පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
	ජෝතිශ්‍ය ශාස්ත්‍රය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

10. දේශීය ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2022

පීඨයේ නම	උපාධි වැඩසටහන	මාධ්‍යය	2022 බඳවා ගැනීම	ශිෂ්‍යයින්					
				1 වැනි වසර (2020/ 2021)	2 වැනි වසර (2019/ 2020)	2 වැනි වසර (2018/ 2019)	3 වැනි වසර (2017/ 2018)	4 වැනි වසර (2016/ 2017)	5 වැනි වසර (2015/ 2016)
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	ඉංග්‍රීසි	176	88	115	102	88	103	68
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	65	-	-	-	-	-
	සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	44	-	-	-	-	-
	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	23	-	-	-	-	-
	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	52	-	-	-	-	-
	ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	60	-	-	-	-	-
	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	51	-	-	-	-	-
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	50	63	-	-	-	-	-

11. 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර

පීඨයේ නම	අධ්‍යයන වැඩසටහන	එකඟ වූ බඳවා ගැනීම	ලියාපදිංචි වූ සංඛ්‍යාව
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	176	88
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	50	65
	සෞඛ්‍ය සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	50	44
	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	50	23
	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	50	52
	ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	50	60
	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	50	51
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	50	63

12. උපාධිධාරී නිමැවුම – 2022

පීඨයේ නම	උපාධි වැඩසටහන	උපාධිය ප්‍රදානය කළ ශිෂ්‍යයින් සංඛ්‍යාව
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	81

13. පශ්චාත් උපාධි නිමැවුම – 2022

පීඨයේ නම	උපාධි වැඩසටහන	පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාව
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15
	කායචිකිත්සා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	20
	ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	24

14. මානව සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ විස්තර – 2022

පීඨයේ නම	උපාධි වැඩසටහන	මුළු ශිෂ්‍යයින්	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු පරිපාලන කාර්ය මණ්ඩලය	මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	564	33	01	-	23
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ප්‍රථම උපාධි වැඩසටහන් හයක්	295	24	01	-	06
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජ අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	63	09	01	01	05
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	පශ්චාත් උපාධි වැඩසටහන් හයක්	179	-	01	-	03
	එකතුව	**1101**	**66**	**04**	**01**	**37**

15. ශිෂ්‍ය කටයුතු

15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2022

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2022







15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2022

නේවාසිකාගාරයේ නම	හිමිකාරත්වය	ධාරිතාව		පහසුකම් සැලසූ සංඛ්‍යාව (2022 දෙසැම්බර් 31 වැනි දිනට)	
		පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා
වික්‍රමාරච්චි නේවාසිකාගාරය	විශ්වවිද්‍යාලය	-	134	-	134
සෙනෙවිරත්න නේවාසිකාගාරය	පෞද්ගලික	34	-	34	-
සමගි මාවත නේවාසිකාගාරය	පෞද්ගලික	36	-	36	-
රන්වැලි නේවාසිකාගාරය	පෞද්ගලික	18	-	18	-
පරාක්‍රම නේවාසිකාගාරය	පෞද්ගලික	-	55	-	55
මහවිට නේවාසිකාගාරය	පෞද්ගලික	18	-	14	-
කරුණානායක නේවාසිකාගාරය	පෞද්ගලික	-	45	-	45
ප්‍රනාන්දු නේවාසිකාගාරය	පෞද්ගලික	-	38	-	27
තිස්ස නේවාසිකාගාරය	පෞද්ගලික	40	-	08	-
එකතුව		**146**	**272**	**110**	**261**

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2022

පීඨය	මහපොළ	ශිෂ්‍යාධාර
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	115	222
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	-	43
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	-	157
එකතුව	**115**	**422**

16. මානව සම්පත්

16.1 2022.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර



16.1 2022.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

සේවා කාණ්ඩය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL - 1	36	24	12
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	PL - 2	09	08	01
ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	PL - 3	14	13	01
ද්විතීය මට්ටම				
කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන	U-MN 1	70	43	02
කළමනාකරණ සහකාර - තාක්ෂණික*	U-MN 1	20	16	04
ආශ්‍රිත නිලධාරීන් - 2 වැනි කාණ්ඩය	U-MN 2	02	02	00
ආශ්‍රිත නිලධාරීන් - 1 වැනි කාණ්ඩය	U-MN 3	02	02	00
මාණ්ඩලික සහකාර/අධිපත්ති සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4	00	25	00
තෘතීය මට්ටම				
ශාස්ත්‍රීය සහායක - 2 වැනි කාණ්ඩය	U-AS 1	01	01	00
කණිෂ්ඨ විධායක / කළමනාකරුවන්*	U-EX 1	12	09	04
ශාස්ත්‍රීය සහායක - 1වැනි කාණ්ඩය	U-AS 2	05	05	00
ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U-MO 1	02	00	02
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2			
මැදි පෙළ විධායක*	U-EX 2	06	07	00
මැදි පෙළ විධායක නිලධාරීන්	U-EX 2(a)			
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U-EX 3	02	02	00
කථිකාචාර්ය	U-AC 3	77	72	05
සහාය මහාචාර්යවරු	U-AC 4			
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5			
එකතුව		**258**	**229**	**31**

* තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙක් දැනට තිබෙන සේවක සංඛ්‍යාවේ U-EX 1 සහ U-EX 2 කාණ්ඩවල ඇතුළත් කර සිටින නමුත් ඔවුන්ගේ සැබෑ සේවක සංඛ්‍යාව U-MN1 වේ.

17. පර්යේෂණ සහ සංවර්ධනය

17.1 පර්යේෂණ කවුන්සිලය
17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර
17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර





17.1 පර්යේෂණ කවුන්සිලය

පර්යේෂණ කවුන්සිලය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ වැඩසටහන් පිළිබඳ තීරණ ගන්නා ඉහළම අධිකාරිය වන අතර පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා විශ්වවිද්‍යාල සනාතන සභාවේ පැවරුම් බලය ලබා ඇත:

1. ඵලදායී පර්යේෂණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම මඟින් විශ්වවිද්‍යාලයට ක්‍රමෝපායන පර්යේෂණ දිශානතියක් ලබා දීම.
2. විශ්වවිද්‍යාලයේ සියලුම පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය.
3. පර්යේෂණ ප්‍රතිපත්ති පැවරුම් බලය ඉටු කිරීම සහතික කිරීම පිණිස සම්පත් සංවිධානගත කිරීමේ මූලාරම්භයන් සකස් කිරීම.
4. පර්යේෂණ අධීක්ෂණය සඳහා ක්‍රමවේද සැපයීම.
5. ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයනවලට සම්බන්ධ පීඨ පර්යේෂණ වැඩසටහන් සංවර්ධනය පෝෂණය කිරීම.
6. පර්යේෂණ න්‍යායපත්‍රය සහ පර්යේෂණ වාරසඟරා/ සඟරා ආදිය සකස් කිරීම සහ නිපැයුම.
7. පර්යේෂකයින් විසින් පර්යේෂණ ආචාරධර්මවලට අනුකූල වන බව සහතික කිරීම.

<u>ඉලක්කය</u>

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය පර්යේෂණවල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස 2021 වසරේ ජූලි මාසයේ දී පර්යේෂණ කවුන්සිලය ස්ථාපිත කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය ජීවිතයේ විවිධ අදියරවල දී ඔවුන් දිරිමත් කිරීම සහ පර්යේෂණ සොයා ගැනීම් ජාතික සහ ගෝලීය වශයෙන් බෙදාහැරීම පර්යේෂණ කවුන්සිලයේ ක්‍රියාකාරකම්වල ඉලක්කය වේ.

<u>දැක්ම</u>

දේශීය සම්පත් පදනම සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා විශ්ෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම.

<u>මෙහෙවර</u>

දැනුම වැඩිදියුණු කිරීම සහ දේශීය සම්පත් හරහා මනුෂ්‍ය සංහතියේ සුභසිද්ධිය පිණිස ජාතික සංවර්ධනය සඳහා කැපීපෙනෙන දායකත්වයක් දැක්වීම සඳහා පර්යේෂණ අංශය තුළින් විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

<u>පර්යේෂණ කවුන්සිලයේ සංයුතිය</u>

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ උපකුලපති පර්යේෂණ කවුන්සිලයේ විධායක සභාපති වේ.

පර්යේෂණ කවුන්සිලය පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

a) අධ්‍යක්ෂ - පර්යේෂණ කවුන්සිලය
b) සියලුම පීඨවල පීඨාධිපතිවරු
c) පීඨ පර්යේෂණ සම්බන්ධීකාරකවරු
d) ලේඛකාධිකාරී
e) පුස්තකාලයාධිපති
f) මූල්‍යාධිකාරී
g) විශ්වවිද්‍යාල පාලක සභාව නම් කළ එක් නිලධරයෙක්
h) සනාතන සභාව නම් කළ එක් නිලධරයෙක්
i) උපකුලපති නම් කළ නිලධාරීන් තිදෙනෙක්
j) විශ්වවිද්‍යාල වෙබ්මාස්ටර්

k) ආචාරධර්ම සමාලෝචන කමිටුවේ නියෝජිතයෙක්

පර්යේෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ සහ ලේකම් උපකුලපති විසින් පත් කරනු ලබයි.

වැඩමුළු සහ වෙබිනාර් සම්මන්ත්‍රණ

2022 වර්ෂය තුළ දී පවත්වන ලද වැඩමුළු/ වෙබිනාර් පිළිබඳ විස්තර පහත දැක් වේ.

වැඩමුළු

වැඩමුළුවේ නම	සම්පත්දායක	දිනය/වේලාව/ ස්ථානය	සහභාගීවූවන්
පළ කිරීම්වල දී හොඳ ගුණාත්මක වාරසඟරා හඳුන්ගන්නේ සහ කොල්ලකාර වාරසඟරා මඟහරවා ගන්නේ කෙසේ ද	ආචාර්ය නයනා විජයසුන්දර මිය, වැඩබලන පුස්තකාලයාධිපති - GWUIM	2022 අප්‍රේල් 29 පෙ.ව. 10.00 සිට ප.ව. 12.00 දක්වා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය මධ්‍යස්ථානය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්
SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - I වැනි සැසිය	ආචාර්ය වයි.එච්.පී.එස්.එස්. පතිරත්න තාක්ෂණ අධ්‍යයන අංශයේ ප්‍රධානී, GWUIM	2022 මැයි 27 පෙ.ව. 09.00 - ප.ව. 12.30 ශිෂ්‍ය මධ්‍යස්ථානය, GWUIM	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්
SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - II වැනි සැසිය	ආචාර්ය වයි.එච්.පී.එස්.එස්. පතිරත්න තාක්ෂණ අධ්‍යයන අංශයේ ප්‍රධානී, GWUIM	2022 ජූනි 03 පෙ.ව. 09.00 - ප.ව. 01.00 ශිෂ්‍ය මධ්‍යස්ථානය, GWUIM	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්

වෙබිනාර් සම්මන්ත්‍රණ

වෙබිනාර් සම්මන්ත්‍රණයේ නම	සම්පත්දායක	දිනය/වේලාව/ ස්ථානය	සහභාගීවූවන්
පර්යේෂණ සම්බන්ධ ආචාරධර්ම	මහාචාර්ය වාමලී නාහල්ලගේ, මානවවිද්‍යාව පිළිබඳ මහාචාර්ය මානවවිද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානී, මානවශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	2022 මාර්තු 18 පෙ.ව. 10.00 සිට ප.ව. 12.00 සූම් තාක්ෂණය ඔස්සේ	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්
සෞඛ්‍ය පර්යේෂණය පිළිබඳ රෝගී සහ මහජන සම්බන්ධතාව සහ නියැලීම	සෞඛ්‍ය සහ සමාජ රැකවරණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (IRD) (සම්පත්දායකයින් - මහාචාර්ය අතුල සුමතිපාල සහ ආචාර්ය ආසිරි හේවාමලගේ)	2022 දෙසැම්බර් 16 ප.ව. 02.00 – ප.ව. 04.00 සූම් තාක්ෂණය ඔස්සේ	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්

<u>රිසර්චිගේට් සහ ගූගල් විද්වත් උපුටා ගැනීමේ ගිණුම්</u>

2022.12.31 වැනි දිනට එක් එක් පීඨයේ රිසර්චිගේට් සහ ගූගල් විද්වත් උපුටාගැනීම් ගිණුම් පිළිබඳ සාරාංශ විස්තර පහත දැක්වේ.

පීඨය	2022/12/31 දිනට
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	33 (92%)
රිසර්චිගේට් ගිණුම්	33 (92%)
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	25 (100%)
රිසර්චිගේට් ගිණුම්	25 (100%)
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	09 (100%)
රිසර්චිගේට් ගිණුම්	09 (100%)

17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	විදේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		05	17
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		04	06
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	02	-
		3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව	26	19
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		-	01
5	විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	-	-
		5.2 කර්තෘ මඟින්	01	-

දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	විදේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	01
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	01
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	16	-
		3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව	36	03
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		02	02
5	විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	-	-
		5.2 කර්තෘ මඟින්	-	-

දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	විදේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	-
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		01	-
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	-	-
		3.2 උද්ධෘත ප්‍රකාශන සංඛ්‍යාව	16	-
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		05	-
5	විශේෂඥ ක්ෂේත්‍රය තුළ ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	-	-
		5.2 කර්තෘ මඟින්	-	-

අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්වලට සහභාගීවීම පිළිබඳ විස්තර

පීඨයේ නම	සහභාගීවූ නිලධාරියාගේ නම	සහභාගී වූ නිලධාරියාගේ තනතුර	වැඩසටහනේ නම	ජාතික/ අන්තර්ජාතික	වැඩසටහනේ කාලය	වැඩසටහනේ අධිකාරිය
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය	කථිකාචාර්ය	CSDC	ජාතික	මාස 6	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	ආචාර්ය අසංක පල්ලේවත්ත	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	ආචාර්ය නයනි දරණගම	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	කසුරි බාලසූරිය මිය	කථිකාචාර්ය (ආධුනික)	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	සවින්තනී අලහකෝන් මිය	කථිකාචාර්ය (ආධුනික)	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	නදුනි රණසිංහ මිය	කථිකාචාර්ය (ආධුනික)	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM
	චරිත් දිසානායක මයා	කථිකාචාර්ය (ආධුනික)	SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය - සැසි I, II, III	ජාතික	දින තුනක්	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, GWUIM

<u>පර්යේෂණ පරිසංවිධාන</u>

පරිසංවාදයේ නම	දේශීය දැනුම් පද්ධති පිළිබඳ බහුවිෂය ප්‍රවේශ පිළිබඳ 01වැනි අන්තර්ජාතික පර්යේෂණ පරිසංවාදය
පරිසංවාදයේ තේමාව	මතුවෙමින් පවතින අභියෝග සඳහා දියුණු දේශීය දැනුම් පද්ධති
දිනය	2022.03.01
ස්ථානය	විශ්වවිද්‍යාලයේ කුඩා ශ්‍රවණාගාරය
ප්‍රධාන ආරාධිත	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මිය ශ්‍රී ලංකා රුසියානු සමූහාණ්ඩුවේ තානාපති සමාරම්භක උපකුලපති – GWUIM
ප්‍රධාන දේශක	– ආචාර්ය විමල් විමලදාස ප්‍රධාන ව්‍යාපෘති කළමනාකරණ උපදේශක ස්වභාවික සහ පාරිසරික සම්පත් කළමනාකරණ සහ වැවිලි කෘෂිකර්මය – වෛද්‍ය ශ්‍රීකාන්ත කේ. ජාතික කළමනාකරු - විද්‍යා සේවා ඖෂධ අංශය හිමාල වෙල්නස් සමාගම මලාකි, බැංගලෝරය
පරිසංවාදයේ සභාපති	ආචාර්ය ඩබ්ලිව්.ඒ.එල්. වන්ද්‍රසිරි වැලිවිට පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති
පරිසංවාදයේ සම-සභාපති	ආචාර්ය ශාලික පතිරත්න අංශ ප්‍රධාන - තාක්ෂණික අධ්‍යයන අංශය
පරිසංවාදයේ ලේකම්	ආචාර්ය පී.ජී.ඒ.පී. පල්ලෙවත්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) තාක්ෂණික අධ්‍යයන අංශය

17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ පර්යේෂණ කවුන්සිලය සිය පර්යේෂණ සිදු කර ඇති සහ ජාතික සහ අන්තර්ජාතික සම්මන්ත්‍රණ, සමියුරු-සමාලෝචනය සහ සුවිගත වාරසඟරාවල සිය පර්යේෂණ පළ කර ඇති/ ඉදිරිපත් කර ඇති විද්වතුන් හඳුනා ගැනීම සහ ඔවුන් ඇගයීම පිණිස පර්යේෂණ සම්මාන ක්‍රමයක් ස්ථාපිත කර ඇත.

පර්යේෂණ සම්මාන වර්ග;

1. උපකුලපති සම්මාන
2. සනාතන සහ ගෞරව සම්මාන

<u>උපකුලපති සම්මාන</u>

සම්මාන කාණ්ඩය	සම්මානලාභීන්ගේ නම්	පීඨය
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සිටින වඩාත්ම කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා – 2021 2022.03.01 වැනි දින ප්‍රදානය කරන ලදී.	වෛද්‍ය කේ. ජී. සී. දිසානායක මිය	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

<u>සෙනට් සභා ගෞරව සම්මාන – (2022 වර්ෂය තුළ දී ප්‍රදානය කළ සම්මාන)</u>


නම	පීඨය	සම්මානයේ විස්තරය
වෛද්‍ය කේ.ජී.සී. දිසානායක	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	උසස් ගුණාත්මක පර්යේෂණ පැවැත්වීම සහ 2021 වර්ෂයේ දී අන්තර්ජාතිකව සුවිගත කළ හින්දවි, බයෝමෙඩ් රිසර්ච් ඉන්ටර්නැෂනල් වාරසඟරාවේ පළ කිරීම වෙනුවෙන්. වෙළුම 2021, DOI: 10.1155/2021/7872406, 18 පිටු
වෛද්‍ය ආර්.පී. ලියනගේ	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	
වෛද්‍ය පී.ඒ.ඩී.එච්.ජේ. ගුණතිලක	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	
ඩබ්ලිව්.පී.ආර්.ටී. පෙරේරා මයා	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	
වෛද්‍ය ජී.වී.පී. සමරනායක	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	උසස් ගුණාත්මක පර්යේෂණ පැවැත්වීම සහ 2022 වර්ෂයේ දී අන්තර්ජාතිකව සුවිගත කළ අසර්බයිජාන් මෙඩිකල් වාරසඟරාවේ පළ කිරීම වෙනුවෙන්. වෙළුම 62, නිකුතුව 07, පිටු 3403 - 3412
වෛද්‍ය එස්.එච්.කේ. දීප්තිකා	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	උසස් ගුණාත්මක පර්යේෂණ පැවැත්වීම සහ 2022 වර්ෂයේ දී අන්තර්ජාතිකව සුවිගත කළ ඉන්ටර්නැෂනල් ජර්නල් ඔෆ් ෆාමසූටිකල් සයන්ස් ඇන්ඩ් රිසර්ච් වාරසඟරාවේ පළ කිරීම වෙනුවෙන් වෙළුම 13, නිකුතුව 08, පිටු 2977-2987

18. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

18.1 **පුස්තකාලය**
18.2 ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය
18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
18.5 වෛද්‍ය මධ්‍යස්ථානය
18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය
18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය
18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)
18.9 සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC)
18.10 තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය (CQA)
18.11 ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC)
18.12 මාධ්‍ය සහ මුද්‍රණ අංශය
18.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය







18.1 පුස්තකාලය



පසුබිම් තොරතුරු

විශ්වවිද්‍යාලයේ ආයුර්වේදය, දේශීය වෛද්‍ය ක්‍රමය, වෛද්‍ය විද්‍යා, සෞඛ්‍ය විද්‍යාව සහ වෙනත් ආශ්‍රිත විෂයන් පිළිබඳ ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ යන ප්‍රධාන කුළුණු ත්‍රිත්වය සඳහා අවශ්‍ය සම්පත් සම්පාදනය මෙම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථයන් වේ. පුස්තකාලය මඟින් විශිෂ්ට සහ නවෝත්පාදන පුස්තකාල සේවාවන් සහ නිපැයුම් සම්පාදනය සහ ප්‍රවර්ධනය හරහා මෙම පරමාර්ථ අත්කර ගනු ඇත. මෙයට අමතරව, දුරස්ථ ප්‍රවේශය සහ පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රීයකරණය ඇතිව ඉලෙක්ට්‍රොනික සම්පත් වැඩිවශයෙන් ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ප්‍රතිලාභය සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී පුස්තකාල සේවා සපයනු ඇත. ඉහත සඳහන් කළ පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස, පුස්තකාලය එහි ග්‍රන්ථ එකතුව, පොත් බැහැරදීමේ අංශය, උපලේඛණගත යොමු අංශය, ස්ථීර යොමු අංශය සහ දුර්ලභ ග්‍රන්ථ එකතුව ලෙස සංවිධානගත කර ඇත.

පුස්තකාල එකතුවට සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත, පාලි, හින්දි සහ බෙංගාලි භාෂාවලින් ප්‍රකාශයට පත් කළ 34,000කට අධික ශාස්ත්‍රීය නිබන්ධන අන්තර්ගත වේ. මෙම එකතුවට පැල් කොළ මත ලියන ලද අත්පිටපත් කිහිපයක් ද ඇතුළත් වේ. පුස්තකාලයේ ඇති සියලුම ග්‍රන්ථ සම්මත වර්ගීකරණ ක්‍රමයක් වන ඩේවි දශම වර්ගීකරණ ක්‍රමය (Dewey Decimal Classification System) අනුව වර්ගීකරණය කර සකසා ඇති අතර ඇන්ග්ලෝ-ඇමෙරිකානු නාමාවලි රීති (Anglo-American Cataloguing Rules - AACR-2 R) අනුකූලව වර්ගීකරණය කර ඇත. මෙම එකතුව කොහා ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ ක්‍රමය (Koha integrated library management system) භාවිතා කරමින් පරිගණකගත කරමින ඇත. Koha යනු විවෘත-මූලාශ්‍ර මෘදුකාංග පද්ධතියකි.

ගොඩනැගිල්ල

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මහල් හතරකින් සැදුම්ලත්, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. එය උසස් අධ්‍යාපන අවශ්‍යතාවන් සපුරාලීම පිණිස එම මට්ටමට සංවර්ධනය කරමින් ඇත.

පුස්තකාල දිශානති

a) නවක ශිෂ්‍යයින් සඳහා පුස්තකාල දිශානති වැඩසටහන පවත්වන ලදී.

b) අධ්‍යයන සාමාජිකයින් ඇතුළු පර්යේෂණ ප්‍රජාව සඳහා පර්යේෂණ දෘශ්‍යතාව සහ හොඳ ගුණාත්මක වාරසඟරා සහ කොල්ලකාරී වාරසඟරා හඳුනා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

පර්යේෂණ සහ ප්‍රකාශන

පර්යේෂණ පරිසංවිධාන (ජාතික සහ අන්තර්ජාතික සම්මන්ත්‍රණවල දී සිදු කළ ඉදිරිපත් කිරීම්)

ආචාර්ය ආර්.ඩී.ඒ. තිස්ස - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

1. ජාතික පුස්තකාල සහ විඥාපනවිද්‍යා ආයතනයේ කාර්යසටහන්, 2022 දෙසැම්බර් මස 29 වැනි දින, කොළඹ.
2. ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයක් වන ලේඛනකරණය හා සම්බන්ධ වෘත්තීය නාම පුස්තකාලය සේවයේ ආරම්භයට කර ඇති බලපෑම පිළිබඳ මූලාශ්‍ර අධ්‍යයනයක්. ප්‍රතිරාවල කොළඹ : ශ්‍රී ලංකා පුස්තකාල සංගමයල 2 වෙළුම පි. 1-15
3. ශ්‍රී ලංකාවේ ආයුර්වේද සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් (18 සහ 19 සියවස්වල ප්‍රකාශිත කෘති) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය 60 වන සංවත්සර සමරු කලාපයල කොළඹ: ජාතික පුස්තකාලයල පි. 115-124

එච්. ඩබ්ලිව්. කුසලා සජීවනී - සහකාර පුස්තකාලයාධිපති

1. 7වැනි අන්තර්ජාතික බෞද්ධ සම්මන්ත්‍රණය - 2022 (BUSL - IBC 2022) "බෞද්ධ අධ්‍යාපනය: අතීතය වර්තමානය සහ අනාගතය", 2022 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පවත්වන ලද සම්මන්ත්‍රණයේ දී Presented a Research paper on "බෞද්ධ අධ්‍යාපනය නංවාලීමේ දී පිරිවෙන් පුස්තකාලවල වගකීම් පිළිබඳ විශ්ලේෂණයක්" පිළිබඳ පර්යේෂණ ලිපිය ඉදිරිපත් කරන ලදී.
2. ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (NACLIS) 2022, 2022 සැප්තැම්බර් මස 21 වැනි දින, "ශ්‍රී ලංකා පුස්තකාල සමාලෝචනයේ ප්‍රකාශයට පත් කළ ලිපි පිළිබඳ විශ්ලේෂණයක් (2019-2021)" පිළිබඳ පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කරන ලදී, 21st September 2022 ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA) මඟින් සංවිධානය කරන ලදී.
3. 5වැනි ජාතික පුස්තකාල පර්යේෂණ පරිසංවාදය (NatlibsSYMPO 2022), "ප්‍රලේඛ" සඟරාවේ ප්‍රකාශයට පත් කළ ලිපි පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනය" පිළිබඳ පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කරන ලදී, ජාතික පුස්තකාල සහ ලේඛනකරණ සේවා මණ්ඩලය සංවිධානය කරන ලදී, 2022 සැප්තැම්බර් මස 08 වැනි දින
4. පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ මාර්ගගත අන්තර්ජාතික සම්මන්ත්‍රණය (Viclis) 2022, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ භාවිතා කරනු ලබන පුස්කොළ අත්පිටපත් පිළිබඳ ක්‍රමානුකූල විශ්ලේෂණයක්: මූලික අධ්‍යයනයක්" පිළිබඳ පර්යේෂණ ලිපියක් ඉදිරිපත් කිරීම, SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කළ, 2022 ඔක්තෝබර් මස 25 වැනි දින.
5. ශතක කාව්‍ය සාහිත්‍ය. "විමලප්‍රභා" පූජ්‍ය පොල්හේනේ විමල නාහිමි අභිනන්දනය ශාස්ත්‍රීය සංග්‍රහය, 2022. කහතුඩුව:සවිදු ප්‍රකාශන, පි. 256-273

සහභාගී වූ වැඩමුළු

a) 12වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICULA 2022) "පරිවර්තනීය පුස්තකාල හරහා පුද්ගලයින් සම්බන්ධ කරමින්" ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාල සංගමය මඟින් පවත්වන ලදී. 2022 ඔක්තෝබර් මස 27වැනි දින.
සහභාගීවූවන්
එච්. ඩබ්ලිව්. කේ. එස්. පුෂ්පකාන්ති මිය (සහකාර පුස්තකාලයාධිපති)

b) "කොහා පුස්තකාල කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම" 2022.09.09 වැනි දින, පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයේ දී පවත්වන ලදී.
සහභාගීවූවන්
ආචාර්ය ජී.ආර්. පද්මසිරි (වැඩබලන පුස්තකාලයාධිපති)
ආචාර්ය ආර්.ඩී.ඒ. තිස්ස (ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති)
එච්. ඩබ්ලිව්.කේ.එස්. පුෂ්පකාන්ති මිය (සහකාර පුස්තකාලයාධිපති)
ඩබ්ලිව්. එම්.එම්.එස්.ජී.එස්. මහකුඹුර මිය (පුස්තකාල තොරතුරු සහායක)
ඩබ්ලිව්.එම්.ඩී.කේ. විජේකෝන් මිය (පුස්තකාල තොරතුරු සහායක)
සංජීවා පෙරේරා මිය (පුස්තකාල තොරතුරු සහායක)

c) "කාර්යාල කටයුතු සඳහා නිවැරදි සිංහල" 2022.11.02, 2022.11.09, 2022.11.14, 2022.11.21, සහ 2022.11.28 වැනි දින, පුස්තකාල තොරතුරු සහායකවරු සහ තාක්ෂණික නිලධාරීන්
සහභාගීවූවන්
ඩබ්ලිව්.එම්.එම්.එස්.ජී.එස්. මහකුඹුර මිය (පුස්තකාල තොරතුරු සහායක)
ඩබ්ලිව්.එම්.ඩී.කේ. විජේකෝන් මිය (පුස්තකාල තොරතුරු සහායක)
සංජීවා පෙරේරා මිය (පුස්තකාල තොරතුරු සහායක)
එම්.එම්.ජේ. සිල්වා මයා (තාක්ෂණික නිලධාරී)

d) පරිගණක පුහුණු වැඩසටහන 2022.12.08, 2022.12.015, 2022.12.22 සහ 2022.12.29 දින
පුස්තකාල තොරතුරු සහායක නිලධාරීන් සඳහා.
සහභාගීවූවන් ඩබ්ලිව්. එම්.ඩී.කේ. විජේකෝන් මිය (පුස්තකාල තොරතුරු සහායක)
සංජීවා පෙරේරා මිය (පුස්තකාල තොරතුරු සහායක)

පැවැත් වූ වැඩමුළු/පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ

a) " කොහා පුස්තකාල කළමනාකරණ පද්ධතිය භාවිතා කිරීම" 2022.09.09 වැනි දින, පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයේ දී.

ලියාපදිංචි පරිශීලකයින්

පරිශීලකයින්		2021.12.31 තෙක්	2022 දී
ශිෂ්‍යයින්		517	332
අධ්‍යයන කාර්ය මණ්ඩලය	ස්ථිර	53	04
	තාවකාලික	79	06
විධායක කාර්ය මණ්ඩලය		04	01
අනධ්‍යයන කාර්ය මණ්ඩලය		89	10

ග්‍රන්ථ සහ වාරසඟරා වැය ශීර්ෂය

ග්‍රන්ථ සහ වාරසඟරා - රු. මිලියන 2.100

වියදම

පොත්	රු. 655,890.30
විද්‍යුත් පොත්	ඇ.ඩො. 532.50
වාරසඟරා	-
මුළු වියදම	රු. 862,225.33

ග්‍රන්ථ තොගය

2022.12.31 වැනි දිනට තොග වශයෙන් ඇති ග්‍රන්ථ සංඛ්‍යාව - 34,939.

18.2 ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය



හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන ඒකකය ශිෂ්‍යයින් සඳහා සෞඛ්‍යසම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් දිරිමත් කරන, තුලනාත්මක ක්‍රීඩා ජීවිතයක් පිරිනැමීමට වගකීම දරයි.

දැක්ම

ශක්තිමත් ක්‍රීඩා සහභාගීත්ව සංස්කෘතියක් සහ උද්යෝගීමත් ක්‍රීඩා ජීවිතයක් ගොඩනැගීම.

මෙහෙවර

දක්ෂ ශිෂ්‍ය මළල ක්‍රීඩකයින්ගේ ශාස්ත්‍රීය සහ ක්‍රීඩා කාර්යසාධනය යන අංශ දෙකේම විශිෂ්ටත්වය පෝෂණය කිරීම සහ සියලුම ශිෂ්‍යයින් අතර ක්‍රියාකාරී ජීවන රටාවක් සහතික කිරීම.

කාර්ය මණ්ඩල තනතුරු

- සම්බන්ධීකරණ නිලධාරී
- උපදේශක
- ව්‍යායාම මධ්‍යස්ථාන සහායක

වාර්ෂික වැඩසටහන්

- බැට්ල් ඔෆ් ආයුර්වේදියන්ස් ශූරතාවය (2022 සැප්තැම්බර් 17). ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ IIM (කොළඹ විශ්වවිද්‍යාල) අතර සබඳතා වැඩිදියුණු කිරීම වෙනුවෙන් සංවිධානය කරන ලද මිතුරු ක්‍රීඩා ඉසව්වකි.
- අන්තර්ජාතික විශ්වවිද්‍යාල ක්‍රීඩා දිනය (2022 සැප්තැම්බර් 20). කොළඹ විශ්වවිද්‍යාලය මඟින් SLUSA සහ සියලුම විශ්වවිද්‍යාල ශිෂ්‍ය සහභාගීත්වය ඇති ව සංවිධානය කරන ලදී.
- අන්තර්විශ්වවිද්‍යාල ශූරතාවලිය (2022 නොවැම්බර් 06 සිට 2023 ජනවාරි 08 දක්වා)

වෙනත් ශූරතාවලි

- අන්තර් කණ්ඩායම් මෘදුපන්දු තරඟාවලිය – “දුස්රාව” (2022 අප්‍රේල් 09)
- අන්තර් කණ්ඩායම් අත්පන්දු තරඟාවලිය (2022 අගෝස්තු 24)

විශේෂ වැඩසටහන්

2022 අන්තර්-විශ්වවිද්‍යාල කැරම් ශූරතාව සංවිධානය කරන ලදී

දිශානුගත වැඩසටහන

2020/2021 BAMS උපාධි දිශානුගත වැඩසටහන අතරතුර 2022 ජුනි මස 04 වැනි දින අතථ්‍ය සැසියක් පවත්වන ලදී.



18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

හැඳින්වීම

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය වෘත්තීය සංවර්ධනය ජීවිත කාලය පුරාවට දිවෙන ක්‍රියාවලියක් බවට විශ්වාස කරයි. එබැවින්, අදාළ ක්ෂේත්‍රවල සංවර්ධනය සඳහා ධනාත්මකව දායකවීමට සවිබල ලත් හැකියාවෙන් යුත්, සේවානියුක්ත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම පිණිස ඒකකය අනුග්‍රහය දක්වයි.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ සේවානියුක්තිභාවය වැඩිදියුණු කරන අතරතුර ඔවුන්ගේ වෘත්තීය සහ මෘදු කුලසතාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රථම උපාධි අපේක්ෂකයින් සහ කර්මාන්ත අංශය අතර සබැඳිය ශක්තිමත් කිරීමේ පරමාර්ථ ඇතිව ස්ථාපිත කර ඇත. සිය වෘත්තීය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් ධනාත්මකව දායකවිය හැකි සවිබල ගැන්වූ දක්ෂ නිපුණතාවලින් යුත් රැකියාගත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම පිණිස ඒකකය විශ්වවිද්‍යාලයට සහාය වෙයි.

ඒකකය මඟින් විද්‍යාර්ථයින් සඳහා වෙබිනාර් සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මන්ත්‍රණ, සායක සහ ව්‍යවසායකත්ව වැඩසටහන් ආදිය සංවිධානය කරනු ලබයි. සියලුම පීඨවල ශිෂ්‍යයින් සඳහා පිරිනමනු ලබන 'ජීවිතය සහ වෘත්තීය නිපුණතා සංවර්ධන' පාඨමාලාව ඒකකය මඟින් පිරිනමනු ලබන ප්‍රධාන වැඩසටහනකි. මෙම පාඨමාලාව

විද්‍යාර්ථයින්ගේ ජීවිත කාලය පුරාවට ඉගෙනුම් අභිමතාර්ථ සංවර්ධනය කිරීම පිණිස අදාළ ක්ෂේත්‍ර සහ කර්මාන්ත අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ඔවුන්ගේ කුසලතා සහ හැකියාවන් සංවර්ධනය කිරීමට සකස් කරන ලද පාඨමාලාවකි.

මෙයට අමතරව, සංචාරක කර්මාන්තය, ඖෂධ කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ජෛව වෛද්‍ය කර්මාන්තය, යෝග මධ්‍යස්ථාන සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන, සෞඛ්‍ය සේවා කර්මාන්තය සහ වෙනත් කර්මාන්තවල වෘත්තීය අවස්ථාවන් සඳහා උනන්දුවක් දක්වන විද්‍යාර්ථයින්ට එම අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම මඟින් එම රැකියාගත කිරීම් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාදීමෙන් ද ඒකකය ඔවුන් සඳහා ප්‍රතිලාභ සපයනු ලබයි. තව ද, මෙම ඒකකය ශිෂ්‍යයින් සඳහා රැකියා සහ ආධුනිකත්ව අවස්ථාවන් ලබාදීම පිණිස සේවායෝජකයින් සමග සමීප සම්බන්ධතා පවත්වා ගෙන යාම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කර ඇත.

දැක්ම

උපාධි අපේක්ෂකයින්ගේ වෘත්තීය ඉලක්ක අත්කර ගැනීමට සහ විශ්වාසනීයව සහ අරමුණු ඇතිව සමාජයට දායකවීම පිණිස ඔවුන් සවිබලගන්වමින් ඔවුන් වෙනුවෙන් ප්‍රමුඛතම වෘත්තීය මාර්ගෝපදේශය සහ සංවර්ධන සේවා සම්පාදකයා බවට පත්වීම.

මෙහෙවර

උපාධි අපේක්ෂකයින් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර, ඔවුන්ගේ නිපුණතා සහ වටිනාකම්වලට ගැලපෙන ලෙස සකස් කළ විස්තීරණ මාර්ගෝපදේශය, සම්පත්, සහ අවස්ථාවන් ලබා දෙමින් ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීම සහ ඔවුන්ට මඟපෙන්වීම.

පරමාර්ථ

i. උපාධි අපේක්ෂකයින්ගේ පෞද්ගලික අවශ්‍යතාවන් සපුරාලනු පිණිස පෞද්ගලිකව සකස් කළ වෘත්තීය මාර්ගෝපදේශ සහ සංවර්ධන සේවා සැපයීම.


ii. උපාධි අපේක්ෂකයින් සඳහා ආධුනිකත්වය, රැකියා සහ ජාලගත කිරීමේ අවස්ථාවන් නිර්මාණය කිරීමට සේවායෝජකයින් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම සහ පවත්වා ගැනීම.

iii. උපාධි අපේක්ෂකයින්ගේ වෘත්තීය සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ කුසලතා ගොඩනැගීමට අනුග්‍රහය දක්වන නවීන වැඩසටහන් සහ වැඩමුළු නිර්මාණය කිරීම සහ පැවැත්වීම.

iv. උපාධි අපේක්ෂකයින් සඳහා නිවැරදි සහ අදාළ වෘත්තීය තොරතුරු සැපයීම පිණිස කර්මාන්ත නැඹුරුතා සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීම.

v. සියලුම පසුබිම්වලින් පැමිණෙන උපාධි අපේක්ෂකයින්ගේ සාර්ථකත්වයට අනුග්‍රහය දැක්වීම පිණිස වැඩසටහන්වල සියලුම අංශවලින් විවිධත්වය, සමානාත්මතාව සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

අපගේ ආයතනික ව්‍යුහය



කාර්ය මණ්ඩල තනතුරු

කාර්ය මණ්ඩල තනතුර	නම	
අධ්‍යක්ෂ	වෛද්‍ය අසංක පල්ලෙවත්ත	
ලේකම්	ජනනී හේවගේ මිය	
සම්බන්ධීකාරකගේ නම	**උපාධි පාඨමාලාව**	**පීඨය**
වෛද්‍ය රේණුකා පෙරේරා	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS)	FIM
දිනිඳු දේවපුර මයා	දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන (BSSI)	FISSMS
කෞෂල්‍යා වික්‍රමසිංහ මිය	තොරතුරු තාක්ෂණය	
ජනනී හේවගේ මිය	සෞඛ්‍ය සේවා කළමනාකරණය (BHSM)	
කසුරි බාලසූරිය මිය	ජෛවවෛද්‍ය තාක්ෂණය (BBMT)	
	සෞඛ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය (HICT)	
නිවන්ත කනුවන	දේශීය වෛද්‍ය සම්පත් (BIMR)	
	දේශීය ඖෂධ තාක්ෂණය (BIPT)	
විෂ්මි ජයසිංහ මිය	යෝග සහ පරාමනෝවිද්‍යාව (BSYP)	
	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය (HTHM)	

CGU මඟින් පවත්වන ලද පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් – 2022

ඉලක්ක කණ්ඩායම්: FIHST සහ FISSMS සියලුම ශිෂ්‍යයින්

අංකය	දිනය	සම්පත්දායකයා	මාතෘකාව
I	09/03/2022	ආචාර්ය අසංක පල්ලෙවත්ත	වෘත්තීය මාර්ගෝපදේශය හැඳින්වීම
II	23/03/2022	එක් එක් අධ්‍යයන අංශය පවත්වන ලද වැඩමුළුව	
III	06/04/2022	ආචාර්ය ශාලික පතිරත්න	විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ඩිජිටල් වේදිකාවල ආචාරධර්ම
IV	20/04/2022	ආචාර්ය ශාලික පතිරත්න	විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ඩිජිටල් වේදිකාවල ආචාරධර්ම
V	27/04/2022	ආචාර්ය මියුරු චන්ද්‍රදාස	විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා පෞරුෂය සහ වටිනාකම්
VI	04/05/2022	දිනාලි ආරියසිංහ මිය	විද්‍යුත් තැපෑල් ලිවීමේ ආචාරධර්ම
VII	18/05/2022	ආචාර්ය ලාල් මුතුවත්ත	ඔබේ වෘත්තීය අනාගතය සඳහා විද්වතෙක් ලෙස ආකල්ප

VIII	25/05/2022	දිනාලි ආරියසිංහ මිය	වෘත්තීය කුසලතා - මෙමෝ ලිවීම
IX	01/06/2022	රුවන් බුද්ධික මයා	පෞරුෂය සංවර්ධනය
X	08/06/2022	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යසාන්ජලී දේවිකා ජයතිලක මිය	විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සඳහා ස්වයං-දිරිමත් කිරීම
XI	22/06/2022	ආචාර්ය මධුභාෂිණී රත්නායක	අමුතු භාෂාවක් හුරු කිරීම
XII	06/07/2022	ඉංජිනේරු මනෝහරන් කේසවන් මයා	ඔබේ උපාධි ශිෂ්‍ය ජීවිතය තුළ දැනසිටිය/ කළ යුතු දේ කුමක් ද
XIII	20/07/2022	ආචාර්ය අසංක පල්ලෙවත්ත	විභාග සහ පෞද්ගලික සංවර්ධනය
XIV	02/09/2022	ඉංජිනේරු මනෝහරන් කේසවන් මයා	ස්වයං-ප්‍රතිපත්ති සහ සදාචාරසම්පන්න චර්යා වැඩිදියුණු කිරීම
XV	16/09/2022	තිලිණි ඩෙව්ඩි මිය	රෝපණය කළ යුතු ඉතාම වැදගත් මෘදු කුසලතා හය
XVI	23/09/2022	ආචාර්ය කාමලිකා ජයතිලක මිය	ඔබේ වෘත්තීය අනාගතයට සූදානම්වන්නේ කෙසේ ද
XVII	30/09/2022	සිසිත රාජපක්ෂ මයා	විශ්වවිද්‍යාල උපාධිධාරියෙක්ගෙන් කර්මාන්තය අපේක්ෂා කරන දේ
XVIII	07/10/2022	මියුරි ප්‍රදීපිකා මිය	ඔබේ ජීවිතය හැඩගසා ගන්නේ කෙසේ ද
XIX	14/10/2022	ආචාර්ය ලාලිතා ලියනගේ මිය	වෘත්තීය සංවර්ධන සැලසුම
XX	04/11/2022	ආචාර්ය අසංක පල්ලෙවත්ත මහතා	වීඩියෝ නිර්මාණය කිරීම් සහ ඉදිරිපත් කිරීමේ කුසලතා
XXI	11/11/2022	මහාචාර්ය රේණුකා අත්තනායක	විශ්වවිද්‍යාල ශිෂයෙක් වීම පුදුමාකාර වන්නේ ඇයි
XXII	18/11/2022	නිවන්ත කනුවන මයා	අද දවසට අවශ්‍ය කරන ශිෂ්‍ය නායකත්වය
XXIII	03/12/2022	නිවන්ත කනුවන මයා	අද දවසේ අවශ්‍ය කරන නායකත්ව ගුණාංග
XIV	09/12/2022	ආචාර්ය ප්‍රදීප් සමරසේකර	ඔබේ අනාගත සේවාස්ථානය සඳහා ආචාරධර්ම
XV	16/12/2022	ආචාර්ය නිලූෂ නුගාර මයා	ඔබේ වෘත්තීය සංවර්ධනය ආරම්භ කරන්නේ කෙසේ ද

වර්ෂයේ වැඩසටහන් සාරාංශය

පීඨයේ නම	**පවත්වන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව**
FIHST	25
FISSMS	
FIM	0
එකතුව	**25**

2022 වර්ෂයේ පවත්වන ලද අපගේ වැඩසටහන්වලින් ශිෂ්‍යයින්ට හිමි වූ ප්‍රතිලාභ සහ අවස්ථාවන්

වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වලට සහභාගීවීමෙන් උපාධි අපේක්ෂකයින්ට ප්‍රතිලාභ සහ අවස්ථාවන් රැසක් හිමි වේ.

i. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් පිරිනමන ලද ජීවිතය සහ වෘත්තීය නිපුණතා සංවර්ධන පාඨමාලාවට උපාධි අපේක්ෂකයින්ට ඔවුන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර, සාරධර්ම සහ කුසලතා වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට උපකාර වන පිණිස සකස් කළ ඇගයීම් සහ අභ්‍යාස ඇතුළත් විය.

ii. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් ලබා දුන් වෙබිනාර් සම්මන්ත්‍රණ සැසි ශිෂ්‍යයින්ට විවිධ වෘත්තීය මංපෙත් පිළිබඳව තොරතුරු සහ සම්පත් වෙත ප්‍රවේශය ලබාදුනි. මෙය වෘත්තීය ගවේෂණයේ දී උපකාර වන අතර ශිෂ්‍යයින්ට මෙයට පෙර සලකා නොමැති වෘත්තීය අවස්ථාවන් පිළිබඳව ගවේෂණයට කිරීමට හෝ ඔවුන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර පිළිබඳව දැන ගැනීමට අවස්ථාව උදා වේ.

iii. වෙබිනාර් සැසි ශිෂ්‍යයින්ට ඔවුන් තෝරා ගෙන ඇති වෘත්තීය මාර්ගවලට අදාළ කුසලතා සංවර්ධනය කිරීමට උපකාර වේ. ඉදිරිපත් කිරීමේ කුසලතා, අයැදුම්පත්‍ර ලිවීම, සම්මුඛසාකච්ඡා කුසලතා, ප්‍රසිද්ධ දේශන පැවැත්වීම සහ නායකත්වය මෙම කුසලතාවලට ඇතුළත් වේ.

iv. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වලට සහභාගී වීම ශිෂ්‍යයින්ට විශ්වාසය ඇතිකරවීමටත්, ඔවුන්ගේ වෘත්තීය ඉලක්ක පිළිබඳව අභිප්‍රේරණයක් ඇති කර ගැනීමටත් උපකාර වේ.

v. සමස්තයක් ලෙස, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් පිරිනැමූ වැඩසටහන්වලට සහභාගීවීම උපාධි අපේක්ෂකයින්ට ඔවුන්ගේ සේවානියුක්තිභාවය ඉහළ නැංවීමට අවශ්‍ය කරන මෙවලම් සහ සම්පත් ලබාදෙමින් ඔවුන් වෙනුවෙන් සිදු කරන වටිනා ආයෝජනයකි.

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ

18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) සියලුම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය පිණිස විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති සේවා මධ්‍යස්ථානය වන අතර ආයතනික සංවර්ධන ව්‍යාපෘති සහ මූලාරම්භයන් ගණනාවක් සඳහා වගකීම දරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් උපාය මාර්ගය සකස් කිරීම, සෑම සේවකයෙකුගේම ගමන් මඟේ වැදගත් සන්දිස්ථානවල දී ඉහළ කාර්යාක්ෂමතාවක් සහ ශක්තිමත් සහයෝගීතා නිර්මාණය කිරීම සහ තනි පුද්ගලයින්ට සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට ඉහළ කාර්යාක්ෂමතා මට්ටම් අත්කර ගත හැකි තත්ත්වයන් නිර්මාණය කිරීම පිණිස මානව සම්පත් සමඟ උපාය මාර්ගික සහකරු ලෙස කටයුතු කරයි.

ඉගෙනුම සහ ශික්ෂණය ඉහළ ගෞරවයෙන් සලකනු ලබන අතරම සහභාගීත්ව සහ ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයට අනුග්‍රහය දක්වන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ නව සංස්කෘතියට දායකවීම. ඉගෙනුම වැඩිදියුණු කිරීම පිණිස තාක්ෂණයේ විචාරාත්මක සහ ඵලදායී යොදා ගැනීම භාවිතා කරමින් විෂය සීමාවන් ඇතුළත සහ ඉන් පිටතට ගවේෂණය සහ පරාවර්තනය දිරිමත් කිරීම.

දැක්ම

ශාස්ත්‍රීය වෘත්තිය සහ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කරන පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධන අවස්ථාවන්ට පහසුකම් සලසමින් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම.

පරමාර්ථ

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සංවිධාන වෙනස්කම් ධනාත්මකව සැලසුම් කිරීම සහ ඉදිරිපත් කිරීම පිණිසත් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ කුසලතා, දැනුම සහ විශ්වාසය සංවර්ධනය කිරීමටත් දායකවීම ඉලක්ක කරයි. මෙම මධ්‍යස්ථානය පීඨ, අධ්‍යයන අංශ සහ ස්වාධීන ඒකකවලට අනුග්‍රහය දැක්වීම පිණිස නිපුණතා මැදිහත්වීම් ලබා දෙමින් එම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සහ මෙහෙයුම් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස උපකාර වෙයි. එමෙන්ම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වැඩ කිරීමේ සහ සිතීමේ නව ක්‍රමවේද සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය නිරත කරවීමේ විශ්වවිද්‍යාලය හරහා ක්‍රියාත්මක කරනු ලබන මූලාරම්භයන්ට ද සහායෝගය සපයයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය:

- විශ්වවිද්‍යාලයේ සියලුම කාර්යයන් සම්බන්ධයෙන් පර්යේෂණ-තොරතුරුලත් ප්‍රවේශයක් යොදා ගැනීම මඟින් සහ ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය පුරාවට පර්යේෂණ පාදක ව්‍යවහාර දිරිමත් කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන් ඉහළ නංවයි.
- සහභාගීත්ව සහ ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා ආධාර දෙන අතර ඉගෙනුම සහ ශික්ෂණය සඳහා ඉහළ ස්ථානයක් හිමිකරවන විශ්වවිද්‍යාලය තුළ නව සංස්කෘතියක් සඳහා දායකවීම.
- සියලුම අංශවල පර්යේෂණ පිළිබඳ දැනුම්වත් ප්‍රවේශයක් යොදා ගැනීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සහ ශිෂ්‍ය ඉගෙනුම් වැඩිදියුණු කිරීම පිණිස පර්යේෂණ පාදක ව්‍යවහාර විශ්වවිද්‍යාලය තුළ දිරිමත් කිරීම සිදු කරයි. සහභාගීත්වය සහ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් වෙනුවෙන් කැපවෙන අතරතුර ඉගෙනීම සහ ශික්ෂණය ඉහළ ගුණාත්මක ප්‍රමිතියකින් සැලකීමට භාජනය කරනු ලබන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය තුළ නව සංස්කෘතියකට දායකවීම.
- ඉගෙනුම වැඩිදියුණු කිරීම පිණිස තාක්ෂණයේ විචාරාත්මක සහ ඵලදායී යොදා ගැනීම භාවිතා කරමින් විෂය සීමාවන් ඇතුළත සහ ඉන් පිටතට ගවේෂණය සහ පරාවර්තනය දිරිමත් කරයි.
- විවිධ වැඩ මාලා සහ මූලාරම්භයන්ට මහපාදන හෝ දායක වන විශ්වවිද්‍යාල මානව සම්පත් උපාය මාර්ග ක්‍රියාත්මක කරවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- විශ්වවිද්‍යාලය තුළ සහ පිටත සියලුම වෘත්තිකයින් සඳහා, විවිධ ප්‍රවේශ සහ මැදිහත්වීම් භාවිතා කරමින්, විස්තීරණ සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් වෘත්තීය පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ලබාදෙයි.
- ආයතනික නිර්මාණ සැලසුම්, වෙනස්කම් පිළිබඳ ක්‍රමවේද සහ යෝග්‍ය මැදිහත්වීම් හරහා ආයතනයේ උපාය මාර්ගික සහ මෙහෙයුම් මට්ටම්වල වෙනස්කම් සඳහා අනුග්‍රහය දක්වයි.
- නායකත්වය, කුසලතා කළමනාකරණය, යහපැවැත්ම, නියැලීම සහ කාර්යසාධනය වැනි විවිධ තේමාවන් හරහා ආයතනික සංවර්ධනය සඳහා උපායමාර්ග ගොඩනගයි, ක්‍රියාත්මක කරයි.

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ

සම්බන්ධීකාරක

කළමනාකරණ සහකාර

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2022 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	කා සඳහා ද
කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	කථිකාචාර්යවරු
SPSS අත්‍යවශ්‍ය පුහුණු පාඨමාලාව	කථිකාචාර්යවරු / පරිපාලන කාර්ය මණ්ඩලය
මයික්‍රොසොෆ්ට් වර්ඩ් ප්‍රායෝගික පුහුණු වැඩසටහන	කළමනාකරණ සහකාර
විවිධත්වය සමඟ ජීවත්වීමට ඉගෙන ගැනීම	කථිකාචාර්යවරු

18.5 වෛද්‍ය මධ්‍යස්ථානය

හැඳින්වීම

වෛද්‍ය මධ්‍යස්ථානය ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පිහිටුවා ඇති අතර 2022 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කර්තව්‍යයක් ඉටු කරනු ලදී. ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සුළු රෝග තත්ත්වයන්වල දී ප්‍රතිකාර සැලසීම හැරුණු කොට කොවිඩ් වසංගත තත්ත්වය තුළ දී සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට සහ කාර්ය මණ්ඩලයට සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම සම්බන්ධයෙන් වෛද්‍ය මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන පහසුකම්

විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ සහ කාර්ය මණ්ඩලයේ සියලුම සෞඛ්‍ය අවශ්‍යතාවන් සලසා දීම සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා ක්‍රියාත්මක වෙයි. වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් බාහිර ප්‍රතිකාර අංශයේ වෛද්‍ය උපදේශනය, ප්‍රතිකාර සහ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා හදිසි අවස්ථා ප්‍රතිකාර ලබා දෙයි.

තව ද, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් සිය අධ්‍යයන කටයුතුවල දී නිවාඩු ලබා ගැනීම හෝ නොපැමිණීම සම්බන්ධයෙන් යොමු කරන වෛද්‍ය සහතිකවල නිවැරදිභාවය ද වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් සනාථ කරනු ලබයි.

කාර්ය මණ්ඩල තනතුරු

1. ප්‍රධාන වෛද්‍ය නිලධාරී
2. හෙද නිලධාරී

18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය





හැඳින්වීම

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පහසුකම් සහ සේවා ලබා දෙන පොදු මධ්‍යස්ථානය වේ. මෙම මධ්‍යස්ථානයට ප්‍රධාන

විද්‍යාගාරය ඇතුළත් වන අතර පරිගණක පද්ධති 100ක්, සේවාදායකය සහ වෙනත් උපාංගවලින් සැදුම්ලත් වේ. මෙම පහසුකම් විශ්වවිද්‍යාලයේ ඕනෑම ශිෂ්‍යයෙක් විසින් භාවිතා කළ හැකිය.

විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නේට්වර්ක් (LEARN) හරහා කුලී පදනම මත ලබා ගත් අන්තර්ජාල සබඳතාවක් ලබා දෙයි. එමෙන්ම විශ්වවිද්‍යාලයට බණ්ඩාරගම පිහිටි දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා ද අතුරු සබැඳියක් ඇත. මෙම පහසුකම් විශ්වවිද්‍යාලයේ ජාල පද්ධතිය හරහා ද ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය කාර්ය මණ්ඩලයට මෙන්ම ශිෂ්‍යයින්ට ද විශ්වවිද්‍යාල සබැඳිය හරහා ජාල ආවරණය ලබා ගැනීම සඳහා හැකියාව ඇති කරමින් විශ්වවිද්‍යාලය රැහැන් සහිත සහ රැහැන් රහිත සබඳතා දෙකම ආවරණය කරයි.

සපයන සේවාවන්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලය ඇතුළත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ගැටළු විසඳීමට උනන්දුවක් දක්වන, ගතික, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයකි. මෙම මධ්‍යස්ථානය මඟින් පහත දැක්වෙන සේවාවන් සපයනු ලබයි.

a) අවශ්‍ය කරන පරිගණක සඳහා අන්තර්ජාල සබඳතා සැපයීම.
b) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාල විද්‍යුත් තැපෑල ලබාදීම
c) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා ඔෆිස් 365 බලපත්‍රය ලබාදීම
d) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සේවාදායක පරිගණකවල භාරකාරත්වය සහ අධිකාරිය ඇතිව සිටීම
e) විශ්වවිද්‍යාලයේ සේවාදායක පරිගණක නඩත්තු කිරීම සහ උත්ශ්‍රේණිගත කිරීම එනම් වෙබ්සේවාදායකය, AD සේවාදායකය, DNS, ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) සේවාදායක ආදිය.
f) විශ්වවිද්‍යාල වෙබ්අඩවිය නඩත්තු කිරීම.
g) රැහැන් සහිත සහ රැහැන් රහිත විශ්වවිද්‍යාල ජාලය නඩත්තු කිරීම සහ දෝෂ නිවැරදි කිරීම.
h) පරිගණක සහ වෙනත් අදාළ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකරණ අළුත්වැඩියා කිරීම
i) විශ්වවිද්‍යාලය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ-ආශ්‍රිත උපකරණ මිල දී ගැනීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.
j) කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයින්ට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික සහාය සැපයීම
k) විශ්වවිද්‍යාලයේ CCTV ආරක්ෂක කැමරා පද්ධතිය නඩත්තු කිරීම
l) 150 දෙනෙක් සඳහා ආසන පහසුකම් ඇති ශ්‍රවණාගාරයක් නඩත්තු කිරීම.

කාර්ය මණ්ඩල තනතුරු

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

- අධ්‍යක්ෂ

- සහකාර ජාල කළමනාකරු
- උපදේශකයින් දෙදෙනා
- කථිකාචාර්ය (තාවකාලික පදනම මත)
- තාක්ෂණික නිලධාරී
- විද්‍යාගාර සහායක

2022 වර්ෂයේ ප්‍රගතිය

විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පහත දැක්වෙන පියවර ගෙන ඇත.

- ආසන්න වශයෙන් රු. මිලියන 5ක් පමණ වටිනාකම ඇති සේවාදායක පරිගණක 04ක් මිල දී ගැනීම.
- සේවාදායක කාමරය වැඩි ඉඩකඩ ඇතිව නවීකරණය කිරීම.
- විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ආසන්න වශයෙන් නෝට්බුක් පරිගණක 40ක් මිල දී ගැනීම.
- අලුතින් පිහිටුවන ලද අධ්‍යයන අංශ සහ මධ්‍යස්ථාන සඳහා විශ්වවිද්‍යාල ජාලය වැඩිදියුණු කිරීම.
- බණ්ඩාරගම පිහිටි දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා LEARN රැහැනක් ලබා ගැනීම.
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය සහ ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ඩයලොග් ආසියාටා පීඑල්සී සමාගම හරහා අන්තර්ජාල ආවරණයක් ලබාදීම.
- සේවාදායක පරිගණක විසන්ධිවන කාලය අවම කිරීමට පියවර ගන්නා ලදී.
- විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාල විද්‍යුත් අනන්‍යතා ලබාදීම.
- කඩදාසි භාවිතය අවම කිරීම සඳහා විශ්වවිද්‍යාලය ඇතුළත ඉලෙන්ට්‍රොනික සන්නිවේදනය හඳුන්වාදීම.
- කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා ඔෆිස් 365 ලබාදීම.
- අඛණ්ඩ අධ්‍යාපනයක් සහතික කිරීම පිණිස දේශන සහ ඇගයීම් ලබාදීම සඳහා මාර්ගගත වේදිකාවක් සැපයීමට වැඩ වෙන් කිරීම.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා කෙටි කාලීන සැලසුම්

- උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනයට පහසුකම් සැලසීම පිණිස පරණ පරිගණක වෙනුවට නව පරිගණක මිල දී ගැනීම.
- දැනට පවතින ජාලය උත්ශ්‍රේණිගත කිරීම සහ ජාල ආවරණය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලයට ජාල උපකරණ මිල දී ගැනීම.
- කාබන් විමෝචනය අවම කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති වෙත මාරුවීම.
- මධ්‍යස්ථානය මඟින් ලබා දෙන සේවාවල විසන්ධිවන කාලය අවම කිරීම.
- ඩිජිටල් පරිවර්තනය සඳහා පරිගණක යෙදවුම් ගොඩනැගීම.
- විශ්වවිද්‍යාලයේ පරිශීලනය සඳහා නිදහස් සහ විවෘත මූලාශ්‍ර මෙවලම් සහ ඒවා සකස් කිරීම් පිළිබඳව අත්හදාබැලීම් පැවැත්වීම.

18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය

හැඳින්වීම



මෙම දෙමහල් විද්‍යාගාර ගොඩනැගිල්ල ඉහළ මට්ටමේ විද්‍යාගාර ගෘහ උපකරණ, නවීන විද්‍යාගාර උපකරණ සහ විදුලිය, ජලය සහ වායු අඛණ්ඩ සැපයුමකින් සමන්විත වේ. විද්‍යාගාරය ප්‍රධාන විද්‍යාගාරය සහ පර්යේෂණ විද්‍යාගාරය ලෙස අංශ දෙකකින් ඇතුළත් වේ.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය

ප්‍රධාන විද්‍යාගාරය

ප්‍රධාන විද්‍යාගාරය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ ක්ෂුද්‍රජීවවිද්‍යාව, ජෛවරසායන විද්‍යාව,පටක ජීව විද්‍යාව,කායික විද්‍යාව සහ පරිවෘත්තීය සහ පෝෂණය වැනි විෂයමාලාවල ප්‍රායෝගික සැසි පැවැත්වීමට යොදා ගනී. මෙයට අමතරව, කාර්මික සහ රාජ්‍ය අංශ සඳහා ආදායම් උත්පාදන පරීක්ෂණ පහසුකම් ද සපයනු ලබයි.

පර්යේෂණ විද්‍යාගාරය

පර්යේෂණ විද්‍යාගාරය බිම් මහලේ ස්ථාපනය කර ඇති අතර රසායන විද්‍යාව ආශ්‍රිත ප්‍රායෝගික සැසි සහ පර්යේෂණ සිදු කිරීමට භාවිතා කරනු ලබයි.



නව විද්‍යාගාර ගොඩනැගිල්ල ප්‍රායෝගික සැසිවලට සහභාගී වන උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් 85 දෙනෙක්, සිය පර්යේෂණ ව්‍යාපෘතිවල නියැලි ශිෂ්‍යයින් 20 දෙනෙක් සඳහා සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සපයයි.

දැක්ම

මධ්‍යම විද්‍යාගාරය විද්‍යාව පදනම් වූ ප්‍රවේශයක් හරහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ පරිසරයක් සපයයි.

මෙහෙවර

මධ්‍යම විද්‍යාගාරය ජෛවරසායන විද්‍යාව, ශාක විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාව යනාදී ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු පිළිබඳ අවධානය යොමු කරමින් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ කටයුතු දිරිමත් කරයි.

පරමාර්ථ

- නිපුණතා සහිත දේශීය වෛද්‍ය විද්‍යා උපාධිධාරීන් බිහි කිරීම පිණිස උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා ප්‍රායෝගික සැසි පිරිනැමීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීමට මහජාදන පර්යේෂණ ක්‍රමවේද හඳුන්වාදීම
- ජාතිකව සහ අන්තර්ජාතිකව පිළිගත් පර්යේෂණ, විමර්ශන විශ්ලේෂණ සේවා සහ සොයාගැනීම් පැවැත්වීම.

විද්‍යාගාර කාර්ය මණ්ඩලය

1. විද්‍යාගාර සම්බන්ධීකාරක

ප්‍රධාන විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය

1. ප්‍රධාන තාක්ෂණික නිලධාරී
2. ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරී
3. විද්‍යාගාර සහකාර

පර්යේෂණ විද්‍යාගාර කාර්ය මණ්ඩලය

1. තාක්ෂණික නිලධාරී
2. විද්‍යාගාර සහකාර

විශේෂ වැඩසටහන්





- ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සමඟ සහයෝගය ඇතිව උපාධි අපේක්ෂකයින් සඳහා ඖෂධ පැලෑටි පිළිබඳ ප්‍රමිතිගත කිරීමේ ශිල්පක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.
- කායවික්ත්සාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනේ පශ්චාත් උපාධි ශිෂ්‍යයින් සඳහා ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විශේෂ ප්‍රායෝගික සැසිය.
- ප්‍රථම උපාධි ශිෂ්‍යයින් සඳහා දේශීය සහ ආයුර්වේද ප්‍රතිකාර පිළිබඳ ක්ෂුද්‍රජීවී නාශක ඵලදායීතාව, රසායනික විශ්ලේෂණය සහ සායනික කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යයන

වෙනත් තොරතුරු

කාර්ය මණ්ඩලයේ දැනුම සහ නිපුණතා රටේ සිටින උනන්දුවක් දක්වන කණ්ඩායම්, සංවිධාන උපදේශන සේවා, වැඩමුළු සහ පුහුණු සැසි හරහා මාරු කිරීම සහ උපයෝජනය කරනු ලබයි.

18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් අතර පුරුෂයින් සහ ස්ත්‍රීන් අතර එකමුතුව, සහයෝගය, අන්‍යෝන්‍ය ගෞරවය පෝෂණය කිරීමට කැපවී සිටී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සහ උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව පිළිබඳ UGC ස්ථාවර කමිටුවේ සෘජු විධානය යටතේ ස්ථාපිත කර ඇති ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින් සඳහා හිතකර, ස්ත්‍රී-පුරුෂ සාධාරණ වැඩ කරන සහ ඉගෙනුම් පරිසරයක් සහතික කරයි.

දැක්ම

විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහතික කළ, සහ ඉගෙනුම් පරිසරයක් ඇති බවට සහතික කිරීම.

පරමාර්ථ

- ස්ත්‍රී-පුරුෂභාවය ආශ්‍රිත සංකල්ප සහ කරුණු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව අතර දැනුවත්භාවය ඇති කිරීම.
- ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහ යුක්තිය පිළිබඳ පුහුණුව ලබාදීම
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ අසමානාත්මතාව, අයුක්තිය සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය වැළැක්විය හැකි ක්‍රම සහ විධි හඳුනා ගැනීම.
- අදාළ කුසලතා ගොඩනැංවීම මඟින් ස්ත්‍රී-පුරුෂ අසමානාත්මතාව, අයුක්තිය සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව සවිබල ගැන්වීම.
- ලිංගික සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය පිළිබඳව විමසීම සහ වැරදිකරුවන්ට එරෙහිව විනය පියවර ගැනීමටත් වින්දිතයින්ට පහසුකම් සැලසීමටත් විශ්වවිද්‍යාල කවුන්සිලයට යෝජනා ඉදිරිපත් කිරීම

කාර්ය මණ්ඩල තනතුරු

සම්බන්ධීකාරක

ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය 2022 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගීවූවන්
පුහුණුකරුවන් පුහුණු කිරීම "විවිධත්වය සමඟ ජීවත්වීමට ඉගෙන ගැනීම"	අධ්‍යයන කාර්ය මණ්ඩලය

18.9 සමාජ සංහිදියා මධ්‍යස්ථානය (SRC)

හැඳින්වීම

සමාජ සංහිදියා මධ්‍යස්ථානය (SRC) ප්‍රාදේශීය අනන්‍යතා වෙනුවට ශ්‍රී ලාංකික හැඟීම දිරිමත් කරන අතර වෙනස් ආගම් සහ ජනවාර්ගික අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම පිණිස ස්ථාපිත කර ඇත. සමාජ සංහිදියා මධ්‍යස්ථානය අධ්‍යාපනික සහ සංස්කෘතික වැඩසටහන් හරහා විවිධ ජනකොට්ඨාස සහ ආගමික නායකයින් සහ ඔවුන්ගේ ප්‍රජාවන් එකට එකමුතු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

දැක්ම

සාමාජීය සහ සංස්කෘතික ක්‍රියාකාරකම් හරහා සමාජ සංහිදියාව සහ එකතුමුතුකම ප්‍රවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර පර්යේෂණ නිමැවුම බෙදා හැරීම.

මෙහෙවර

ජාතික එකමුතුව සහ සංහඳියාව ප්‍රවර්ධනය කිරීමට සහ සාමාජීය සහ සංස්කෘතික කටයුතුවල සහ පර්යේෂණවල නිරතවීම හරහා ජාතික එකමුතුකම සහ සංහිදියාව වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රජාවට හැකියාව ලබා දීම.

පරමාර්ථ

- සංහිදියාව අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ සංහිදියා මධ්‍යස්ථාන (SRC) ස්ථාපිත කිරීම.
- දිවයිනේ පුළුල් සහ පශ්චාත්-ගැටුම් ගතිකත්වය පිළිබඳ දැනම සහ පර්යේෂණ සඳහා දායකත්වය දැක්වීම.
- විද්වතුන්ට සංහිදියාව සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාවලිවල නිරතවීමට සහ විවිධ විෂය ක්ෂේත්‍රවලින් ඇදා ගත් දැක්ම සහ දෘෂ්ටිකෝණවලින් පර්යේෂණ නිකුත් කිරීමට දිරිමත් කිරීම
- විවිධ විෂයන්වලින් ඇති පර්යේෂණ මහජනතාව සඳහා භාෂාත්‍රයෙන්ම නිකුත් කිරීමෙන් දැනුම බෙදාහැරීම.
- විවිධ විශ්වවිද්‍යාල අතර බාහිර සහ අභ්‍යන්තර හවුල්කාරත්වය සහ අන්තර්ක්‍රියාකාරීත්වය සඳහා මාර්ගගත/නොබැඳි වේදිකාවන් ගොඩනැගීම
- ද්වේෂය, අවිචාරක මතය, සැකය සහ අවිශ්වාසය යනාදී අංග මුලිනුපුටා දැමීම පිණිස පුද්ගලයින්ට දැනුම ලබා දීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.
- කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විවිධ කාණ්ඩ අතර සුහද සබඳතා දිරිමත් කිරීම.
- විශ්වවිද්‍යාලය තුළ සාමාජීය සංහිදියාව කළමනාකරණය සඳහා ඉක්මන් ඵලදායී අඛණ්ඩ සහ යුක්තිසහගත මාර්ගෝපදේශ සහ ක්‍රියාමාර්ග සැලසීම.

කාර්ය මණ්ඩල තනතුරු

1. අධ්‍යක්ෂ - සමාජ සංහිදියි මධ්‍යස්ථානය (SRC)
2. සෙනෙට් සභාවේ නියෝජිතයින් දෙදෙනෙක්
3. පීඨ සම්බන්ධීකාරකවරු

කළමනාකරණ කමිටුව ස්ථාපිත කර ඇත.

18.10 තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය

හැඳින්වීම

අධ්‍යාපන අංශයේ ගුණාත්මකභාවය සහතික කිරීම ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මූලික පරමාර්ථයකි. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විධිවිධාන සහ සම්මානවල ප්‍රමිතිය පිළිබඳ තත්ත්ව සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ සිටින සියලුම අය සාමූහිකව වගකිව යුතු වේ. එබැවින් සියලුම දෙනා නියැලි ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සෑම අයෙකුගෙන්ම අපේක්ෂා කරනු ලැබේ. එලදායී අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතියක් ස්ථාපිත කිරීම අධ්‍යාන විධිවිධානවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පමණක් නොව ගුණාත්මක සංස්කෘතියක් ගොඩනැගීමට ද දායක වේ.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සියලුම අභ්‍යන්තර තත්ත්ව සංරක්ෂණ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය, සැලසුම්කරණය, සංවිධානගත කිරීම, සංවර්ධනය, ප්‍රවර්ධනය, පහසුකම් සැලසීම සහ අධීක්ෂණය සඳහා අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතියක් මඟින් ස්ථාපිත කරනු ලැබේ. පීඨ තත්ත්ව සහතික කුටි (IQACs) කාර්යයන් සඳහා තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය මඟින් මඟපෙන්වීම ලබා දෙනු ඇත.

දැක්ම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන සහ අනධ්‍යයන ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නැංවීමට අපේක්ෂා කරන සංස්කෘතියක් නිර්මාණය කිරීම තත්ත්ව සහතික කුටිවල ඉලක්කය වේ.

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මක සංස්කෘතියකට මඟපාදන තිරසාර ගුණාත්මක වැඩිදියුණු කිරීමක් සඳහා අනුග්‍රහය දැක්වීම

මෙහෙවර:

a) විශිෂ්ට ව්‍යාවහාර අභ්‍යන්තරගත කරන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන අංශයේ තත්ත්ව සහතිකය (QA) සඳහා පහසුකම් සැලසීම .

b) ගුණාත්මක සංස්කෘතියකට මඟපාදන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය තුළ තිරසාර ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමකට අනුග්‍රහය දැක්වීම

පරමාර්ථ

- විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- විශ්වවිද්‍යාලයේ බාහිර සමාලෝචනයට පහසුකම් සැලසීමේ දී තත්ත්ව සහතික සහ ප්‍රතිඵල කවුන්සිලය (Quality Assurance and Accreditation Council) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය.

- ආයතනික සමාලෝචනය සඳහා ස්වයං-ඇගයීම් වාර්තාව සකස් කිරීමේ දී උපකුලපතිවරයාට සහායවීම.
- වැඩසටහන් සහ විෂය සමාලෝචනය සඳහා ස්වයං-ඇගයීම් වාර්තා සකස් කිරීමේ දී විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශවලට මඟපෙන්වීම.
- විෂය, වැඩසටහන් හෝ ආයතනික සමාලෝචන වාර්තාවල නිර්දේශ කරන ඇති පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.
- විශිෂ්ට ව්‍යවහාර බෙදාහදා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතික ඒකක සමඟ සම්බන්ධීකරණය.

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ CQA

CQA ලේකම්

තත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය වර්ෂය 2022 දී පැවැත් වූ විශේෂ වැඩසටහන්

පීඨය	FIHST			
අධ්‍යයන අංශය	IMR			
වැඩමුළු				
ශිෂ්‍යයින් සඳහා	01	2022 ජූනි 11 - 13 බණ්ඩාරගම	සැසිය පුරාවට ශාක ව්‍යූහ විද්‍යාව සහ කායික විද්‍යාව (BIPT 11051) සහ මූලික රසායන විද්‍යාව (BIPT 11021) පිළිබඳ සැයි, ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුම සහ කුසලතා ඵලදායීව සපයන ලදී.	
	02	2022 ජූනි 14 - 17 WUSL	BSMR 11021(ඖෂධ සම්පත් සංවර්ධනයේ කෘෂිවිද්‍යා මූලධර්ම- විද්‍යාගාරය), සහ BSMR 11041 (ඖෂධ සහ අස්වැන්න ජීවවිද්‍යා විද්‍යාගාරය) යනු ක්ෂේත්‍රය පිළිබඳ අතවශ්‍ය ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුම සහ නිපුණතා ලබාදීමට සකස් කළ විෂය කාර්යයන් වේ.	
අධ්‍යයන කාර්ය මණ්ඩලය	01	2022 සැප්තැම්බර් 22	රූපලාවන්‍ය විද්‍යා විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා විෂයනිර්දේශය සහ විෂයමාලා පිළිබඳ මාර්ගගත වැඩමුළුව	
	02	2022 නොවැම්බර් 02 වෝටර්ස් ඒ හෝටලයේ දී	රූපලාවන්‍ය විද්‍යා විද්‍යාවේදී උපාධි වැඩසටහන සඳහා විෂයනිර්දේශය සහ විෂයමාලා පිළිබඳ මාර්ගගත වැඩමුළුව	
	03	2022 දෙසැම්බර් 01 ග්ලාස්ගෝ	විෂයමාලා සංශෝධනය	
ක්ෂේත්‍ර චාරිකා	08	2022.06.11 2022.06.22 2022.12.05 2022.12.09 2022.12.14 2022.12.18 2022.12.21	බණ්ඩාරගම WUSL කටාන හෝමාගම පේරාදෙණිය කාගිල්ස් WUSL	FISSMS IMR ප්‍රායෝගික අභ්‍යාස පැළ තවාන වෛරස සුචිගත කිරීම IPT ප්‍රායෝගික අභ්‍යාස කිරි ආහාර සැකසීම IMR ප්‍රායෝගික අභ්‍යාස

ජාතික සේවා	02	2022 ඔක්තෝබර් 18 -24	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ දී පවත්වන ලද ප්‍රදර්ශනයේ දී ඖෂධීය සහ සුගන්ධ ශාක වගාකිරීම පිළිබඳ දේශගුණික දක්ෂ කෘෂිකාර්මික භාවිතාවන්
පුහුණුව	02		තොරතුරු තාක්ෂණය
		2022 සැප්තැම්බර් 17	ඔබට ගැලපෙන විශ්වවිද්‍යාල පාඨමාලාව දැන ගන්නේ කෙසේ ද...?" මෙම සැසිය අපොස උ/පෙළ විභාගය ජීවවිද්‍යාව, කෘෂිකර්මය සහ තාක්ෂණික මාධ්‍යවලින් සමත් වූ ශිෂ්‍යයින් සඳහා විශේෂයෙන් සකස් කරන ලදී.

අධ්‍යයන අංශය	තාක්ෂණය		
වැඩමුළු			
ශිෂ්‍යයින් සඳහා	1	2022 ජුනි 27 - 29	ශිෂ්‍යයින්ගේ දැනුම වැඩිදියුණු කිරීම සහ නවීන ශිල්පක්‍රම භාවිතා කරමින් වැඩමුළුවල දී සිදු කරන ප්‍රයෝගික අභ්‍යාසවල දී යොදා ගැනීම. 1වැනි අධ්‍යයන වාරයේ ප්‍රායෝගික විෂයන්වල ප්‍රායෝගික විභාග පවත්වන ලදී. ශිෂ්‍යයින්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික විෂය කරුණු සම්බන්ධයෙන් සහ ප්‍රායෝගික සැසි සම්බන්ධයෙන් ඇති සැක තත්ත්වයන් පැහැදිලි කර ගත හැකි වේ.
	2	2022 ජුනි 27 - 29	නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම කණ්ඩායම් වැඩ ගොඩනැගීම සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම
	3	2022 ජුනි 30 - ජුලි 2	ශිෂ්‍යයින්ගේ දැනුම වැඩිදියුණු කිරීම සහ නවීන ශිල්පක්‍රම භාවිතා කරමින් වැඩමුළුවල දී සිදු කරන ප්‍රයෝගික අභ්‍යාසවල දී යොදා ගැනීම. 1වැනි අධ්‍යයන වාරයේ ප්‍රායෝගික විෂයන්වල ප්‍රායෝගික විභාග පවත්වන ලදී. ශිෂ්‍යයින්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික විෂය කරුණු සම්බන්ධයෙන් සහ ප්‍රායෝගික සැසි සම්බන්ධයෙන් ඇති සැක තත්ත්වයන් පැහැදිලි කර ගත හැකි වේ.
	4	2022 ජුනි 30 - ජුලි 02	නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම කණ්ඩායම් වැඩ ගොඩනැගීම සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම
	5	2022 නොවැම්බර් 19	ජෛව අණු පිළිබඳ ගණනය කිරීමේ විමර්ශන එන්සයිම නිෂේධනය සහ සයික්ලෝ-ඔක්සිජන් (COX) එන්සයිම සහ NSAIDS ඖෂධ අතර අන්තර්ක්‍රියා පිළිබඳ විමර්ශනය
අධ්‍යයන කාර්ය මණ්ඩලය			
පුහුණුව			
ක්ෂේත්‍ර චාරිකා	02	2022 සැප්තැම්බර් 21	BHBM 12033 සඳහා 1වැනි වසරේ 2වැනි අධ්‍යයන වාරයේ ජෛවවෛද්‍ය විෂය සඳහා පාරිසරික සහ මහජන සෞඛ්‍ය පාඨමාලාව BHBM 12033 සඳහා 1වැනි වසරේ 2වැනි අධ්‍යයන වාරයේ ජෛවවෛද්‍ය විෂය සඳහා පාරිසරික සහ මහජන සෞඛ්‍ය පාඨමාලාව
ජාතික සේවා	01	2022 නොවැම්බර් 14	2022 වසරේ ලෝක දියවැඩියා දිනයේ දී පෙ.ව. 11 සිට ප.ව. 3 වන තෙක් දියවැඩියාව පිළිබඳව දැනුවත් කිරීමේ ප්‍රදර්ශනයක් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී සංවිධානය කරන ලදී. මේ වර්ෂයේ තේමාව වන හෙට දින රැකගැනීම වෙනුවෙන් දැන ගනිමු යටතේ මෙම උත්සවය ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා සංවිධානය කරන ලදී.

අධ්‍යයන අංශය	IHS		
වැඩමුළු			
ශිෂ්‍යයින් සඳහා	01	2022 ජූලි 06	මෙම වෙබිනාර් සම්මන්ත්‍රණය අභිප්‍රේරණ සැසියක් ලෙස ශිෂ්‍යයින් සඳහා සංවිධානය කරන ලදී.
	02	2022 ජූලි 18	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සරත් මුණසිංහගේ සහභාගීත්වයෙන් සංචාරක ව්‍යාපාරයේ සත්කාර - ආගන්තුක සබඳතා පිළිබඳ වෙබිනාර් සැසියක් පවත්වන ලදී.
	03		පළමු වැනි වැඩමුළුව යෝග අභ්‍යාස ආවරණය කිරීමට පවත්වන ලදී. ස්ථානය - බණ්ඩාරගම සර්වෝදය පරිශ්‍රය, යෝග සහ පරාමනෝවිද්‍යාව උපාධි වැඩසටහන සඳහා අධ්‍යයන කටයුතුවල නියැලි ශිෂ්‍යයින් මෙම වැඩමුළුව සම්පූර්ණ කරන ලදී.
	04		දේශීය පරාමනෝවිද්‍යා භාවිතාවන්, දේශීය ඖෂධ සකස් කිරීම, දේශීය ආහාර සකස් කිරීම, සහ යෝග සහ පරාමනෝවිද්‍යා විෂයට අදාළ මන්ත්‍ර සහ සූත්‍ර අභ්‍යාස ආවරණය කරන වැඩමුළුව හිරිපිටිය සුජාතා බිම්බාරාමය පන්සලේ දී සාර්ථකව පවත්වන ලදී.
අධ්‍යයන කාර්ය මණ්ඩලය	01		අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය රැස්වීමකට සහභාගීවීම සඳහා උණවටුන පිහිටි ශ්‍රී යෝග ශාලා පරිශ්‍රයේ සංචාරය කරන ලදී.
පුහුණුව	01	2022 මැයි 26	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඥණදාස පෙරේරාගේ සහයෝගය ඇතිව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ මානසික සෞඛ්‍ය සහ සුභසිද්ධිය ශක්තිමත් කිරීම සඳහා වෙබිනාර් සම්මන්ත්‍රණය සාර්ථකව පවත්වන ලදී.
	02	2022 නොවැම්බර් 29	ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය ඇතිව යෝග අංශය තුළ කාන්තා ව්‍යවසායකයින් පිළිබඳ වෙබිනාර් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. සාර්ථක කාන්තා ව්‍යවසායකයෙක් වන්නේ කෙසේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙම සැසියේ පරමාර්ථය විය. උණවටුන ශ්‍රී යෝග ශාලා ආයතනයේ හිමිකාරත්වය ඇති ඊවා වෙග්නර් මිය සම්පත්දායිකාව විය.
ක්ෂේත්‍ර චාරිකා	01		ශිෂ්‍යයින්ගේ පළමු වැනි ක්ෂේත්‍ර චාරිකාව කර්මාන්ත වෙත නිරාවරණයක් ලබා ගැනීම පිණිස පවත්වන ලදී. දඹුල්ල ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා UNESCO ලෝක උරුම ස්ථාන කිහිපයක් මෙයට ඇතුළත් විය.
	02		පළමු වැනි ක්ෂේත්‍ර චාරිකාව ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය ඇතිව වැලිගම, බාබේරියන් බීච් ආයුර්වේද රිසෝට් හි දී පවත්වන ලදී. ශිෂ්‍යයින් විසින් යෝග ආසන නැටුම්, සූර්ය නමස්කාර්, සූත්‍ර සහ දෙවියන් සඳහා පූජා ඉදිරිපත් කරන ලදී. ශිෂ්‍යයින්ට මෙම හෝටලයේ දී විදේශිකයින් සමඟ යෝග සැසිවලට සහභාගීවීමට අවස්ථාව හිමි විය.
ජාතික සේවා	01	2022	අන්තර්ජාතික ලෝක සංචාර දින සැමරුම් In Paradiso 2022 යන තේමාව යටතේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී.
	02	2022 ජූනි 22	“යහපැවැත්ම සඳහා යෝග“ යන තේමාව යටතේ ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව අන්තර්ජාතික යෝග දින සැමරුම් සාර්ථකව පවත්වන ලදී.

පීඨය	FISSMS		
අධ්‍යයන අංශය	ISS		
වැඩමුළු			
ශිෂ්‍යයින් සඳහා	01	I දිනය: 2022 නොවැ. 26 – 27	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය දැනුම පිළිබඳ සමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සඳහා මිශ්‍ර අධ්‍යාපනය, LMS, ශාස්ත්‍රීය උපදේශනය, සහ විවිධත්වය පිළිබඳ සංවේදීතාව
	02	II දිනය: 2022 දෙසැම්බර් 04	
අධ්‍යයන කාර්ය මණ්ඩලය	01	2022 නොවැම්බර් 15	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය දැනුම පිළිබඳ සමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සඳහා අධ්‍යයන ලේඛන සංවර්ධන වැඩමුළුව
	02	2022 නොවැම්බර් 28	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය දැනුම පිළිබඳ සමාජ අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය සඳහා විෂයමාලා සංවර්ධන වැඩමුළුව
FIM			
ශිෂ්‍යයින් සඳහා වැඩමුළු	03		BIMS
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	01		
ශිෂ්‍යයින් සඳහා පුහුණුව	04		
ජාතික සේවා	03		ප්‍රජාව සඳහා
කොලෝකියම (Colloquium)	01		

වැඩසටහනේ නම	වැඩසටහන් සංඛ්‍යාව
මුළු වැඩමුළු සංඛ්‍යාව	ශිෂ්‍යයින් සඳහා = 14 කාර්ය මණ්ඩලය සඳහා = 07
මුළු පුහුණු සංඛ්‍යාව	08
මුළු ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව	12
මුළු ජාතික සේවා සංඛ්‍යාව	08

අනෙකුත් වෙනත් තොරතුරු

CQA මඟින් තත්ත්ව සහතිකකරණය සඳහා ප්‍රතිපත්ති අත්පොත සහ අනු-නීති ක්‍රියාත්මක කර, සමාලෝචනය කරන ලදී.

18.11 ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් මධ්‍යස්ථානය (ELTC)

හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා අවශ්‍යතාවන් ඉටු කරනු පිණිස විශ්වවිද්‍යාලයේ කේන්ද්‍රීයස්ථානය ලෙස කටයුතු කරමින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් මධ්‍යස්ථානය (ELTC) වර්තමානයේ දී ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පීඨවල ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහා පහසුකම් සලසයි. 2021 වර්ෂයේ දී ස්ථාපනය කළ මෙම මධ්‍යස්ථානය ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින්ගේ සහ පශ්චාත්-උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ සේවානියුක්තිභාවය සහ ශාස්ත්‍රීය කුසලතා වැඩිදියුණු කිරීම පිණිස ඔවුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීමට කැපවී ඇත.

ශිෂ්‍ය ප්‍රජාවගේ කුසලතා වැඩිදියුණු කිරීම පිණිස ශිෂ්‍ය ප්‍රජාවට සහාය වන අතර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් මධ්‍යස්ථානය, විශ්වාසනීය, සහ ඵලදායී ඉංග්‍රීසි භාෂා සහයෝගී සේවා පිරිනමමින්, අනෙකුත් විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයින්ගේ පෞද්ගලික, වෘත්තීය සහ ශාස්ත්‍රීය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ද සහාය වෙයි.

දැක්ම

ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ට කේන්ද්‍රයක් බවට පත්වීම

මෙහෙවර

ඉංග්‍රීසි භාෂාවෙන් සාර්ථකව සන්නිවේදනය කළ හැකි, ඉංග්‍රීසි භාෂාවෙන් සිය ශාස්ත්‍රීය රචනා කුසලතාවලින් නිපුණ සහ ඩිජිටල් ලෝකයේ අභියෝගවලට මුහුණදීමට සූදානම් දක්ෂ උපාධිධාරීන් බිහි කිරීම.

පරමාර්ථ

- උසස් අධ්‍යාපනයේ සහ රැකියා අවස්ථාවල ඉහළ කාර්යක්ෂමතාවන් සඳහා උපාධි අපේක්ෂකයින්ට අවශ්‍ය කරන ඉංග්‍රීසි භාෂා නිපුණතා සංවර්ධනය කිරීම සඳහා අවස්ථාවක් ලබාදීම
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයින් අතර ඉංග්‍රීසි පිළිබඳ වාචික සහ ලිඛිත නිපුණතාව වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය ශිල්පක්‍රම සහ අධ්‍යාපනය භාවිතා කිරීම
- විශ්වවිද්‍යාල ප්‍රජාවේ ඉංග්‍රීසි භාෂාව ආශ්‍රිත අවශ්‍යතාවන් සඳහා මූලාශ්‍රයක් ලෙස කටයුතු කිරීම
- විවිධ කාර්යයන් සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් රචනා කිරීම සම්බන්ධයෙන් සහාය අවශ්‍ය කරන ශිෂ්‍යයින් සහ වෙනත් පාර්ශ්වයන් සඳහා සහායදීම
- බාහිර ප්‍රජාවගේ ඉංග්‍රීසි භාෂා නිපුණතා ඉහළ නැංවීම පිණිස සහ ඔවුන්ගේ ප්‍රවර්ධන අපේක්ෂාවන් වෙනුවෙන් සහතිකපත්‍ර මට්ටමේ විශ්වවිද්‍යාල ඉංග්‍රීසි සුදුසුකමක් ලබා ගැනීම පිණිස අවස්ථාවන් සැලසීම

පිරිනමන පාඨමාලා

1. නවක උපාධි අපේක්ෂකයින් සඳහා ශාස්ත්‍රීය කුසලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන
2. ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි

3. විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි I
4. විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි II
5. විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි III
6. ENGL 11011: ඉංග්‍රීසි භාෂා කුසලතා 1
7. ENGL 11021: ඉංග්‍රීසි භාෂා කුසලතා 1 (ප්‍රායෝගික)
8. ENGL 21031: ඉංග්‍රීසි භාෂා කුසලතා 2
9. ENGL 21041: ඉංග්‍රීසි භාෂා කුසලතා 2 (ප්‍රායෝගික)
10. ENGL 11012: වෘත්තිකයින් සඳහා ඉංග්‍රීසි
11. ENGL 12021: තාක්ෂණය සඳහා ඉංග්‍රීසි
12. ENGL 12032: ස්වභාවික විද්‍යා සඳහා ඉංග්‍රීසි
13. ENGL 12042: යෝග සහ සංචාරක කර්මාන්තය සඳහා ඉංග්‍රීසි

විශේෂ වැඩසටහන්/විස්තීරණ පාඨමාලා

ඉංග්‍රීසි භාෂා නිපුණතාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

කාර්ය මණ්ඩල තනතුරු

සම්බන්ධීකාරක (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)
සම්බන්ධීකාරක (කථිකාචාර්ය)
කථිකාචාර්ය (ආධුනික)

18.12 මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය

හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය උපකුලපතිතුමාගේ ඍජු අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇත. ඡායාරූප, වීඩියෝ සහ වෙනත් මාධ්‍ය ඇතුළු මාධ්‍ය ක්‍රම භාවිතා කරමින් විශ්වවිද්‍යාලය ප්‍රවර්ධනය කිරීම මෙම ඒකකයේ මූලික පරමාර්ථය වේ.

තව ද, යූටියුබ්, ට්විටර්, ඉන්සටග්‍රම් සහ මුහුණු පොත වැනි සමාජ මාධ්‍ය නාලිකා සඳහා පරිපාලකයා ලෙස ද මාධ්‍ය ඒකකය ක්‍රියාකාරනු ලබයි. එමෙන්ම, මාධ්‍ය ඒකකය මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සමඟ සමීප සම්බන්ධතා පවත්වනු ලබයි.

කාර්ය මණ්ඩලය

- සම්බන්ධීකාරක
- තාක්ෂණික නිලධාරී

2022 වර්ෂය තුළ ලැබූ ජයග්‍රහණ

විශ්වවිද්‍යාලය මඟින් සම්පත් මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකයට නවීකරණය කිරීම මඟින් මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකය ශක්තිමත් කර ඇත. මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකය පහත දැක්වෙන කාර්යයන් ඉටු කර ඇත.

- විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම්වල ඡායාරූප සහ වීඩියෝ නවීකරණය කිරීම
- විශ්වවිද්‍යාලයේ මුහුණුපොත පිටුව හරහා මාර්ගගත වීඩියෝ පළ කිරීම
- විශ්වවිද්‍යාල ඡායාරූප සහ වීඩියෝ ලේඛනාගාරයක් නිර්මාණය කිරීම.
- මහජනතාව දැනුවත් කිරීම සඳහා ශාස්ත්‍රීය සහ වාණිජ වටිනාකම ඇති කෙටි වීඩියෝ පටිගත කිරීම් සකස් කිරීම.
- විශ්වවිද්‍යාලයේ ප්‍රකාශන සඳහා ආවරණ පිටු නිර්මාණය කිරීම.
- වැදගත් ප්‍රවෘත්ති පළ කිරීම සඳහා ප්‍රසිද්ධ මාධ්‍ය සමඟ සම්බන්ධතා පැවැත්වීම.
- මාධ්‍ය ක්‍රියාකාරකම් සහ මාධ්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ ශිල්පීය සහාය

කෙටි කාලීන සැලසුම්

- භෞතික සහ මානව සම්පත්වලින් ඒකකය ශක්තිමත් කිරීම
- මාධ්‍ය සහ මුද්‍රණය ආශ්‍රිත පර්යේෂණ පැවැත්වීම.
- ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා මාධ්‍යයට සම්බන්ධ වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම
- විශ්වවිද්‍යාලය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රසිද්ධ මාධ්‍ය සමඟ ඇති සබඳතා ශක්තිමත් කිරීම
- විශ්වවිද්‍යාලය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායන් හඳුන්වාදීම.

18.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC)

දැක්ම

අන්තර්ජාතික සහායෝගය ව්‍යාප්ත කිරීම සඳහා දොරටුවක් බවට පත්වීම

මෙහෙවර

දේශීය දැනුම් සාරධර්මවලට නිසි ගෞරවය සුරක්ෂිත කරන අතරතුර අන්තර්ජාතික සහයෝගීතා ප්‍රවර්ධනය කිරීම, විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සහ ශිෂ්‍යයින්ගේ ගෝලීය පුරවැසිභාවය සවිබලගැන්වීම සඳහා මූලාරම්භ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

පරමාර්ථ

- ලෝකය පුරා විශ්වවිද්‍යාල සහ විවිධ ආයතන සමඟ අන්තර්ජාතික පර්යේෂණ සහ ශාස්ත්‍රීය සහයෝගය ප්‍රවර්ධනය කිරීම.
- විදේශ භාෂාවලින් සන්නිවේදනය කිරීමේ කුසලතා ක්ෂේත්‍රවල අන්තර්ජාතික පුහුණු වැඩසටහන් සහ වැඩමුළු සඳහා පහසුකම් සැලසීම.

- දේශීයකරණයේ සාරධර්ම වැඩිදියුණු කරමින් ගෝලීය සන්දර්භයක් තුළ සුරක්ෂිත කර ඇති දේශීය දැනුම හුවමාරු කිරීම.
- විවිධ ජනකොට්ඨාස අතර වෙනස් සංස්කෘතික වටිනාකම්වලට ගරු කරන පුද්ගලයෙක් පෝෂණය කරන සාරධර්ම පාදක අධ්‍යාපනයක් හරහා ගෝලීයකරණය පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම.

GWIC හි ප්‍රධාන කාර්යභාරය

- විදේශ විශ්වවිද්‍යාල, පර්යේෂණ මධ්‍යස්ථාන, අන්තර්ජාතික සංවිධාන සහ වාණිජ සමාගම් සමඟ විවිධ සහයෝගිතා ඇති කර ගැනීම පිළිබඳ අවබෝධතා ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම
- ප්‍රදාන ලැබීමේ අවස්ථාවන් සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම
- ශිෂ්‍යත්ව/ ශිෂ්‍යභාවයන් සහ බාහිර සවලතා ප්‍රදාන සඳහා කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයින්ට අවශ්‍ය සහාය ලබාදීම
- මෙරටට පැමිණෙන විදේශීය නියෝජිතයින් මෙරට රැඳී සිටින කාලය අතරතුර ඔවුන් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සඳහා වෙන්කර ඇති කාලයට අනුව ඔවුන්ගේ සාංචාර සංවිධානය කටයුතු සම්බන්ධීකරණය කිරීම
- පැමිණෙන විදේශ ශිෂ්‍යයින් සඳහා මූලික සංවිධාන කටයුතු අවශ්‍යතා පහසුකම් සැලසීම
- විවිධ අන්තර්ජාතික සංවිධාන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අනාගත සංවර්ධන කටයුතුවලට දායක කර ගැනීමේ විභවතාව හඳුනා ගනිමින් එම අන්තර්ජාතික සංවිධාන සමඟ ශක්තිමත් සහ තිරසාර සබඳතා ස්ථාපිත කර ගැනීම
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුවත් අන්තර්ජාතික හවුල්කරුවන්ට බෙදාහැරීම
- අනාගත ශිෂ්‍යයින්ගේ විදේශීය සේවානියුක්තිභාවය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාව ඇතිව භාෂා පුහුණු වැඩසටහන් සහ අභ්‍යන්තර අන්තර්-සංස්කෘති වැඩමුළු සඳහා පහසුකම් සැලසීම.

කාර්ය මණ්ඩලය

- අධ්‍යක්ෂ
- සම්බන්ධීකාරක - අන්තර්ජාතික සහයෝගිතාව
- සම්බන්ධීකාරක - සංවිධාන කටයුතු
- සම්බන්ධීකාරක - ශිෂ්‍ය කටයුතු
- සම්බන්ධීකාරක – මූල්‍ය
- සහකාර සම්බන්ධීකාරක - අන්තර්ජාතික සහයෝගිතාව

19. ගිණුම් 2022

19.1 පුනරාවර්තන විදයම් පිළිබඳ විස්තර

19.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

19.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

19.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)

19.5 එක් එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය 2018-2022

19.6 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය මුදල් සම්පාදිත) – 2022



19.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

විෂය	2021 (රු.)	2022 (රු.)
සේවක පාරිශ්‍රමිකය	383,889,753	496,464,241
ප්‍රවාහනය	85,748	209,058
සැපයුම් සහ භාවිතා කළ පරිභෝජන භාණ්ඩ	12,432,029	24,361,851
නඩත්තුව	6,766,066	13,414,386
ගිවිසුම්ගත සේවා	38,731,230	67,983,805
වෙනත් මෙහෙයුම් වියදම්	16,562,968	15,569,768
ස්වයං මූල්‍ය වැඩසටහන්වල වියදම්	16,586,743	33,750,398
එකතුව	**475,054,537**	**651,753,507**

19.2 ප්‍රාග්ධන වියදම පිළිබඳ විස්තර

විෂය	2021 (රු.)	2022 (රු.)
පූනරුත්ථාපනය සහ ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම	68,838,175	48,906,270
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	29,650,460	101,053,916
ඉදිකිරීම් ව්‍යාපෘති	32,167,661	-
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය	-	120,000
එකතුව	**130,656,296**	**150,080,186**

19.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම)

විෂය	2022 දී වෙන්කිරීම් හා වෙනත් (රු.)	2022 දී වියදම් (රු.)	ඉතුරුම්/(අතිරේක) (රු.)
පුනරාවර්තන ප්‍රදාන	570,000,000	651,753,507	8,586,822
අභ්‍යන්තර ආදායම් මූලාශ්‍ර	90,340,329		
ප්‍රාග්ධන ප්‍රදාන	65,000,000	65,000,000	-
වෙනත් ප්‍රදාන	2,500,000	1,152,835	1,347,165
AHEAD ප්‍රදාන	10,695,468	10,695,468	-
එකතුව	**738,535,797**	**728,601,810**	**9,933,987**

19.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම)


ආදායම් මූලාශ්‍රය	2022 දී එකතුව (රු.)
ණය සහ අත්තිකාරම්වලින් පොලිය	834,737
විවිධ ලැබීම්	1,284,071
ආයෝජනවලින් පොලිය	53,953,443
ලියාපදිංචි ගාස්තු	1,508,440
පරීක්ෂණ ගාස්තු	109,400
පුස්තකාල දඩ	37,151
වෛද්‍ය ගාස්තු	-
දේපළවලින් කුලිය	601,530
ස්වයං මූල්‍ය කටයුතු වලින් ලැබෙන ආදායම	31,925,982
තොග අලෙවිය	85,575
එකතුව	**90,340,329**

19.5 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2022

විෂය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙක් සඳහා වියදම රු.
පුනරාවර්තන	පුනරාවර්තන වියදම / මුළු ශිෂ්‍යයින්	621,109

19.6 ඒක ශිෂ්‍ය පිරිවැය 2018 – 2022 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ඇතුළුව)

විශ්වවිද්‍යාලය	එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය (රු.)				
	2018	2019	2020	2021	2022
GWUIM	692,702	681,810	713,095	845,881	621,109



20. මූල්‍ය ප්‍රකාශන - 2022



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිදයාලය

2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

	පිටු අංකය
1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	01
2 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය	02-03
3 ශුද්ධ වත්කම්/ කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන	04
4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන	05
5 වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	06-20
6 අයවැය සහ තථ්‍ය සැසඳීම පිළිබඳ ප්‍රකාශන	21

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

විස්තරය	සටහන්	2022	2021 පුනප්‍රකාශිත
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	2	12,048,280	59,389,852
විවිධ ණයකරුවෝ	3	2,380,430	2,428,430
ණය හා අත්තිකාරම්	4	20,132,674	18,538,751
බඩු ලේඛනය	5	5,315,202	13,300,902
පූර්ව ගෙවීම්	6	461,678	102,110
කෙටි කාලීන ආයෝජන		136,858,285	252,310,840
වෙනත් ජංගම වත්කම්	7	33,668,094	2,297,269
		210,864,643	**348,368,154**
ආයෝජන			
ස්ථාවර වත්කම්		208,845,908	137,486,855
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	8	729,483,767	627,201,046
කෙරී ගෙන යන වැඩ	9	159,130,818	78,230,870
ප්‍රාග්ධන අත්තිකාරම්		7,048,140	13,696,625
අස්පර්ෂණීය වත්කම්	10	1,549,633	157,284
වෙනත් (මානව ප්‍රාග්ධනය)	11	221,607	170,500
		1,106,279,873	**856,943,180**
මූලු වත්කම්		**1,317,144,516**	**1,205,311,334**
වගකීම්			
ජංගම වගකීම්			
සම්මුචිතීත වියදම්	12	24,920,397	8,155,800
කළ යුතු ගෙවීම්	13	18,782,575	1,972,633
ආපසු ගෙවිය යුතු තැන්පතු හා වෙනත්	14	52,676,534	25,669,049
		96,379,506	**35,797,482**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	15	138,622,486	142,636,305
මුළු වගකීම්		**235,001,992**	**178,433,787**
මුළු ශුද්ධ වත්කම්		**1,082,142,524**	**1,026,877,548**
ශුද්ධ වත්කම්/ සමකොටස්			
සමුච්චිත අතිරික්තය - ප්‍රාග්ධනය		773,969,822	539,752,002
සමුච්චිත අතිරික්ත -නොගෙවූ		12,971,328	202,902,628
සමුච්චිත අතිරික්තය -පුනරාවර්තන		35,476,870	(10,439,360)
සීමාකළ අරමුදල් සහ ප්‍රදාන	16	29,174,152	64,111,926
ප්‍රත්‍යාගණන සංචිත හා වෙනත්	17	230,550,352	230,550,352
මුළු ශුද්ධ වත්කම්/ සම කොටස්		**1,082,142,524**	**1,026,877,548**

මෙම මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ සහ වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානවල අවශ්‍යතාවන්ට අනුකූල වේ.

සී.සී. ජී. කොතලාවල
මූල්‍යාධිකාරී

මහාචාර්ය රන්ජනා ඩබ්ලිව්. සෙනෙවිරත්න
උපකුලපති

විශ්වවිද්‍යාලයේ පාලන සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

සිරිමල් සේනාරත්න මහතා
පාලක සභා සාමාජික

සුනිල් ජයලත් මහතා
පාලක සභා සාමාජික

2023 පෙබරවාරි මස 27 වැනි දින
යක්කල

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31වැනි දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

	සටහන්	2022	2021 පුනප්‍රකාශිත
		රු	රු
ආදායම			
හුවමාරු කළ ොහැකි ගනුදෙනුවලින් ආදායම			
පුනරාවර්තන ප්‍රදාන (ආණ්ඩුව)		570,000,000	489,000,000
		570,000,000	**489,000,000**
ප්‍රාග්ධන ප්‍රදාන (ආණ්ඩුව)		65,000,000	118,800,000
ප්‍රදාන -AHEAD		10,695,468	21,452,624
ප්‍රදාන - ක්‍රීඩා ශූරතාවලිය		1,152,835	
ආධාර - වාහනය		10,000,000	
		86,848,303	**140,252,624**
		656,848,303	**629,252,624**
හුවමාරු ගනුදෙනුවලින් ආදායම			
ණය සහ අත්තිකාරම්වලිොලිය		834,737	793,084
විවිධ ලැබීම්	18	1,284,071	9,040,405
ආයෝජන පොලිය		53,953,442	19,395,483
ලියාපදිංචි ගාස්තු		1,508,440	534,150
විභාග ගාස්තු		109,400	69,850
පුස්තකාල දඩ මුදල්		37,151	2,935
වෛද්‍ය ගාස්තු		-	-
දේපළ කුලිය	19	601,530	126,845
තොග විකුණුම්		85,575	42,680
මහපොල හා ශිෂ්‍යාධාර	20	17,356,430	9,840,430
ස්වයං-මූල්‍ය වැඩසටහන්වලින් ආදායම		31,925,982	13,283,709
		107,696,758	**53,129,571**
මුළු ආදායම		**764,545,061**	**682,382,195**
මෙහෙයුම් ප්‍රතිඵල			
පුනරාවර්තන ආදායම			
හුවමාරු නොකළ		570,000,000	489,000,000
හුවමාරු කළ		107,696,758	53,129,571
එකතුව		**677,696,758**	**542,129,571**
වියදම් - ජංගම (ප්‍රාග්ධ නොවන)			
(1) පුද්ගලික පඩිනඩි		(496,464,241)	(383,889,753)
(2) ගමන් වියදම් සහ යැපීම් දීමනාව		(209,058)	(85,748)
(3) සැපයුම් හා භාවිතා කළ පාරිභෝජන		(24,361,851)	(12,432,029)
(4) නඩත්තුව		(13,414,386)	(6,766,066)
(5) කොන්ත්‍රාත් සේවා		(67,983,805)	(38,731,230)
ක්ෂයවීම් සහ වියදම් ක්‍රමක්ෂය		-	-
මහපොළ සහ ශිෂ්‍යාධාර	20	(17,356,430)	(9,840,430)
(3) වෙනත් මෙහෙයුම් වියදම්		(15,569,768)	(16,562,968)
(4) ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා වියදම්		(26,098,727)	(13,400,375)
(5) උත්පාදිත අරමුදල් වියදම්		(7,651,671)	(3,186,368)
මුළු විදයම්		**(669,109,937)**	**(484,894,967)**
වර්තමාන අතිරික්තය/කාලසීමාව සඳහා (හිඟය)		**8,586,821**	**57,234,604**
හුවමාරු නොවන ආදායම-ප්‍රාග්ධන ප්‍රදානය		**86,848,303**	**140,252,624**
හුවමාරු ආදායම - ප්‍රාග්ධන			
ක්ෂයවීම් සහ වියදම් ක්‍රමක්ෂය		(46,661,608)	(35,637,302)
දේපළ පිරියත සහ උපකරණ අපවයවීම්		-	-
ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ගණුනය කිරීමෙන් පසු පසු කාලය සඳහා අතිරික්තය/(හිඟය)		**40,186,695**	**104,615,322**
කාඟය සඳහා මුළු අතිරික්තය/(හිඟය)		**48,773,516**	**161,849,926**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් **31** වැනි නෙන් අවසන් වර්ෂය සඳහා

ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

විෂය කේතය	ගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	නොගෙවූ ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අතිරික්ත- ප්‍රාග්ධනය	සමුච්චිත ප්‍රාග්ධනය (නොගෙවූ)	සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන	ප්‍රත්‍යාගණන සංචිතය	පොදු සංචිතය	සීමාකළ අරමුදල්, ප්‍රදාන සහ ආධාර	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2021 දෙසැම්බර් **31**වැනි දිනට ශේෂය	**416,337,418**	**214,758,924**				**221,389,128**	**(58,771,841)**	**48,954,236**	**842,667,865**
									-
2021 දෙසැම්බර් **31**වැනි දිනට ශේෂය	123,414,584	(11,856,296)				9,161,224	57,234,604	15,157,690	**193,111,806**
							(8,902,123)		**(8,902,123)**
2021 දෙසැම්බර් **31**දිනට ශේෂය	**539,752,002**	**202,902,628**				**230,550,352**	**(10,439,360)**	**64,111,926**	**1,026,877,548**
2022 ජනවාරි **01**වැනි දිනට ශේෂය	**(539,752,002)**	**(202,902,628)**	**539,752,002**	**202,902,628**	**(10,439,360)**		**10,439,360**		-
වසර සඳහා අතිරික්තය/ (හිඟය)					48,773,516	-			48,773,516
ප්‍රාග්ධන ප්‍රදානය (GOSL) 2022				65,000,000					65,000,000
ක්‍රීඩා ශූරතාව සඳහා ප්‍රදානය				1,152,835					1,152,835
යටිතලපහසුකම් සංවර්ධනය සඳහා AHEAD ප්‍රදානය				10,695,468					10,695,468
මාරු කිරීම්/ ශුද්ධ සංචලන			199,931,300	(199,931,300)					-
								9,348,746	9,348,746
භූවමාරු නොවන ආදායමට මාරු කිරීම				(76,848,303)					(76,848,303)
ත්‍යාග සහ පරිත්‍යාග			34,286,520	10,000,000				(44,286,520)	-
සමුච්චිත අතිරේක පුනරාවර්තනවලට සිදු කළ ගැලපීම් - 2022					(2,857,285)				(2,857,285)
									-
2022 දෙසැම්බර් **31** දිනට ශේෂය	-	-	**773,969,822**	**12,971,328**	**35,476,870**	**230,550,352**	-	**29,174,152**	**1,082,142,524**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තරය	2022 රු. 000'	2021 රු. 000'
මෙහෙයුම් ක්‍රියාවලිවලින් මූල්‍ය ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය (හිඟය)	48,774	57,235
එකතු කළා: මූල්‍ය නොවන කටයුතු	-	
ක්ෂයවීම්	46,338	35,637
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන - පාරිතෝෂකය	18,959	26,091
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		(35,637)
අස්පර්ශණීය වත්කම් ක්‍රමක්ෂය	254	152
මානව ප්‍රාග්ධනය ක්‍රමක්ෂය	69	
වැඩ ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ	**114,394**	**83,478**
	-	
සිදු කළ ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම)	33,575	3,544
බඩු ලේඛනවල (වැඩිවීම)/අඩු කිරීම	(7,986)	10,929
ගනුදෙනු හා වෙනත් ලැබීම්වල අඩුවීම (වැඩිවීම)/අඩු කිරීම	33,276	(1,127)
ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම)	27,007	(15,811)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල	**200,266**	**81,013**
පාරිතෝෂික ගෙවීම්	(22,973)	(15,858)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**177,293**	**65,154**
ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිල දී ගැනීම	(151,607)	(99,489)
කෙරී ගෙන යන වැඩ	(80,900)	(31,596)
වෙනත් හා ප්‍රාග්ධන අත්තිකාරම්	6,648	(11,380)
මානව ප්‍රාග්ධන සංවර්ධනය	(120)	
ශුද්ධ ආයෝජනය	(44,094)	(85,262)
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(270,073)**	**(227,727)**
	-	
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය	-	
	-	
පෙර වර්ෂයේ ගැලපීම් (ශුද්ධ)	2,182	(1,766)
ලැබූ ප්‍රදාන	78,195	118,800
සීමා කළ අරමුදල්	(34,938)	15,158
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**45,439**	**132,192**
	-	
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)	(47,341)	(30,381)
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	59,389	89,770
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	**12,048**	**59,389**

<u>ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය</u>
<u>වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>

1. ආයතනික තොරතුරු

1.1 පදිංචිය හා නෛතික ස්වභාවය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කළ 1995 පෙබරවාරි මස 23වැනි දිනැති අංක 859/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව 1995 මාර්තු මස 01වැනි දින සිට 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරනු ලබන තෙක් කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතනයක් ලෙස පිළිගනු ලැබීය.

2020.07.08 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, යක්කල සියලුම පහසුකම්වලින් අනූන විශ්වවිද්‍යාලයක තත්ත්වයට ඉහළ නැංවීම සඳහා තීරණය කරන ලද අතර ඒ අනුව විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම පිණිස 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව නියෝගය නිකුත් කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 2021.03.01 වැනි දින සිට ස්ථාපිත කරනු ලැබ එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

විශ්වවිද්‍යාලය කොළඹ- මහනුවර මාර්ගයේ කොළඹ නගරයෙන් කිලෝ මීටර 30ක් පමණ දුරින් යක්කල නගරයේ දී පිහිටුවා ඇත. නව විශ්වවිද්‍යාලයට ප්‍රථම උපාධි වැඩසටහන් 11ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් 10 පමණ පිරිනමනු ලබන, අධ්‍යයන අංශ 14කින් සමන්විත පීඨ හතරක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයට 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටමේ ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කර ගැනීමට යෝජිත වන අතර ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමානුකූලව වැඩි කිරීමට අපේක්ෂා කරනු ලබයි.

සමාලෝචිත 2021 මූල්‍ය වර්ෂය අතරතුර දී, විශ්වවිද්‍යාලය පොදු මුද්‍රාවක් සහ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වේ. 2021 වර්ෂය සඳහා වාර්ෂික අයවැය වෙන්කිරීම සහ අරමුදල් බෙදාහැරීම ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය ශීර්ෂය යටතේ සිදු කරන ලදී.

1.2 විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍යය සහ ක්‍රියාකාරකම්

2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය සහ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකර අධ්‍යයන ශාඛාවන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වේ.

තව ද, තෝරාගත් විෂයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා විශ්වවිද්‍යාලය විසින් ඇති කළ බවත් දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කිරීම විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් එයින් නියම කර ඇත.

1.3 විශ්වවිද්‍යාලයේ පාලක සභාව

පාලක සභාව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරනු ලැබේ.

1.4 නිකුත් කිරීම සඳහා බලයදීමේ දිනය

විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මතමූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දී ඇත.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සකස් කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (අදාළ වන පරිදි SLPSAS I වැනි වෙළුම, II වැනි වෙළුම සහ III වැනි වෙළුම) අනුකූලව සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත.

2.1.1 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා හැරුණු කොට අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වත්කම් හා වගකීම්වල සාපේක්ෂ ද්‍රවශීලීත්වය නිරූපණය කරන පරිදි ඒවා කාණ්ඩ කර ඇත.

2.1.2 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම වැඩිදියුණු කිරීම පිණිස සහ කාලපරිච්ඡේද අතර තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම අගයන් සඳහා කලින් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළත් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. පසු ගිය වර්ෂය (2021) සඳහා අයවැය වෙන්කිරීම් එක් ශීර්ෂයක් යටතේ සිදු කර ඇති බැවින් සහ සමාලෝචිත වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමත් සමඟ කිසිදු ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්කම් හෝ වර්ගීකරණ සිදු වී නොමැත. තව ද, විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS II අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත.

2.1.3 අඛණ්ඩ ක්‍රියාකාරීත්වය

පූර්වේක්ෂණය කළ හැකි අනාගතය සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ ක්‍රියාකාරීත්වයකින් පවතින උපකල්පනය මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක සභාව නොදනී.

2.1.4 ගනුදෙනු කරන ව්‍යවහාර මුදල

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

2.1.5 ඇස්තමේන්තු සහ නීණ්ඩු භාවිතා කිරීම

අදාළ පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරීත්වය මගින් ප්‍රතිපත්ති යොදා ගැනීමට සහ වත්කම් හා වගකීම්වලට, ආදායම හා වියදමට වාර්තා කළ අගයන්ට බලපාන නීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන ඇති කර

ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු හා ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් හා පවතින තත්ත්වයන් යටතේ යුක්තිසහගත බවට විශ්වාස කරන විවිධ වෙනත් සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ උපකල්පන කෙරී ගෙන යන පදනම් මත සමාලෝචනය කරනු ලැබේ.

2.2. වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

2.2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත ක්ෂයවීම සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගනනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති ප්‍රත්‍යාගනනය කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් ඍජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අයිතිය ඇති ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අතර ඒ අනුව ආයෝජන දේපළ අර්ථකථනයට ඇතුළත් නොවේ. භාවිතා කරනු ලබන ගොඩනැගිලි සහ ඉදිකිරීම් පසු කාලීන වැඩිදියුණු කිරීම් එකතු කිරීම, සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මඟින් ඉදිකිරීම් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය වැඩි කරන හෝ ඉක්මවා යන ගොඩනැගිලි සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන විශාල නවීකරණය කිරීම් සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ පසු කාලීන පිරිවැය, පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

(ආ) ක්ෂයවීම

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ:

වත්කම	ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය
ගොඩනැගිලි	20
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10

උපකරණ හා යන්ත්‍රෝපකරණ	10
කාර්යාල උපකරණ	05
මෝටර් වාහන	05
පුස්තකාල පොත් සහ වාරසඟරා	05
විද්‍යාගාර, ශික්ෂණ උපකරණ	05
ලෝගු	05
පරිගණක උපකරණ/ මෙවලම්**	05
ජෙනරේටර සහ විදුලි සැපයුම් පද්ධති **	10
ජලාපවහන සහ මළාපවහන පද්ධති **	10
ක්‍රීඩා මෙවලම්/ අවශ්‍ය කරන දෑ**	04

වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථිර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ අංක 09/2022 කොමිෂන් සභා චක්‍රලේඛය අනුව 2022.05.10 වැනි දිනයෙන් පසුව අත්කර ගත් වත්කම් 2022.05.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂය කරන ලදී.

(ඇ) **පසු කාලීන වියදම්**

පසු කාලීන වියදම මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විශ්වවිද්‍යාලයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

(ඈ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගීම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(ඉ) ප්‍රදානය කළ වත්කම්

දේපළ පිරියත සහ උපකරණ ව්‍යාපෘතියක කොටසක් ලෙස සීමිත අරමුදල් හෝ විදේශ අරමුදල් සම්පාදක ව්‍යාපෘති හරහා මිල දී ගන්නා විට ව්‍යාපෘතිය අවසන් කරන තෙක් හෝ ව්‍යාපෘතිය අවසානයේ දී වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් දායකයාට ආපසු ලබා දෙන්නේ නම්, වත්කමේ පිරිවැය දේපළ පිරියත සහ උපකරණවලට ඇතුළු නොකරයි.

2.2.2 අස්පර්ෂණීය වත්කම්

විශ්වවිද්‍යාලයේ අස්පර්ශණීය වත්කම්වලට පරිගණක මෘදුකාංගවල වටිනාකම ඇතුළත් වේ. අදාළ වත්කමේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් පමණක් අස්පර්ෂණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර අස්පර්ෂණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ. අස්පර්ෂණීය වත්කම්වල ප්‍රධාන පන්තිවල ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

වත්කම	ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය
මෘදුකාංගය - අභ්‍යන්තරව ගොඩනඟන ලද	වර්ෂ 5
මෘදුකාංගය - බාහිරින් අත්කර ගත්	වර්ෂ 5
මෘදුකාංගය - බලපත්‍ර අත්කර ගත්	වර්ෂ 5
මානව ප්‍රාග්ධන සංවර්ධනය	වර්ෂ 5

අත්කර ගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර අදාළ මෘදුකාංගය අත්කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනීයකරනු ලැබේ. බාහිරින් මිල දී ගත් මෘදුකාංග හෝ මෘදුකාංග බලපත්‍ර එක් ඒකකයක් සඳහා රු. 20,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම් ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. SLPSAS 20 යටතේ හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ කරන්නේ නම් පමණක් විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා ගොඩනඟන ලද මෘදුකාංගයක් ආශ්‍රිත සෘජුව දරන ලද පිරිවැය අස්පර්ෂණීය වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අභ්‍යන්තරව ගොඩනඟන ලද මෘදුකාංගවලට රු. 250,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම්, ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන මත දරන ලද වියදම් වර්ෂය තුළ සිදු කළ වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

2.2.3 ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ.

ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

2.2.4 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

විශ්වවිද්‍යාලයේ නඩත්තුව සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කරන, ගබඩාවල තබා ඇති ලිපි ලේඛන අයිතම, සැපයුම් සහ වෙනත් ද්‍රව්‍යවල වටිනාකම බඩු වට්ටෝරුවලට ඇතුළත් වේ. කිසිදු බඩු වට්ටෝරුවක් වගකීම් සඳහා ඇපකරයක් ලෙස සලකනු නොලැබේ. භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ. භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

2.2.5 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වේ.

වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

2.2.6 විවිධ ණයකරුවෝ

"ණය" යන්නෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් හැඳින්වේ. මෙම ණය නිකුත් කරනු ලබන්නේ ඇපයක් මතය. තව ද ණය ශේෂයන් සේවකයාගේ මාසික වැටුපෙන් අය කරනු ලැබේ. සේවකයා සේවය අතහැර යන අවස්ථාවක දී එවැනි මුදල් අගයන් සේවකයාගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සම්පූර්ණයෙන්ම ආපසු අය කර ගනු ලැබේ. එබැවින් බොල් ණය ආපසු අය කර ගැනීම සඳහා විධිවිධාන නොමැත.

2.2.7 කෙටි කාලීන ආයෝජන

මාස තුනක හෝ ඊට අඩු කාලයකින් කල් පිරෙන තැන්පතු නියෝජනය කරන සහ වටිනාකම වෙනස්වීම සම්බන්ධයෙන් වැදගත් නොවන අවදානමකට භාජනය වන කෙටි කාලීන ආයෝජන ලැබෙන පොළිය සහ පිරිවැය මත සලකා බලනු ලැබේ.

2.2.8 සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන

සමුච්චිත අතිරික්තය - පුනරාවර්තනයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ සහ වර්ෂය තුළ එකතු කළ පොදු සංචිතවල මාරු කළ ශේෂය ඇතුළත් වේ.

2.2.9 සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

සීමා කළ අරමුදල් සහ ප්‍රදාන පර්යේෂණ ප්‍රදාන සහ විශේෂිත කාර්යයන් සඳහා වෙන් කර ඇති ලැබූ වෙනත් ප්‍රදාන නිරූපණය කරයි.

2.2.10 සේවක ප්‍රතිලාභ

(i) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

සංශෝධිත පරිදි විශ්වවිද්‍යාල පනතේ 75 (1) වගන්තිය සහ අංක 19/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2023.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ගුරුවරුන් හැරුණු කොට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 60 වේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 වන තෙක් සේවය කළ හැකිය. ඉහත සේවා කාලය 2022 වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා සඳහා පදනමක් ලෙස සලකනු ලැබේ.

කෙසේවුව ද, ආණ්ඩුව මඟින් තීරණය කරන ලද පරිදි, 2021.12.31 වැනි දින වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුරුවරුන් හැරුණු කොට අනෙකුත් සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 62ක් විය.

විශ්වවිද්‍යාලය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ. අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම සිදු කර ඇත.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

2022.12.31 වැනි දිනට පාරිතෝෂික වෙන්කිරීම් පිළිබඳ ආයුගණක තක්සේරුවක් වෘත්තීය ආයුගණකයින් විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල (SLPSAS 19) නිර්දේශ කර ඇති "ව්‍යාපෘති ඒකක පිරිවැය ක්‍රමය" භාවිතා කරමින් තක්සේරු කිරීම නිමා කරන ලදී.

තක්සේරුවේදී භාවිතා කළ ප්‍රධාන ආයුගණක උපකල්පන පහත දැක්වෙන පරිදි වේ.

- කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත - අධ්‍යයන කාර්ය මණ්ඩලය: 1.00%, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: 1.00% වාර්ෂිකව වයස අවුරුදු 54 දක්වා සහ පසුව ශූන්‍ය
- සාමාන්‍ය විශ්‍රාමයාමේ වයස - අධ්‍යයන කාර්ය මණ්ඩලය: වසය අවුරුදු 65, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 60

(නිශ්චිත විශ්‍රාමයාමේ වයසට වැඩි වයසේ පසුවන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ඊළඟ උපන් දිනය එළැඹෙන දිනයේ දී විශ්‍රාම යාමට නියමිත බවට උපකල්පනය කරනු ලැබීය.)

- වට්ටම් අනුපාතය - 18.00% වාර්ෂිකව
- වැටුප් වැඩිවීමේ අනුපාත - මූලික වැටුප සහ දීමනා: අධ්‍යයන 16.00% වාර්ෂිකව අනධ්‍යයන14.00% වාර්ෂිකව (දත්තවල නිශ්චිතව දක්වා ඇති සෑම වර්ෂයකම මාසයේ දී වැටුප් වර්ධක නියමිත බවට උපකල්පනය කරනු ලැබේ)
- විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය - අඩ මසක වැටුප සහ දීමනා, අවමය වර්ෂ 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා

(ii) **නිර්මිත දායකත්ව සැලසුම්**

විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාලය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

2.2.11 ආදායම හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS II අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත.

හුවමාරු ගණුදෙනුවලින් ආදායම

ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට හුවමාරු ගනුදෙනුවලින් ආදායම හඳුනා ගනී. ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, නේවාසිකාගාර ගාස්තු සහ වෛද්‍ය ගාස්තු, දේපළවලින් ලැබෙන කුලිය, තොග අලෙවිය, ණය සහ අත්තිකාරම්වලින් ලැබෙන පොලිය, ආයෝජනවලින් ලැබෙන පොලිය ආදිය ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. තව ද පොළී ආදායම සහ කුළී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

හුවමාරු නොවන ගණුදෙනුවලින් ආදායම

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන වැනි හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබූ ආදායම ආදායම ලෙස හඳුනා ගනී. පාර්ලිමේන්තුව මඟින් මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත කරනු ලබන අවස්ථාවේ දී අරමුදල් හිමිකාරත්වය ස්ථාපිත කරනු ලැබේ. හඳුනාගත් ආදායම ප්‍රමාණයට වාර්තා කරන දිනයට පෙර නිල වශයෙන් අනුමත කළ වර්ෂය සඳහා වූ විසර්ජන (පරිපූරක ඇස්තමේන්තු) පනතේ අනුමත කළ මුදල් යෙදවීම් සඳහා සිදු කළ යම් සංශෝධන සහ වෙනත් අරමුදල් ගැලපීම් සැලකිල්ලට ගනු ලැබේ.

ඒවාට අමතරව උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සහ සංවර්ධනය වේගවත් කිරීම, අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම පහසු කිරීම සඳහා අවශ්‍ය අතිරේක යටිතලපහසුකම් සඳහා වූ ලෝක බැංකු ව්‍යාපෘතිය වැනි වෙනත් අරමුදල් නියෝජිතායතනවලින් ලැබෙන ප්‍රදාන ආදිය හුවමාරු නොවන ගණුදෙනු ලෙස හඳුනා ගෙන ඇති අතර ආදායම ලෙස හඳුනා ගනී.

පරිත්‍යාග සහ උපපාදන හුවමාරු නොවන ගණුදෙනු විෂයක් වන අතර ඒවා භාවිතා කිරීම පිළිබඳ සීමා තිබිය හැකිය. පරිත්‍යාග සම්බන්ධයෙන් වන විට ඒවා සම්බන්ධයෙන් කාර්යසාධනය ආශ්‍රිත කොන්දේසි ද තිබිය හැකිය. සියලුම අවස්ථාවල දී ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි, ආදායමේ ලැබීම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි සහ ලැබීම සිදු විය හැකි බවට සැලකිය හැකි අවස්ථාවල දී ආදායම හඳුනා ගනී. ශූන්‍ය හෝ නාමික ප්‍රතිශ්ඨාවක් වෙනුවෙන් භෞතික වත්කමක් අත්කර ගෙන ඇති අවස්ථාවක දී වත්කමේ පාලනය විශ්වවිද්‍යාලයට මාරු වූ විට වත්කමේ සාධාරණ වටිනාකම හඳුනා ගනී.

පසු කාලීන කාලපරිච්ඡේදවල දී වියදම් කරන වත්කම් අත්කර ගැනීමට උපයෝජනය කළ රජයේ ප්‍රදාන/ වෙනත් ප්‍රදාන (අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම යටතේ ලැබුනු ප්‍රදාන) විලම්භිත ආදායම (වියදම් නොකළ ප්‍රාග්ධනය) ලෙස හඳුනා ගනී. මුදල් හා මුදල් සමාන දෑ, අඩු වගකීම් (ලැබූ ප්‍රදාන සම්බන්ධ වගකීම් හැරුණු කොට) ඇතුළු වෙනත් වත්කම්වලින් නිරූපණය කරන රජයේ ප්‍රදාන වගකීම් ලෙස හඳුනා ගනී.

2.2.12 වියදම හඳුනා ගැනීම

වියදම්, දැරූ පිරිවැය සහ ආදායමේ නිශ්චිත අයිතමවල ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාව මත පදනම්ව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල හඳුනා ගනු ලැබේ. ව්‍යාපාර කටයුතු ඉටු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම තත්ත්වයකින් පවත්වා ගෙනයාමේ දී දැරූ සියලුම වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයේ කාර්යසාධනයේ ලක්ෂණ සාධාරණය ඉදිරිපත් කිරීමේ පදනම මත "වියදම් කටයුතු" ක්‍රමය යොදා ගෙන ඇත.

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත වගකීම් සලකා බලන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

2.2.13 වාර්තාකරණ දිනට පසුව සිදුවීම්

පත් කරන ලද කමිටුව මඟින් රු. 317,137/-ක වටිනාකම ඇති පුස්තකාල පොත් තොගයක් කල්පැන ඇති ලෙස හඳුනා ගෙන, ඉවත් කිරීමට නිර්දේශ කර ඇත. වාර්තාකරන දිනට පසු එන සියලුම වැදගත් සිදුවීම් සලකා බලන ලදුව අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශන සටහන්වලට නිසි ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත. තව ද, වාර්තාකරන දිනය වන විට මෙම පොත් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත.

2.2.14 ප්‍රාග්ධන වගකීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

අධ්‍යයන ගොඩනැගිල්ල සහ මහල් තුනක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ අවසාන බිල්පත ලැබී නොතිබීම සහ මේ වන තෙක් එම ගොඩනැගිලි භාවිතාවට ගැනීම සිදු කර නොමැතිවීම හේතුවෙන් ගොඩනැගිල්ල ඉදිකිරීම පිළිබඳ පිරිවැය 2022 වර්ෂය තුළ දී ප්‍රාග්ධනීකරණය කර නොමැත.
විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක් එම සේවයේ නිරතව සිටිය දී දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) සිය අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත නිවාඩු ප්‍රදානය කරන ලෙසට ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත. 2022.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

කථිකාචාර්යවරයෙක් අභියාචනාධිකරණය මඟින් ලබා දුන් තීණ්දුවකට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. ඔහු ප්‍රමාණවත් ලකුණු ලබා ගෙන නොමැති බවට සඳහන් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ 1997 දෙසැම්බර් 12 වැනි දිනැති අංක 723 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇති බඳවා ගැනීමේ පටිපාටියට අනුව තමාව ආශ්‍රිත මහාචාර්ය/ මහාචාර්ය තනතුරට උසස් කිරීම ප්‍රදානය නොකිරීම සම්බන්ධයෙන් කැළණිය විශ්වවිද්‍යාලය විසින් ගන්නා ලද තීරණයට එරෙහිව එකී කථිකාචාර්යවරයා අභියාචනය කිරීම මෙම මූලික නඩුකරයේ නඩු නිමිත්ත වේ. 2022.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

ඉහත සඳහන් කළ නඩුකරවලට අමතරව කථිකාචාර්යවරු තිදෙනෙක් විසින් තවත් නඩුකර හයක් විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයේ ගොනු කර ඇති අතර (එක් කථිකාචාර්යවරයෙක් දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩුවක් ගොනු කර ඇත) එවකට ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (GWAI) මඟින් පවත්වන ලද සහ කැළණිය විශ්වවිද්‍යාලය මඟින් ප්‍රදානය කරන ලද කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය සුදුසුකම් මත පදනම්ව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර සඳහා ඔවුන්ගේ උසස්වීම් ප්‍රදානය කරන ලෙසටත් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලයේ සක්‍රීය සේවයේ නිරතව සිටින අතරතුර දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ සිය විශේෂඥ වෛද්‍ය උපාධි වැඩසටහන්වලට අඛණ්ඩව නියැලීමට ඉල්ලා ඇත. 2022.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

2.2.15 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

පාලක සභාවේ සාමාජිකයින් සහ ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී ඇතුළු ජ්‍යෙෂ්ඨ විධායක සමූහය විශ්වවිද්‍යාලයේ කටයුතු සැලසුම් කිරීම, විධානය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ අධිකාරිය සහ වගකීම දරයි. ඒ අනුව, පාලක සභාවේ සාමාජිකයින් සහ ජ්‍යෙෂ්ඨ විධායක නිළධරයින් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකරණ නිළධරයින් (KPM) ලෙස හඳුනා ගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින් ගන්නා කිසියම් තීරණයකට යුක්තිසහගතව බලපෑම් කළ හැකි කිසිදු වැදගත් ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනුවක් වර්ෂය තුළ දී සිදු වී නොමැත. සමාලෝචිත වර්ෂය තුළ දී පාලක සභාවේ සාමාජිකයින් සහ ජ්‍යෙෂ්ඨ විධායක නිළධරයින් සඳහා වැටුප් සහ දීමනා ලෙස රු. මිලියන 38ක් ගෙවා ඇත.

2.2.16 බදු අය කිරීම්

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය අනුව වි විශ්වවිද්‍යාලය බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	රු.	රු.
සටහන - 02		
මුදල් හා මුදල් සමාන දෑ	**2022**	**2021**
බැංකු ශේෂය		
ගිණුම් අංකය.333-1001-1-0000059	5,781,177	42,446,403
ගිණුම් අංකය 333-1002-0-0000059	1,840,622	5,043,237
ගිණුම් අංකය333- 1001-200-64705	4,426,481	11,900,213
	12,048,280	**59,389,852**
සටහන - 03		
විවිධ ණයකරුවෝ		
ශිෂ්‍යාධාර වාරික ලැබීම්-UGC	2,380,430	2,428,430
	2,380,430	**2,428,430**
සටහන - 04		
ණය සහ කාර්ය මණ්ඩලයට අත්තිකාරම්		
ආපදා ණය	18,824,764	17,210,247
කාර්ය මණ්ඩල ණය	100,470	83,640
වාහන ණය	690,440	666,136
පරිගණක ණය	507,000	522,000
විදේශ ආපදා ණය (මාස දෙකක්)	-	16,728
උත්සව අත්තිකාරම්	10,000	40,000
	20,132,674	**18,538,751**
සටහන - 05		
ගබඩා අත්තිකාරම්		
ගබඩා අත්තිකාරම් ගිණුම (භාණ්ඩ ලැයිස්තුව)	5,315,202	13,300,901
	5,315,202	**13,300,901**
සටහන - 06		
පූර්ව-ගෙවීම්		
ගෙවූ කුලිය	293,320	-
ගෙවූ රක්ෂණ වාරිකය	82,720	17,002
කොන්ත්‍රාත් සේවා	85,638	85,108
	461,678	**102,110**
සටහන - 07		
වෙනත්		
වෙනත්	138,500	138,500
තැන්පතු - ඉන්ධන	3,000	3,000
ආහාර	511,395	511,395
විදුලිය	43,768	43,768
ගෑස් සිලින්ඩර	276,000	276,000
ජල බෝතල සිලින්ඩර සඳහා	1,500	-
ඩයලොග් රූපවාහිනිය	18,000	18,000
සේවකයින් සඳහා වූ ඩයලොග්	-	1,725
ලැබිය යුතු ආපනශාලා ගාස්තු	1,000	1,500
ආයෝජනවලින් ලැබිය යුතු පොලිය	32,356,782	998,916
නේවාසිකාගාර ගාස්තු ලෙද ලැබිය යුතු දේ	299,000	70,520
වැටුප් අත්තිකාරම්	-	176,000
2021/2022 යෝග පිළිබඳ ඩිප්ලෝමාවෙන් ලැබිය යුතු දේ	5,149	18,649
2021 නක්ෂත්‍රය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලැබිය යුතු දේ	-	10,649
ආයුර්වේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවෙන් ලැබිය යුතු	-	14,649
නිල දුරකථන සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු	14,000	14,000
එකතුව	**33,668,094**	**2,297,269**

සටහන - 8 - දේපළ, පිරියත හා උපකරණ

පිරිවැය / ඇගයීම කිරීම

ඝින්නාක්කර වන්කම්

රු.

	ඉඩම	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ ලේඛුඋපකරණ	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	පුස්තකාල පොත් හා වාරසඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	ලේඛු	සවිකිරීම් සහ තිරවුරු	පරිගණක උපකරණ හා මෙවලම්	ක්‍රීඩා භාණ්ඩ	එකතුව
2022.01.01 දිනට ශේෂය	236,000,000	335,644,474	65,762,691	9,189,260	14,097,651	15,833,986	28,597,242	25,930,767	599,000	-	-	-	**731,655,072**
							-		-				-
එකතුව*1	-	48,906,270	17,216,611	12,646,560	42,471,227	655,890	1,510,635	6,457,862	456,000	1,640,965	7,200,817	797,350	**139,960,186**
පරිත්‍යාග*2							10,000,000						**10,000,000**
WIPවලින් මාරුකිරීම්													-
ගැලපීම්			-	-	-	-	(1,675,050)	-	-	-	-	-	**(1,675,050)**
ප්‍රත්‍යාගණන*3			-	-	-								-
													-
2022.12.31 දිනට ශේෂය	**236,000,000**	**384,550,744**	**82,979,302**	**21,835,820**	**56,568,878**	**16,489,876**	**38,432,827**	**32,388,629**	**1,055,000**	**1,640,965**	**7,200,817**	**797,350**	**879,940,207**

සමුච්චිත ක්ෂයවීම්

	ඉඩම	ගොඩනැගිලි	කාර්යාල උපකරණ	විද්‍යාගාර හා තාක්ෂණ ලේඛුඋපකරණ	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	පුස්තකාල පොත් හා වාර සඟරා	මෝටර් රථ	පිරියත හා යන්ත්‍රසූත්‍ර	ලේඛු	සවිකිරීම් සහ තිරවුරු	පරිගණක උපකරණ හා මෙවලම්	ක්‍රීඩා භාණ්ඩ	එකතුව
2021.01.01 දිනට ශේෂය	-	44,956,990	10,699,416	1,473,300	575,343	14,903,965	15,218,651	16,518,701	107,660				**104,454,025**
වර්ෂය සඳහා අයකිරීම්	-	17,566,512	15,179,933	2,022,298	2,593,902	301,467	5,663,976	2,720,879	120,050	39,155	114,025	16,234	**46,338,431**
ඉවත් කළ දෑ	-												-
ගැලපීම්						-							-
ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම් -එකතු කරන්න*4				-			(336,015)						**(336,015)**
ගැලපීම් (අඩු කළා JE)	-												-
ප්‍රත්‍යාගණනය සඳහා ඉවත් කිරීම්-අඩු කළා			-	-	-	-					-		-
2022.12.31 දිනට ශේෂය	-	**62,523,502**	**25,879,349**	**3,495,598**	**3,169,245**	**15,205,432**	**20,546,611**	**19,239,580**	**227,710**	**39,155**	**114,025**	**16,234**	**150,456,441**
2021.12.31 දිනට ඇරක අගය	236,000,000	290,687,484	55,063,275	7,715,960	13,522,308	930,022	13,378,591	9,412,066	491,340	-	-	-	627,201,046
2022.12.31 දිනට ඇරක අගය	**236,000,000**	**322,027,242**	**57,099,953**	**18,340,222**	**53,399,633**	**1,284,444**	**17,886,216**	**13,149,049**	**827,290**	**1,601,810**	**7,086,791**	**781,116**	**729,483,767**

සටහන්

1. තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2020 වර්ෂය තුළ දී (නව පරිපාලන ගොඩනැගිල්ල සහ අත්කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ ඇති ඉඩම් හැරුණු කොට) ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර අවශ්‍ය වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවලට සිදු කර ඇත. කාර්යාල උපකරණ, විද්‍යාගාර හා ශික්ෂණ උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් ආදියට සම්බන්ධ වෙනත් වත්කම් ප්‍රත්‍යාගණනය කර 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගලපා ඇත.

2. 2021.12.09 වැනි දින පවත්වන ලද පුස්තකාල කමිටු රැස්වීම මඟින් රු. 317,137.50ක් වූ පුස්තකාල පොත් තොගයක් (513) කල්පැන ගිය ඒවා ලෙස හඳුනා ගන්නා ලදී. 2022 පෙබරවාරි මස 03 වැනි දින පවත්වන ලද මූල්‍ය කමිටුවේ 6වැනි රැස්වීමේ දී මෙම කරුණ සමාලෝචනය කර නිර්දේශ ලබාදීම සඳහා ස්වාධීන කමිටුවක් පත් කරන ලදී. කෙසේවුව ද, වරේතා කරන දිනය තේකම මෙම කරුණ අවසන් කර නොමැති අතර මූල්‍ය ප්‍රකාශනවල කිසිදු විධිවිධානයක් දක්වා නොමැත. මෙම පොත් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත.

3. 2020 සැප්තැම්බර් මාසයේ දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මෝටර් රථයක් (WP KI 6080) ලැබුනු අතර 2022 පෙබරවාරි මස 24 වැනි දින රු. මිලියන 10ක තක්සේරු වාර්තාවක් ලැබීමෙන් පසුව 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත.

4. 2022 ඔක්තෝබර් මස 01 වැනි දින විශ්වවිද්‍යාලයට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස අංක 43-5982, NA 7543, 60-7068, LW 0703, 50-7755, 42-0508, KC 3400 සහ PB 7047 දරන වාහන ලැබුනු අතර හිමිකාරත්වය මාරු කිරීම සිදු වෙමින් පවතී. විශ්වවිද්‍යාලයට හිමිකාරත්වය ලැබුනු පසුව, මෝටර් රථ තක්සේරු කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට පියවර ගැනීමට නියමිත වේ.

	රු.	රු.
සටහන - 09	**2022**	**2021**
කෙරී ගෙන යන වැඩ		
අධ්‍යයන ගොඩනැගිල්ල	140,405,078	78,230,870
තෙමහල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ	13,199,278	-
නානකාමරසංකීර්ණය	4,154,232	-
ශිෂ්‍යයින් සඳහා නව ආපනශාලාව	587,000	-
බිත්ති අල්මාරි සවිකිරීම	785,230	-
	159,130,818	**78,230,870**
සටහන - 10		
අස්පර්ෂණීය වත්කම්		
ආරම්භයේ දී ශේෂය	157,283	243,323
වසර තුළ දී එකතු කිරීම්	1,646,634	-
අඩු කළා. වසර තුළ දී අය කිරීම	(254,284)	(86,040)
	1,549,633	**157,283**
සටහන - 11		
මානව ප්‍රාග්ධන සංවර්ධනය		
වර්ෂය ආරම්භයේ දී ශේෂය	170,500	236,500
වර්ෂය අතරතුර එකතු කිරීම්	120,000	-
අඩු කළා. වර්ෂය තුළ දී අය කිරීම්	(68,893)	(66,000)
	221,607	**170,500**
සටහන - 12		
සමුච්ඡිත වියදම්		
විදුලි බලය	880,951	125,000
ජලය	199,055	125,000
දූරකථන	575,991	810,500
වෙනත් පුනරාවර්තන	11,730	202,000
බාහිර කථිකාචාර්ය ගාස්තු	38,137	-
ඉන්ධන	141,848	155,000
ප්‍රවාහනය		5,000
අතිකාල	689,960	268,000
විභාග ගාස්තු	584,347	2,200,000
නඩත්තු වියදම් - වාහන	1,879,975	485,600
සුරැකුම්පත්	1,695,098	1,934,700
පුවත්පත්	-	25,000
නඩත්තු පිරියත හා යන්ත්‍රෝපකරණ	109,362	5,000
පිරිසිදු කිරීමේ සේවා	1,191,318	894,000
අනුපාත සහ බදු	-	530,000
කුලිය	1,360,989	-
වැටුප්	14,635,391	330,000
වෙනත් සේවා		7,000
මුද්‍රණ ගාස්තු	513,774	-
නිවාඩු ගෙවීම්	2,588	-
විශේෂ සේවාවන්	162,536	35,000
වාර ප්‍රවේශපත්‍ර	-	-
සංග්‍රහ වියදම්	-	15,000
E.T.F. අරමුදල	235,561	4,000
වැඩමුළුව	11,786	-
එකතුව	**24,920,397**	**8,155,800**

		රු. 2022	රු. 2021
සටහන - 13			
කළඹ යුතු ගෙවීම්			
සැපයුම් කරුවන්		-	1,972,633
සීමාසහිත ජෝන් කීල්ස් කාර්යාලය (පුද්) සමාගම		3,675,000	-
G M N ජයසූරිය		2,250	-
සීමාසහිත මයික්‍රොටෙක් බයොලෝජිකල් (පුද්) සමාගම		1,203,391	-
ජයසිංහ සැපයුම්කරුවෝ		2,235,000	-
සීමාසහිත ඇවෝන් ෆාමාකෙම් (පුද්) සමාගම		8,513,061	-
සිරිලූක්හාඩ්වෙයාර් ස්ටෝර්ස්		112,000	-
මාර්බෝ ට්‍රේඩින් සමාගම		12,990	
දයානි ට්‍රේඩින්		342,250	-
නිසිකෝ හෝල්ඩින්ග්ස්		81,367	
රාජා එන්ටර්ප්‍රයිසස්		1,628,350	-
සේරු එන්ටර්ප්‍රයිසස්		270,400	-
අයිස් ටෙක්නොලොජීස් (පුද්) සමාගම		220,000	-
ස්වර්ණ කැලුම්		112,275	-
ටෙක්නෝ ෆර්ම්ස් (පුද්) සමාගම		80,100	-
පුබුදු ටිම්බර්		91,833	
රමින්දි එන්ටර්ප්‍රයිසස්		202,308	-
		18,782,575	**1,972,633**
සටහන - 14			
ආපසු ගෙවිය යුතු තැන්පතු සහ වෙනත්			
ආපසු ගෙවිය යුතු තැන්පතු			
ආපසු ගෙවිය යුතු තැන්පතු		657,623	657,623
නොගෙවූ වවුචර		-	72,220
වෙනත්			
ඉදිකිරීම්/ සැපයුම් සඳහා රඳවාගැනීම්		9,740,981	6,682,558
යෝග VI ඩිප්ලෝමාව		-	267
යෝග VII ඩිප්ලෝමාව		587,905	598,858
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව XXVII		-	52
විද්‍යාපති 2013/2014		49,780	50,000
විද්‍යාපති 11 කොටස 2013/2014		29,780	30,000
විද්‍යාපති පංචකර්ම 2013/2014		97,000	100,000
විද්‍යාපති කායවිකිත්සාව 2013/2014		100,000	100,000
පංචකර්ම ඩිප්ලෝමාව - 2015		53,445	100,000
පංචකර්ම ඩිප්ලෝමාව - 2016/2017		786,818	1,639,424
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2016/2017		73,000	100,000
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2015	*	110,000	100,000
ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව 2016/2017		1,294,214	1,335,064
ශල්‍යතන්ත්‍රය ඩිප්ලෝමාව -03		1,753,023	3,047,598
යෝග සහතිකපත්‍ර පාඨමාලාව -28		-	51
යෝග සහතිකපත්‍ර පාඨමාලාව -29		-	60
යෝග සහතිකපත්‍ර පාඨමාලාව -30		49,000	44,000
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2017/2018		243,207	421,057
කායවිකිත්සාව ඩිප්ලෝමාව - 2018/2019		1,479,299	1,708,957
පංචකර්මය ඩිප්ලෝමාව - 2017/2018		1,233,748	1,160,148
පංචකර්මය ඩිප්ලෝමාව - 2018/2019		1,135,362	1,111,362
එම්. ඒ. ඒ. අයි. පිළිබඳ ඩිප්ලෝමාව - 2018/2019		1,867,965	3,913,578
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම		1,217,156	1,439,156
මුද්දර ගාස්තු		21,525	19,250
පරිපාලන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති		-	296,000
පරිපාලන කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022		-	108,853
යෝග විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2021/2022		80,051	84,851
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව-ශිෂ්‍ය කණ්ඩායම 1		50,000	3,351
ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාව 2021/2022		27,351	27,351

	රු.	රු.
	2022'	**2021**
කායවිකිත්සාව පිළිබඳ විද්‍යාපති 2021/2022	5,717,014	67,721
පංචකර්ම පිළිබඳ විද්‍යාපති 2021/2022	-	29,501
ශල්‍යකර්ම පිළිබඳ විද්‍යාපති 2021/2022	71,501	221,501
කායවිකිත්සාව පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022	1,602,148	8,041
පංචකර්ම පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022	-	2,041
ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව 2021/2022	688,283	59,351
කළමනාකරණය පිළිබඳ විද්‍යාපති/කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2021/22	9,599,235	-
කළමනාකරණය පිළිබඳ විද්‍යාපති/කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව2021/22	9,900,667	-
යෝග පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව-ශිෂ්‍ය කණ්ඩායම 11	770,500	-
කළමනාකරණය පිළිබඳ විද්‍යාපති-2023	701,000	-
කායවිකිත්සාව පිළිබඳ විද්‍යාපති 20-2023	96,000	-
කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව2023	98,000	-
කායවිකිත්සාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023	98,000	-
පංචකර්මය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023	95,000	-
ශල්‍යතන්ත්‍රය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව 2023	148,000	-
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව -2023	167,500	-
වෙනත් අයට ගෙවිය යුතු මුදල්	45,050	-
ගෙවිය යුතු ලියපදිංචි ගාස්තු	140,000	-
වැඩිපුර ලැබුනු විශේෂ අත්තිකාරම්	400	-
එකතුව	**52,676,534**	**25,341,870**

සටහන - 15

<u>විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්</u>

ආරම්භයේ දී ශේෂය	142,636,305	132,403,242
වසර සඳහා ගෙවීම	(22,972,838)	(15,858,210)
වසර සඳහා ගැලපීම	(9,297,663)	5,781,886
වසර සඳහා අය කිරීම	28,256,682	20,309,386
එකතුව	**138,622,486**	**142,636,305**

සටහන - 16

<u>සීමා කළ අරමුදල් සහ ප්‍රදාන</u>

NCAS පර්යේෂණ අරමුදල - වෛද්‍ය ඩබ්ලිව්. ඒ. එල්. වන්දසිරි	-	111,299
දර්ශනශූරි පර්යේෂණ - ආර්.එස්.සී.ජී.රාජපක්ෂ මිය	1,166,551	1,166,551
ජේ. පී. වික්‍රමාරච්චි පරිසංවාදය	1,214,142	1,214,142
සංවර්ධන ප්‍රථම උපාධි වැඩසටහන	114,450	114,450
පියසීලී වික්‍රමාරච්චි ජයසේකර	640,542	591,507
ත්‍යාග හා ප්‍රදාන	-	34,286,521
ක්‍රීඩා අරමුදල	228,148	314,540
පර්යේෂණ අරමුදල	3,774,491	3,482,761
උපකුලපති අරමුදල	1,594,517	858,101
එෆ්.ජී.එස්. සංවර්ධන ක්‍රියාකාරකම්	623,482	328,762
වික්‍රමාභිණී වැඩසටහන	17,740	83,640
ස්වර්ණමුදික වැඩසටහන	500,000	290,000
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල	10,000	10,000
වෛද්‍ය ලීලාරත්න අනුස්මරණ ශිෂ්‍යත්වය	134,674	119,622
ජී.පී. වික්‍රමාරච්චි අනුස්මරණ ශිෂ්‍යත්වය	82,261	77,185
වෛද්‍ය සිසිර වික්‍රමාරච්චි ශිෂ්‍යත්වය	229,612	232,468

	රු.	රු.
	2022'	**2021**
F.G.S. අරමුදල	485,741	69,139
සංවර්ධන අරමුදල (ශල්‍යාගාලක්‍රාය)	9,000	9,000
තොරතුරු තාක්ෂණය සංවර්ධනය	-	10,000,000
ස්වයං-මූල්‍යකරණ ක්‍රියාකාරකම්	11,378,189	10,752,239
බැඳුම්කරු උල්ලංඝනය කිරීම් ගිණුම්	400,000	-
ක්‍රීඩා ශූරතාවලිය -2022	1,347,165	-
අන්තර්ජාතික පර්යේෂණ පරිසංවාදය -2022	501,195	-
පාඨමාලා සංවර්ධන අරමුදල	177,428	-
පුස්තකාල සංවර්ධන අරමුදල	325,375	-
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල	2,306,233	-
කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	210,337	-
පර්යේෂණ කවුන්සිල අරමුදල	604,826	-
B.O.S.රැස්වීම	144,000	-
F.G.S.රැස්වීම	108,000	-
ඉඩම් හා ගොඩනැගිලි අරමුදල - FGS	846,052	-
	29,174,152	**64,113,947**

සටහන - 17

<u>ප්‍රත්‍යාගනන සංචිතය සහ වෙනත්</u>

ස්ථාවර වත්කම්	196,103,517	196,103,517
මෝටර් වාහන ප්‍රත්‍යාගනන සංචිතය	24,832,651	24,832,651
ගෘහභාණ්ඩ, උපකරණ ආදිය ප්‍රත්‍යාගණනය	9,614,184	9,614,184
	230,550,352	**230,550,352**

සටහන - 18

<u>විවිධ ලැබීම්</u>

විවිධ ආදායම්	1,115,571	8,833,405
ලියාපදිංචි ශාස්තුව (සැපයුම්කරුවන්)	168,500	207,000
එකතුව	**1,284,071**	**9,040,405**

සටහන - 19

<u>දේපළ කුලිය</u>

ආපනශාලාවලින් කුලිය	9,750	10,000
දේපළවලින් කුලිය	591,780	176,257
එකතුව	**601,530**	**186,257**

සටහන - 20

<u>ශිෂ්‍යාධාර සහ මහලොළු</u>

ශිෂ්‍යාධාරවලින් ලැබීම්	17,356,430	7,652,430
ශිෂ්‍යාධාර ගෙවීම්	(17,356,430)	(7,652,430)
ශුද්ධ	-	-

*** සටහන**

මහපොළ භාරකාර අරමුදල මගින් 2022 වර්ෂය තුළ දී මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් එක් එක් ශිෂ්‍යයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කරන ලදී.

අයවැය ප්‍රකාශනය සහ තථ්‍ය සැසඳීම - 2022

	2022 අයවැය රු.	අතිරේක වෙන්කිරීම් මාරු කිරීම් රු.	මුළු සංශෝධිත අයවැය රු.	2022 තථ්‍ය රු.
මෙහෙයුම් ආදායම				
පුනරාවර්තන ප්‍රදාන	660,000,000	-	625,000,000	570,000,000
අන්තර් විශ්වවිද්‍යාල ශූරතාව				2,500,000
	660,000,000		**625,000,000**	**572,500,000**
වෙනත් ආදායම				
(1) ණය හා අත්තිකාරම්වලින් පොලිය	1,200,000		1,200,000	834,737
(2) විවිධ ලැබීම්	1,165,000		1,165,000	1,284,071
(3) ආයෝජනවලින් පොලිය	17,400,000		17,400,000	53,953,443
(4) ලියාපදිංචි ගාස්තු	1,250,000		1,250,000	1,508,440
(5) විභාග ගාස්තු	110,000		110,000	109,400
(6) පුස්තකාල දඩ	45,000		45,000	37,151
(7) වෛද්‍ය ගාස්තු	120,000		120,000	-
(8) දේපලවලින් කුලිය	60,000		60,000	601,530
(9) පැරණි තොග අලෙවිය				85,575
(10) මහපොළ ශිෂ්‍යාධාර				17,356,430
(11) ස්වයං-මූල්‍ය වැඩසටහන්	13,500,000		13,500,000	31,925,982
එකතුව	**34,850,000**		**34,850,000**	**107,696,759**
මෙහෙයුම් වියදම්				
(1) පුද්ගලික පඩිනඩි	540,000,000		530,000,000	496,464,241
(2) ගමන් වියදම්	1,900,000		950,000	209,058
(3) සැපයුම් හා භාවිතා කළ පරිභෝජන භාණ්ඩ	11,650,000		12,678,000	24,361,851
(4) නඩත්තු	8,950,000		8,800,000	13,414,386
(5) කොන්ත්‍රාත් සේවා	78,900,000		73,213,000	67,983,805
(1) උත්පාදිත අරමුදල් වියදම්				7,651,671
(2) වෙනත් මෙහෙයුම් වියදම්	39,950,000		20,709,000	15,569,768
(8) මහපොළ ශිෂ්‍යාධාර				17,356,430
(9) ස්වයං-මූල්‍ය වැඩසටහන්	13,500,000		13,500,000	26,098,727
	694,850,000	-	**659,850,000**	**669,109,937**
ක්ෂයවීම් සහ වියදම් ක්‍රමක්ෂය				**46,661,608**
එකතුව				**715,771,545**
ප්‍රාග්ධන වියදම්				
පුනරුත්ථාපන හා ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම	94,000,000		45,000,000	48,906,270
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම	38,900,000		30,000,000	101,053,916
ඉදිකිරීම් ව්‍යාපෘති - අඛණ්ඩ (වෙනත්)				
ඉදිකිරීම් ව්‍යාපෘති - නව				
පර්යේෂණ හා සංවර්ධනය	9,300,000			
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය	7,800,000			120,000
	150,000,000		**75,000,000**	**150,080,186**

සටහන්

1.අයවැය කෘත්‍ය වර්ගීකරණය අනුව මුදල් පදනම මත අනුමත කර ඇත. අනුමත කළ අයවැය මඟින් 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලපරිච්ඡේදය ආවරණය කරයි

2.අයවැය සහ ගිණුම්කරණ පදනම් වෙනස් වේ. ආණ්ඩුවේ සියලුම කාර්යයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ සමුච්චිත පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල ඇතුළත් වියදම් ස්වභාවය මත පදනම්ව වේ. මූල්‍ය ප්‍රකාශන 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා සකස් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන මූල්‍ය පදනම මත අනුමත කර ඇති අයවැයට වඩා වෙනස් වේ.

21. තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූල වීම 2022/2023



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීම 2022/2023

ප්‍රගති වාර්තාව

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM)

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM), "ලෝකයේ තිරසාර සංවර්ධනය සඳහා නවීන විද්‍යා සමඟ දේශීය දැනුම් පද්ධති සම්මිශ්‍රණය කිරීම හරහා අධ්‍යාපනය, පර්යේෂණය සහ නවීනත්වයේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම" යන දැක්ම ඇතිව කටයුතු කරනු ලබන අද්විතීය නව රාජ්‍ය විශ්වවිද්‍යාලයකි. 2021 වර්ෂයේ ස්ථාපිත කළ විශ්වවිද්‍යාලය එහි ප්‍රාරම්භක ආයතනය වන 1929 වර්ෂයේ දී ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරචච් මැතිතුමා විසින් ආරම්භ කළ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලය දක්වා දිවෙන පොහොසත් අතීතයකට උරුමකම් කියයි. කෙසේවුව ද, විශ්වවිද්‍යාල මට්ටමට උසස් කරනු ලැබීමෙන් පසුව දේශීය වෛද්‍ය ක්‍රමයේ සිද්ධියුර්වේද සම්ප්‍රදාය සුරක්ෂිත කරන සහ ප්‍රවර්ධනය කරන අතරතුර ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යාපනය සහ පර්යේෂණය සඳහා ද අවතීර්ණ වී ඇත.

ඒ අනුව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා පීඨය (FIM), දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය (FIHST), සහ දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය (FSSMS) යන පීඨ තුන හරහා විවිධ ප්‍රථම උපාධි වැඩසටහන් මාලාවක් පිරිනමනු ලබයි. තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ වැඩසටහන්වල සිට සහ කෘෂිකර්මය සහ යෝග හා පරාමනෝවිද්‍යාව වැඩසටහන් දක්වා විශ්වවිද්‍යාලය මඟින් ශිෂ්‍යයින් සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය පිලිබඳ ඉතා විස්තීරණ අධ්‍යාපනයක් පිරිනමනු ලබයි. මෙම ප්‍රථම උපාධි වැඩසටහන්වලට අමතරව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් ශිෂ්‍යයින්ගේ විවිධ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි විද්‍යාපති උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ව්‍යාජ්ති පාඨමාලා ආදිය ද පිරිනමනු ලබයි.

විශ්වවිද්‍යාලය පහත සඳහන් කර ඇති පරිදි තිරසාර සංවර්ධන පරමාර්ථවලට අනුකූලව 2021-2025 දක්වා කාලය සඳහා ඉලක්ක 06ක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මෙම විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලසුම ද සකස් කර ඇත.

01 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම

02 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හරහා ඒ පිළිබඳ රාජ්‍ය උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම

03 වැනි ඉලක්කය - දේශීය වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක පර්යේෂණ සහ නවෝත්පාදනය හරහා ශාස්ත්‍රීය විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීම

04 වැනි ඉලක්කය - ඉහළ ගුණාත්මක, කාර්යක්ෂම මානව ප්‍රාග්ධනය සමඟ විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම

05 වැනි ඉලක්කය - ශක්තිජනක නිපුණතා උපාධිධාරියෙකු බිහි කිරීම

06 වැනි ඉලක්කය - කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණ සංස්කෘතියක් අත්කර ගැනීම පිණිස ආරක්ෂිත සහ ස්ථාවර පද්ධති හරහා විශ්වවිද්‍යාලයේ පාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම

2022 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම පිණිස 2021 වර්ෂයේ යෝජනා කරන ලද ක්‍රියාකාරකම් සහ මූලාරම්භයන් පවත්වා ගෙන යාමට අඛණ්ඩව කටයුතු කරන ලදී:

1. විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්ක 4 සහ තිරසාර සංවර්ධන ඉලක්ක 9, අනුව කටයුතු කරමින් එහි අනාගත ප්‍රගතිය සහ උපායමාර්ග සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කරන ලද අතර ඒ අනුව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ විෂයපථය දේශීය වෛද්‍ය අධ්‍යාපනය ඉක්මවා සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව සහ කළමනාකරණය වැනි විවිධ ක්ෂේත්‍ර ඇතුළත් කර ගැනීමෙන් පුළුල් කිරීමට සැලසුම් කරන ලද අතර එහි ප්‍රථිඵලයක් ලෙස කාලය හරහා ආශ්‍රිත වැඩසටහන්වල ශික්ෂණයේ සහ පරීක්ෂණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.
2. ඒ අනුව 2021/2022 ශිෂ්‍ය බඳවා ගැනීමේ කොටසක් ලෙස නවක ශිෂ්‍ය කණ්ඩායම් සිය භෞතික අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති අතර මෙම ශිෂ්‍යයින් විෂයමාලා ආශ්‍රිත සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරතව සිටිති.

   මෙම ක්‍රියාකාරකම් අතුරින් තිරසාර සංවර්ධන ඉලක්කවලට සෘජුවම සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර එක් එක් පීඨය යටතේ ඉදිරිපත් කර ඇත.
3. තිරසාර සංවර්ධන ඉලක්ක 5 සහ තිරසාර සංවර්ධන ඉලක්ක 10 අනුව විශ්වවිද්‍යාලය එහි කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් අතර ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව පවත්වා ගැනීම ඇතුළු ස්ත්‍රී-පුරුෂභාවය ආශ්‍රිත කරුණු පිළිබඳව අඛණ්ඩ සමීප අවධානයක් යොමු කරයි. මෙම ඉලක්කය හා සමානව, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා වූ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද අතර ආයතනය තුළ (ශ්‍රමිකයින් සහ ශිෂ්‍යයින් අතර) සියලුම කාන්තාවන්ගේ සහ පුරුෂයින්ගේ අනන්‍යතා වෙනස්කම් නොසලකා සමාන අවස්ථාවන් සඳහා ඇති ප්‍රවේශය සහ සමාන අවස්ථා ලබා ගැනීමට ඇති හැකියාව සුරකින හිතකර සේවා පරිසරයක් සහ අධ්‍යයන පරිසරයක් සහතික කිරීමට කටයුතු කරයි.
4. තව ද තිරසාර සංවර්ධන ඉලක්ක 10 සහ තිරසාර සංවර්ධන ඉලක්ක 16 සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීමේ දී විශ්වවිද්‍යාලය තුළ සමාජ සංහිඳියා මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලද අතර එමඟින් උසස් අධ්‍යාපනය සඳහා සමාන අවස්ථා සැලසීමටත් කිසිදු ස්ත්‍රී-පුරුෂභාවය, වාර්ගික, ආගමික, හෝ කුල භේදයක් නොමැතිව එහි ප්‍රථිලාභ නෙළා ගැනීමටත් උත්සාහ කරනු ලබයි.
5. පරිසරයට කසළ මුදා හැරීමෙන් සිදු වන අහිතකර ඵලවිපාක අවම කිරීම පිණිස; සහ තිරසාර සංවර්ධන ඉලක්ක 13 සහ තිරසාර සංවර්ධන ඉලක්ක 12 කෙරහි පුළුල් වශයෙන් කටයුතු කිරීම පිණිස විශ්වවිද්‍යාලය කාබනික පෙහොර නිෂ්පාදනය කිරීම සඳහා එහි කසළ එකතු කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතර එම කාබනික පොහොර ආයතනයේ වගාවන් සඳහා යෙදීමටත් එමඟින් විශ්වවිද්‍යාලය තුළ පාරිසරික වශයෙන් හිතකර තත්ත්වයක් නිර්මාණය කිරීමටත් විශාල වශයෙන් දායක වෙයි.
6. "ඉගෙනුම අතර වැඩ කිරීම" (Work while Learning) සංකල්පය ක්‍රියාත්මක කිරීමේ දී විශ්වවිද්‍යාලය මඟින් වැඩපිළිවෙල කිහිපයක්ම යොදා ඇති අතර අපගේ ශිෂ්‍යයින්ට පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට ඉඩදීම සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමට එම ආයතන සමඟ සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත. මෙය තිරසාර සංවර්ධන ඉලක්ක 4 සපුරා ගැනීම සඳහා මාර්ගයක් වනු ඇත.
7. තිරසාර සංවර්ධන ඉලක්ක 4 අනුව සහ රැකියා සඳහා නිපුණතාව ඇති උපාධිධාරීන් බිහි කිරීමේ සහ ශිෂ්‍යයින්ගේ අධ්‍යයන ක්ෂේත්‍රය කුමක් වුවත් ඔවුන්ගේ ප්‍රධාන විෂයමාලාව තුළින් ඔවුන්ට 21වැනි

සියවසේ කළමනාකරණය සහ මානව සම්පත් කුසලතාවලින් පොහොසත් කරවීමේ විශ්වවිද්‍යාලයේ මෙහෙවරේ කොටසක් ලෙස ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය එහි සියලුම අභ්‍යන්තර ශිෂ්‍යයින් සඳහා කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාව කළමනාකරණ අධ්‍යයන අධ්‍යයන අංශය මඟින් පිරිනමනු ලබන අතර උපාධි පාඨමාලා තුනට ඇතුළත් සියලුම ශිෂ්‍යයින් මෙම වැඩසටහනේ අධ්‍යයන කටයුතුවල නිරත වෙයි.

8. 2021 මැයි මස 28 වැනි දින ආරම්භ කරන ලද "විකුම් උයන" ඇවිදීමේ මංතීරු ව්‍යාපෘතියට ඔසු උයනක්, ගිමන් ප්‍රදේශයක් සහ වාහන ධාවන කළ හැකි අලෙවි ප්‍රදේශයක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය තිරසාර සංවර්ධන ඉලක්ක 13, 3 සහ 11 අනුකූලව මෙම ව්‍යාපෘතිය සාමාජීය ව්‍යාපෘතියක් ලෙස කළමනාකරණය කිරීමට අපේක්ෂා කරයි.

9. දේශීය වෛද්‍ය විද්‍යා පීඨය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත:

   i. දේශීය වෛද්‍ය ක්‍රමය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දේශීය වෛද්‍ය ක්‍රමය සඳහා වූ ස්ථාවර කමිටුව මඟින් අනුමත කළ විෂය මිණුම් ලකුණු ප්‍රකාශනයේ දක්වන ලද අවශ්‍යතාවන් සපුරාලීම පිණිස BAMS විෂයමාලාව ඉතා සූක්ෂ්මව සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. තව ද, පවතින විෂයමාලා වර්ධනය කිරීම පිණිස නව පාඨමාලා කිහිපයක්ම හඳුන්වා දෙන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

   ii. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් ඉලක්ක කර ගනිමින්, ඔවුන්ගේ ව්‍යක්තීය රචනා කුසලතා වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, සන්නිවේදන කුසලතා ශක්තිමත් කිරීම පිණිස භාෂා කුසලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන 01 දියත් කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 8)

   iii. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ භාෂා නිපුණතාව වැඩිදියුණු කිරීම මඟින් ඔවුන්ට ප්‍රතිලාභ සලසනු වස් භාෂා කුසලතා වැඩසටහන 2 ලෙස තවත් වැඩසටහනක් පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

   iv. අ.පොෂ.ස. උසස් පෙළ පරීක්ෂණයේ හින්දි ප්‍රශ්නපත්‍රය සඳහා ඵලදායීව සූදානම් වීමට උපකාර වනු පිණිස භාෂා අධ්‍යයන අංශය මඟින් අ.පොෂ.ස. උසස් පෙළ ශිෂ්‍යයින් සඳහා හින්දි භාෂා සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

   v. BAMS උපාධි අපේක්ෂකයින් අතර භාෂා කුසලතා පෝෂණය කිරීම පිණිස භාෂා සංවිධානයක් ස්ථාපිත කරන ලදී.

   vi. භාෂා අධ්‍යයන අංශය මඟින් "ජීවන යාත්‍රා," නමින් කාර්තුමය සඟරාවක් ආරම්භ කරන ලදී.

   vii. ශිෂ්‍ය පර්යේෂණ චක්‍රය (SRCFIM), පීඨ පර්යේෂණ කමිටුව සමඟ සහයෝගය ඇතිව, සමාන්තර ඡායාරූප සහ නවෝත්පාදන වැඩමුළු සමඟ, උපාධි අපේක්ෂක පර්යේෂණ කොලෝකියම (Colloquium - 2022 (URCFIM - 2022), සංවිධානය කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

   viii. පීඨ පර්යේෂණ කමිටුව පීඨ සාමාජිකයින්ගේ පර්යේෂණ ධාරිතාවන් පෝෂණය කරමින්, පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ විස්තීරණ වෙබිනාර් සම්මන්ත්‍රණ මාලාවක් ආරම්භ කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

   ix. BAMS උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික නිරාවරණය සහ කුසලතා වැඩිදියුණු කිරීම පිණිස එම ශිෂ්‍යයින් සඳහා විවිධ ක්ෂේත්‍ර චාරිකා, කාර්මික පුහුණු වැඩසටහන්, සායනික පුහුණු මූලාරම්භයන් සහ වැඩමුළු සංවිධානය කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

x. BAMS ශිෂ්‍යයින් සඳහා වැඩිදුර සායනික නිරාවරණය ලබා දෙමින්, බාහිර ආයුර්වේද රෝහල් සමඟ සහයෝගී සායනික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

xi. ශිෂ්‍යයින්ට ඖෂධ කර්මාන්තය පිළිබඳ දැනුමක් ලබා ගැනීම සහ ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම පිණිස නවීන ඖෂධ කර්මාන්ත පුහුණුවක් සංවිධානය කරන ලදී.

xii. කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය ජාතික ළමා සෞඛ්‍ය ව්‍යාපාරය සහ දැනුවත් කිරීමේ වැඩසටහන "මාතෘත්වයට සාකල්‍ය ප්‍රවේශයක්," සහ බාහිර ආයුර්වේද වෛද්‍ය සායනයක් ඇතුළු ළමයින්ගේ සහ ගර්භණී මව්වරුන්ගේ සුභසිද්ධිය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 3, 4)

xiii. පීඨ ශිෂ්‍ය සංගමය විචිත්‍රවත් විශ්වවිද්‍යාල ජීවිතයකට දායක වෙමින්, ක්‍රීඩා ශූරතාව, සංස්කෘතික උළෙල සහ ආගමික වැඩසටහන් ඇතුළු විවිධාකාර උත්සව සංවිධානය කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 3, 10)

xiv. FIM ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යයින් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද "සුව ධරණී - සුව දැක්ම දේශීය වෛද්‍ය ප්‍රදර්ශනය - 2023," ප්‍රදර්ශකයින් ලෙස සහභාගී විය. (තිරසාර සංවර්ධන ඉලක්ක 3, 4)

xv. ශිෂ්‍ය සංගමය මඟින් සංවිධානය කළ "වාර්ෂික ශ්‍රී පාද ආයුර්වේද සෞඛ්‍ය කඳවුර" මහජනතාවගේ සෞඛ්‍ය නංවාලීම පිණිස පීඨයේ කැපවීම ප්‍රදර්ශනය කරන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 3)

xvi. ශිෂ්‍යයින්, දෙමාපියන් සහ කාර්ය මණ්ඩලය අතර සාකල්‍ය සුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින්, පාසැල් ශිෂ්‍යයින් සඳහා "විකුම් ශික්ෂා" වැඩසටහනට පොත් ප්‍රදානය කිරීම, ඖෂධ පැළ බෙදාහැරීම, සහ ආයුර්වේද ප්‍රථමාධාර පෙට්ටි බෙදාහැරීම ඇතුළත් විය. (තිරසාර සංවර්ධන ඉලක්ක 3)

10. දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.:

i. ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/ සමානාත්මතාව සඳහා වූ මධ්‍යස්ථානය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවයමය ප්‍රචණ්ඩත්වය සහ නවක වදය වැළැක්වීම සඳහා වූ මධ්‍යස්ථානය මඟින් ඉටු කරන ක්‍රියාකාරකම්වලට සක්‍රීය ලෙස දායකවීම සහ අවධානයෙන් කැපවීම. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගරුත්වය, ප්‍රත්‍යස්ථිතිය, අවිහිංසාවාදය, සහ වෙනස්කම් සහ අසාධාරණතාවන් ඉවසීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීමේ පරමාර්ථය ඇතිව පීඨය තුළ “විවිධත්වය ඇතිව ජීවත්වීමට ඉගෙනගැනීම” පාඨමාලාව පවත්වන ලදී. (තිරසාර සංවර්ධන ඉලක්ක 5)

ii. දෙපාර්ශවයටම ප්‍රතිලාභ ලබා දීමට පහසුකම් සැලසීමට පියවර ගන්නා අතර ආයතනික සංස්කෘතියක් සහ පර්යේෂණ සහ සීමාවාසික අවස්ථා වර්ධනය කිරීම සඳහා හවුල්කාරිත්වයන්, සහයෝගිතා සහ අවබෝධතා ගිවිසුම් කිහිපයක් ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී. දේශීය ඖෂධ සම්පත් අධ්‍යයන අංශය නිෂ්පාදන සංවර්ධනය සහ වලංගු කිරීම සඳහා MAA Products Pvt Ltd සමඟත් ප්‍රදර්ශනය කිරීමේ අරමුණ සඳහා මිණුම් දණ්ඩක් සහිත ඖෂධ උද්‍යානයක් සංවර්ධනය කිරීම සහ මහජන හා කෘෂිකර්ම අංශයේ නිපුණතා සභාව සඳහා කෘෂි තාක්ෂණික ව්‍යාප්ති මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා Hemas Manufacturing Pvt. Ltd සමඟත් සහයෝගයෙන් කටයුතු කරයි. දේශීය සෞඛ්‍ය විද්‍යා

දෙපාර්තමේන්තුවට මොස්කව් රාජ්‍ය ක්‍රීඩා හා සංචාරක විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා සංචාරක හා සත්කාරක කළමනාකරණ ආයතනය සමඟ උසස් අධ්‍යාපනයේ හවුල්කාරිත්වය ඇත. ඒෙව වෛද්‍ය ක්ෂේත්‍රයේ සම්පත් බෙදාගැනීම, පර්යේෂණ සහයෝගීතාව සහ කර්මාන්තය තුළ අවස්ථා සඳහා තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් SQR රොබෝ විද්‍යාව සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතාවයකින් කටයුතු කරයි. (තිරසාර සංවර්ධන ඉලක්ක 4, 8)

iii. පරිසරය පිරිසිදු කිරීමේ ව්‍යාපෘති, ප්‍රදර්ශන සහ ජනහිතකාමී ප්‍රයත්නයන් වැනි විවිධ සමාජ මුලපිරීම් ක්‍රියාත්මක කිරීම තුළින් සිසුන්ට අත්‍යවශ්‍ය ජීවන සහ සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව සලසා දී ඇත. මෙම උත්සාහයන් තිරසාර සංවර්ධනයේ රාමුව තුළ උපාධිධාරියෙකුගේ සමාජ වගකීම් පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීමට ද දායක වේ. (තිරසාර සංවර්ධන ඉලක්ක 4, 3, 13)

iv. අන්තර්ක්‍රියාකාරී සුදු පුවරු, ස්මාර්ට් පුවරු, ලැප්ටොප් පරිගණක සහ අත්‍යවශ්‍ය රසායනාගාර උපකරණ ඇතුළුව වැඩි දියුණු කළ භෞතික සම්පත් සංස්ථාගත කිරීම තුළින් උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නංවා ඇත. දේශීය ඖෂධ සම්පත් අධ්‍යයන අංශය සිසුන්ට තම පර්යේෂණ කටයුතු ආරම්භ කළ හැකි අණුක ජීව විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාගාරවලින් මනාව සන්නද්ධ වේ. විවිධ පර්යේෂණ ආයතනවල සහ කාර්මික ක්ෂේත්‍රවල ක්ෂේත්‍ර අධ්‍යයනයන් ඔස්සේ සිසුන් සැබෑ ලෝකයේ යෙදුම්වලට නිරාවරණය කර ඇත. සෑම ශිෂ්‍යයෙක් සඳහාම සෑම අධ්‍යයන වර්ෂයක් අවසානයේම මාසයක කාර්මික පුහුණුවක් ද උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට දායක විය. තවද, ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය අවධාරණය කරමින් වඩා විවිධ මිශ්‍ර ඉගෙනුම් ක්‍රම අනුවර්තනය කරවීම මෙම දියුණුවට දායක වී ඇත. (තිරසාර සංවර්ධන ඉලක්ක 4)

11. දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහත දැක්වෙන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

i. ශිෂ්‍යයින් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම පිණිස, වේගයෙන් වෙනස්වන සමාජයේ, ජාතියේ සහ ලෝකයේ ඉල්ලීම් සපුරාලීම පිණිස, නව උපාධි වැඩසටහන් සමාලෝචනය කිරීම, උත්ශ්‍රේණිගත කිරීම මෙන්ම නිර්මාණය කිරීම සඳහා පීඨය කැපවී සිටී. අපි අධ්‍යාපනය යන්න විෂයමාලාවේ සිට අත්‍යවශ්‍ය වෘත්තීය සහ ජීවන කුසලතා දක්වා විහිදෙන ශිෂ්‍ය කේන්ද්‍රීය සාකල්‍ය අධ්‍යාපනයක් දක්වා කටයුතු කරන්නෙමු. අපි ‘අනාගත පරපුර සඳහා ගුණාත්මක අධ්‍යාපනයක’ අවශ්‍යතාව සපුරාලීම පිණිස මෛත්‍රීය, සහයෝගය, අවංකභාවය සහ සහභාගීත්වය වැනි සාරධර්ම ඉහළින් අගයන සහ ප්‍රවර්ධනය කරන ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා ධනාත්මක වැඩ සංස්කෘතියක් පීඨය තුළ ඇති කිරීමට අපේක්ෂා කරමු. අපි ශිෂ්‍යයින්ට සහ ගුරුවරුන්ට උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීමට හැකි වන පරිදි නවතම දැනුම පීඨයට සහ විශ්ව විද්‍යාලයට ගෙන ඒම සඳහා අපි විෂය මූලික වැඩමුළු සහ වෙබිනාර් පවත්වමු. තිරසාර සංවර්ධන ඉලක්ක (3) වෙත අපගේ අධ්‍යාපනික වැඩසටහන් පෙළගස්වමින්, යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අපගේ සිසුන්ට සෞඛ්‍ය ආරක්ෂණ කළමනාකරණ අධ්‍යාපනය පිරිනැමීමට කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව සූදානමින් සිටී.

ii. අවසාන සාරධර්මය අනුව අපි තිරසාර සංවර්ධන ඉලක්කවලට (10) අනුකූලව අසමානතා අවම කළ තත්ත්වයක් තුළ සහභාගීකර ගැනීමේ පරිසරයක් නිර්මාණය කර ගැනීම කෙරෙහි අපි කැපවී සිටිමු.

පීඨය ශ්‍රී ලාංකික ප්‍රජාව නියෝජනය කරන විවිධාකාර ජනකොට්ඨාසවලින් සැදුම්ලත් වේ. ඒ අනුව අපි වාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂභාවය හෝ භෞතික සීමා නිර්ණය කිරීම් නොසලකා සෑම පුද්ගලයෙක්ම කණ්ඩායමක් ලෙස වැඩ කිරීමට පිළිගනු ලබන සහ ආරාධනා කරනු ලබන සහයෝගී සහ විවෘත පරිසරයක් සහතික කර ඇත. අපි ශිෂ්‍යයින්ගේ සුභසිද්ධිය සුරක්ෂිත කිරීම පිණිස සහාය ක්‍රමයක් සහ පීඨය තුළ සහාය ක්‍රමයක් ඇති කිරීමට කැපවී සිටිමු. එසේ කිරීමේ දී අපි කාර්ය මණ්ඩලයට ශිෂ්‍යයින්ට ප්‍රවේශ විය හැකි බවට සහතික කරන අතර ශිෂ්‍යයින්ට සිය ශාස්ත්‍රීය සහ අධ්‍යාපනික නොවන කරුණු සම්බන්ධයෙන් අඛණ්ඩ උපදෙස් සහ මඟපෙන්වීම් ලැබිය හැකි උපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම අපි සිංහල සහ දෙමළ භාෂාවන් කථා කරන ශිෂ්‍යයින් අතර අසමානතාවන් අවම කිරීම පිණිස ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය සඳහා ද විශේෂයෙන් අවධාරණය කරමු.

iii. දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාරකත්වය සහ පරිසරය පිළිබඳ පොදු විඥානය සහ භාවිතයන් ඉහළ නැංවීම පිණිස. මෙහි කොටසක් ලෙස අපි නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇති තිරසාර ජංගම දුරකථන අංකය සඳහා වූ යෝජනාව ආරම්භ කර ඇත. අපි පීඨය තුළ පා පැදි පැදවීමේ සංස්කෘතියක් ආරම්භ කිරීමට යෝජනා කළ අතර තරඟයේ දී තෙවැනි ස්ථානය දිනා ගැනීමෙන් අනතුරුව තානාපති කාර්යාලය හරහා උපදේශන සේවා ලබා, මෙම යෝජනාවේ විශේෂයෙන් දක්වා ඇති වටිනාකම් සුරැකීමට උත්සාහ කරන්නෙමු.

දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාරභාවය සහ පරිසරය පිළිබඳ සාමාන්‍ය විඥානය සහ භාවිතයන් ඉහළ නැංවීමේ උත්සාහයක් ලෙස, අපි නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලය විසින් තිරසාර සංචලන ඇමතුමක් සඳහා යෝජනාවක් ආරම්භ කර ඇත. පීඨය තුළ පාපැදි සංස්කෘතියක් ඇති කිරීමට අපි යෝජනා කළ අතර තරගයේ තෙවැනි ස්ථානය ලබා තානාපති කාර්යාලය හරහා උපදේශන ලබා දීමෙන් පසුව මෙම යෝජනාවෙන් පෙන්වා දී ඇති වටිනාකම් ආරක්ෂා කිරීමට අපි උත්සාහ කරමු.

iv. පීඨය ලෝක පරිසර දිනය සමරනු වස් වාර්ෂික පෝස්ටර තරඟය සහ රුක් රෝපණ ව්‍යාපාරයක් වැනි අඛණ්ඩ වැඩසටහන් දියත් කිරීමට කැපවී සිටින අතර එවැනි ක්‍රියාදාම හරහා ශිෂ්‍යයින්ට පරිසරය ආරක්ෂා කිරීමේ සහ එහි තිරසාරකත්වය සුරැකීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමට හැකි වේ.

v. තිරසාර සංවර්ධන ඉලක්ක (8) ට සමගාමීව, රැකියා කළ හැකි උපාධිධාරීන් බිහි කිරීමට අවශ්‍ය මෘදු නිපුණතා ලබා දීම සඳහා පීඨය විෂ්තීය සංවර්ධන ඉසව් සංවිධානය කරන අතර තරුණ තරුණියන්ට රැකියා අවස්ථා සුරක්ෂිත කිරීමේදී පවතින අභියෝගවලට අප මුහුණ දෙන බව සහතික කෙරේ. එසේම, අපගේ සිසුන් වත්මන් රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ බව සහතික කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍රවල වර්තමාන ඉල්ලීම් සහ ප්‍රවණතා සපුරාලීම සඳහා පීඨය නිතර විෂයමාලා සංශෝධනය කරයි.

vi. තිරසාර සංවර්ධන ඉලක්ක (10)ට සමගාමීව, ශිෂ්‍ය ප්‍රවේශ වැඩසටහන්වල කොටසක් ලෙස පීඨ ශිෂ්‍ය සංගමය විසින් තෙපොංගල්, වෙසක්, රාමසාන් සහ හජ් උත්සව ඇතුළු සංස්කෘතික සැමරුම් වැඩසටහන් මාලාවක් සංවිධානය කර ඇත.

vii. සාමය ගොඩනැගීම, ආචාර ධර්ම අධ්‍යාපනය සහ අන්තර් ආගමික සංවාද පිළිබඳ ජාත්‍යන්තර පුහුණුකරුවෙකු වන සුචිත් අබේවික්‍රම මහතා විසින් විවිධත්ව සංවේදීතා සහ ශාස්ත්‍රීය උපදේශන වැඩමුළුවක් 2022 නොවැම්බර් මස 26 සහ 27 යන දිනවල සිසුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

මෙම වැඩසටහනේ අරමුණ වූයේ තිරසාර සංවර්ධන ඉලක්ක (10) වෙත ගමන් කිරීමේ දී අන්තර් ආගමික සංවාද සහ වෙනස් කොට සැලකීමේ විරෝධී භාවිතයන් ප්‍රවර්ධනය කිරීමයි.

viii. ආදිවාසී සමාජ විද්‍යා දෙපාර්තමේන්තුවේ පළමු වසරේ සිසුන් (2020/2021 කණ්ඩායම) "ආදිවාසී ප්‍රජාවන් සහ පරිසරය සමඟ ඔවුන්ගේ සබඳතාව හඳුනා ගැනීම" යන මාතෘකාව යටතේ භූමිකා සැසියක් සංවිධානය කරන ලද්දේ දේශීය භූගෝලීය පද්ධති පාඨමාලා ඒකකය තුළ ඉගෙනීමට පහසුකම් සැලසීම පිණිස වේ - ප්‍රායෝගික (BSSI 12012). මෙම වැඩසටහන දේශගුණය සහ වගකිවයුතු පරිභෝජනය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක (12 සහ 13) සමඟ සෘජුවම සම්පාත වේ.

ix. දේශගුණය සහ වගකීම් සහිත පරිභෝජනය පිළිබඳ තිරසාර සංවර්ධන ඉලක්ක (12 සහ 13) සමඟ සෘජුව සම්පාත වන ‘‘ජලය සුරකින්න’’ යන තේමාව යටතේ 2022 මාර්තු 5 වන දින ලෝක ජල දිනය නිමිත්තෙන් පීඨය විසින් මාර්ගගත පෝස්ටර් සහ වීඩියෝ බෙදාගැනීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. 2022 සහ 2023 ලෝක පරිසර දිනය නිමිත්තෙන් පීඨය විසින් ඔන්ලයින් පෝස්ටර් තරඟ, දැනුම බෙදාගැනීමේ සැසි සහ රුක් රෝපණ ව්‍යාපාර සංවිධානය කරන ලදී. පෝස්ටර් තරඟයට සහභාගී වූ සියලුම දෙනාට සහ ජයග්‍රාහකයින්ට විද්‍යුත් සහතික ලබා ගත් අතර පෝස්ටර් පීඨ ෆේස්බුක් පිටුවේ පළ කරන ලදී.

x. සිසුන් පිරිසක් විසින් ඔටිසම් පිළිබඳ දැනුවත් කිරීමේ කඳවුරකට සහභාගී වූ අතර තිරසාර සංවර්ධන ඉලක්ක (14) ට සමගාමීව, 2023 ලෝක ඔටිසම් දිනය නිමිත්තෙන් ගල්කිස්ස වෙරළ තීරයේදී සැලකිය යුතු අහිතකර බලපෑම් මඟහරවා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති සුරැකීමේ වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පීඨ ශිෂ්‍යයින් විසින් පවත්වන ලදී.

xi. පීඨ ශිෂ්‍ය සංගමය මඟින් නායයෑම් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීමට සහ පරිසර පද්ධති ආරක්ෂා කිරීමට කොත්මලේ CP/KOT/හේදුනුවැව මධ්‍ය මහා විද්‍යාලයේ දී නායයෑම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. මෙම වැඩසටහන තිරසාර සංවර්ධන ඉලක්ක (15) සමඟ සම්පාත වේ.



22. විගණාධිපති වාර්තාව - 2022





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. WPCG/GP/D/GWUIM/1/22/4

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 29 දින



උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571	එකතු වටිනාකම රු.1,684,780 ක් වූ වසර 02 කට වැඩි කාලයක් පවතින ටෙන්ඩර් තැන්පතු හා රඳවා ගැනීමේ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හා මුදල් රෙගුලාසි 371(2)	(i) තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි උපරිම සීමාව ඉක්මවා අවස්ථා දෙකකදී එකතුව රු.345,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. (ii) නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව අවස්ථා 17 කදී ලබාදී තිබුණු රු.798,340 ක අත්තිකාරම් වලින් සියයට 43 සිට සියයට 83 දක්වා ඉතිරිවීම් පැවතුණු අතර අවස්ථා 14 කදී ලබාදෙන ලද රු.599,350 ක අත්තිකාරම් අදාළ කාර්යයන් සිදුනොකර මුළු මුදලම ආපසු පියවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) විධිමත් සැලසුමකින් තොරව අභ්‍යන්තර අධ්‍යයන කාර්යමණ්ඩලයට නිවාඩු ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් මඟින් දේශන ආවරණය කර ගෙන රු. 840,675 ක දීමනා ගෙවා තිබුණි.

(ආ) 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි ඉටුකර ගැනීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් 77 න් ක්‍රියාකාරකම් 14 ක් වර්ෂය තුළ ආරම්භ කර නොතිබූ අතර ක්‍රියාකාරකම් 48 ක ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාල කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොතිබීම හේතුවෙන් දේශීය වෛද්‍ය සම්පත් දෙපාර්තමේන්තුව සඳහා 2022 ජූනි 15 දින සිට මාසයකට රු.550,000 බැගින් වර්ෂ 02ක කල්බදු පදනමට යක්කල පාරේ ගොඩනැගිලි පරිශ්‍රයක් ලබා ගෙන තිබුණු අතර එය භාවිතයට සුදුසු තත්ත්වයට පත්කර ගැනීමට අමතර ඉදිකිරීම් හා වැඩ සඳහා රු.8,817,467ක් වැනි විශාල මුදලක් වැය කර තිබුණි. එමෙන්ම සමාජවිද්‍යා අධ්‍යනාංශය හා කළමනාකරණ අධ්‍යනාංශය සඳහා මාසයකට රු.750,000 ක කුලියට 2022 ජනවාරි 01 දින සිට වර්ෂ 03ක් සඳහා මොරටුව ප්‍රදේශයෙන් ගොඩනැගිලි කුලියට ලබාගෙන තිබුණද එය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සිට කි.මී 50කට වැඩි දුරකින් පිහිටා තිබුණු අතර කළමනාකරණ අධ්‍යයනාංශය සඳහා වන පාඨමාලා ආරම්භ කිරීම 2022 දෙසැම්බර් 31 දින දක්වාම සිදුවී නොතිබුණි.

(ඈ) වතුපිටිවල මාතලානේ පිහිටි හෙක්ටයාර් 2.3533 ක භූමි ප්‍රමාණයකින් යුතු ඖෂධ උද්‍යානය විශ්වවිද්‍යාලය වෙත නිදහස් දීමනාවකින් 2013 ජූලි 31 වන දින පවරා දී තිබූ අතර එම උද්‍යානයේ පවතින ඖෂධ පැළෑටි හා වෘක්ෂ ලතා ආදිය පිළිබඳ විධිමත් සංගණනයක් සිදුකර ඒවායේ පිහිටීම් දැක්වෙන වාර්තාකරණයක් පවත්වා ගැනීමද සිදුකර නොතිබුණි. එසේම එම උද්‍යානය ආයතනයේ අරමුණු සඳහා උපයෝගී කර ගැනීම සහ උද්‍යානයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට වාර්තාවේ දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ පංචකර්ම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ගැනීම සඳහා 2005 වර්ෂයේදී ලැබී තිබුණු රු.250,000 ක පරිත්‍යාග මුදල අදාළ අරමුණ වෙනුවෙන් යොදා ගැනීමකින් තොරව 2005 නොවැම්බර් 30 දින සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු.1,070,927 වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

23. 2022 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු





ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කරුණු පැහැදිලි කිරීම්

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 **නීතිරීති / විධානයට යොමුව**

(අ) විවිධ කොන්ත්‍රාත් හා වෙනත් කටයුතු වෙනුවෙන් ඇප තැන්පතු වශයෙන් තබා ගෙන තිබූ එකතු වටිනාකම රු.342,553.00 ක් වූ ඇප තැන්පතු 2023.04.25 දින පැවති විශ්වවිද්‍යාලයේ 20 වෙනි මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු ආදායමට ගැනීමට නිර්දේශ කරන ලදී.
ආපන ශාලාව පවත්වාගෙන යාමේදී රදවා තබා ගත් තැන්පතු මුදල් රු. 27,000.00 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයවිය යුතු අලාභයන් පියවා ගැනීමට යොදා ගෙන ජර්නල් අංක 2023/ 0076 මගින් නිවැරදි කර ඇත.
විශ්වවිද්‍යාලයේ ඡායා පිටපත් සේවාව ලබා ගැනීමට අදාළව රු. 10,000.00 තැන්පතුවක් රඳවා තබා ගෙන ඇති අතර අදාළ සේවය තවදුරටත් පවත්වාගෙන යන බැවින් තැන්පතු මුදල ඉදිරියට තබා ගනු ලැබේ.
රු. 65,170.00 ක මුදලක් විශ්වවිද්‍යාලයේ පිරිසිදු කිරීමේ කොන්ත්‍රාත් ඇප වශයෙන් තබා ගෙන තිබූ අතර එම සේවාව සැපයීම අවසාන බැවින් එකී මුදල 2023.04.10 දින නිදහස් කිරීමට කටයුතු කර ඇත.
තවද, එකතු වටිනාකම රු. 1,240,057.00 ක් වන කොන්ත්‍රාත් ගිවිසුම් වලට අදාළ රැඳවුම් මුදල් 2023 අප්‍රේල් මස 25 දින පැවති 20 වෙනි මුදල් කමිටුව විසින් ආදායමට ගැනීමට තීරණය කරන ලදී. ඒ අනුව 2023 අප්‍රේල් මස 28 දින ජර්නල් අංක 2023/0074 මගින් ආදායමට ගන්නා ලදී. ඉදිරියේදී මෙම රදවා ගැනීමේ මුදල් සම්බන්ධයෙන් නියමිත රැඳවුම් කාල සීමාව අවසානයේදී අවශ්‍යතාවය අනුව අයකර ගැනීමට හෝ, කොන්ත්‍රාත්කරු විමසා නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කිරීම සඳහා අදාල නිළධාරීන් දැණුවත් කරන ලදී.

(ආ)

(i) විශ්වවිද්‍යාලයෙන් බැහැරව පවත්වන්නට යෙදුන අන්තර් විශ්වවිද්‍යාලීය කැරම් සම්මේලනය මගින් සංවිධානය කරන ලද තරඟාවලියේ සංවිධානය කිරීමේ කටයුතු මෙම විශ්වවිද්‍යාලයට පැවරී තිබූ අතර එම කටයුතු සඳහා මෙම අත්තිකාරම් මුදල් නිදහස් කර ඇත. එහිදී අදාළ තරඟාවලිය සංවිධාන කටයුතු සඳහා වියදම් ඇස්තමේන්තුව 2022.12.29 දින පැවති 16 වන මුදල් කමිටුව මගින් අනුමත කර ඇත. එම අනුමැතියෙන් පසුව, පැවති ප්‍රායෝගික තත්ත්වය මත හා අවශ්‍යතාවය අනුව මෙය විශේෂ කාර්යයක් ලෙස සලකා උපකුලපතිතුමාගේ විශේෂ අනුමැතියක් යටතේ මුදල් ලබා දීමට කටයුතු කරන ලදී.

(ii) අත්තිකාරම් මුදල් අනුමත කිරීම සහ නිකුත් කිරීම ඇස්තමේන්තුවක් මත සිදු කරන අතර ඇස්තමේන්තුවේ සඳහන් ඇතැම් කාර්යයන් අදාළ අවස්ථානුකූලව සිදු නොකිරීම මත ඉනිරි වී ඇති මුදල් පවතින අවස්ථා වලදී එකී මුදල් මෙන්ම, නිකුත් කරන ලද නමුත්, අවශ්‍යතාවයේ සිදුවූ වෙනස්කම් හේතුවෙන් හෝ භාවිතා නොකළ අත්තිකාරම් මුදලුත්, එකී සෑම අවස්ථාවකදීම කිසිදු ප්‍රමාදයකින් තොරව පියවා ඇත.

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් අධ්‍යයන හා පර්යේෂණ කටයුතු වල නිරන්තරයෙන් හා අඛණ්ඩව නියැලෙමින් ස්වකීය දැණුම යාවත්කාලීනව පවත්වා ගැනීම අනිවාර්යය වේ. එසේම, සියළුම ආධුනික කථිකාචාර්යවරුන් විසින් පරිවාස කාලය තුළදී පශ්චාත් උපාධි සම්පූර්ණ කළ යුතු වේ. එකී කටයුතු උදෙසා යොමු විය යුතු කථිකාචාර්යවරුන් වෙනුවෙන් ඔවුන්ගේ ඉල්ලීම අනුව, විශ්වවිද්‍යාලයේ පාලක සභා අනුමැතියෙන් නිවාඩු අනුමත කර දී ඇති අතර එම කථිකාචාර්යවරුන් අධ්‍යයන කටයුතුවල නියැලෙන කාලය සඳහා තාවකාලිකව බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගෙන චක්‍රලේඛ ප්‍රකාරව ඊට අදාළ ගෙවීම් සිදු කර ඇත. කෙසේ වුවද, පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කළ කථිකාචාර්යවරුන්ගේ සේවය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු වල තත්ත්වය ඉහළ නැංවීමට අත්‍යාවශ්‍ය වේ.

(ආ) 2021 සහ 2022 රටතුළ පැවති අස්ථාවරතාවයන් හේතුවෙන් සැලසුම් කළ පරිදි කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වූ අතර 2023 වර්ෂයේ එසේ පසුගාමී වූ කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සොයා බලමින් සහ නිරන්තර ප්‍රගති සමාලෝචනයන් සිදු කරමින් එකී කටයුතු සම්පූර්ණ කිරීමට ක්‍රියා කරනු ලැබේ. තවද, රාජ්‍ය ආයතන වල වියදම් සීමා කිරීම සඳහා රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සහ විධි විධාන අනුව 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට තිබූ ඇතැම් ඉදිකිරීම් ව්‍යාපෘතීන් කල් තැබීමට සහ මිලදී ගැනීම් අත්හිටුවීමට කටයුතු කර ඇත.

(ඇ) ගම්පහ, යක්කල පාරේ 62/බී/2 දරන ස්ථානයේ ගොඩනැගිල්ල කල්බදු පදනමට ලබා ගෙන විශ්වවිද්‍යාලයට අවශ්‍ය කටයුතු පවත්වා ගෙන යාමට හැකි පරිදි සකස් කර ගන්නා ලදී. එහිදී එකී ගොඩනැගිල්ල යොදා ගැනීමට නියමිත වූයේ දේශීය සෞඛ්‍ය විද්‍යා හා තාක්ෂණ පීඨයේ දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යනාංශයේ කටයුතු වෙනුවෙන්ය. එහිදී Biology Laboratory, Chemistry Laboratory, Instrument Laboratory යනුවෙන් විද්‍යාගාර 3 ක් වෙනුවෙන් සහ කථිකාචාර්යවරුන්ගේ කාර්යාල පහසුකම් වෙනුවෙන් කුලියට ලබා ගත් ගොඩනැගිල්ල කොටස් වශයෙන් වෙන් කර ඇත. ඒ සදහා රු. 7.512.871./= හා තාවකාලික ගරාජයක් ඉදිකිරීම වෙනුවෙන් රු 194,940/= විශ්වවිද්‍යාලය විසින් දරා ඇත. තවද, මෙම එක් කිරීම් සදහා යොදා ගන්නා ලද ද්‍රව්‍ය සහ උපකරණ එකී ගොඩනැගිල්ලේ බදු කාල සීමාව අවසානයේ දී නැවත විශ්වවිද්‍යාලයට ප්‍රයෝජනයට ගැනීමට හැකි බවද සැලකිල්ලට ගෙන අදාළ එක්කිරීම/ඉදිකිරීම් කර ඇත.

සර්වෝදය උසස් ඉගෙනුම් මධ්‍යස්ථානය, ආලෝක වත්ත, අලුත්ගම, බණ්ඩාරගම හි පිහිටා ඇති මසකට රු. 750,000.00 ක මුදලකට කුලියට ගෙන ඇති ස්ථානයේ දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය පිහිටුවා ඇති අතර ඊට හේතු වනුයේ ප්‍රධාන වශයෙන්ම, පහත කරුණුය.

- Bachelor of Science (Honours) in Social Studies in Indigenous Knowledge උපාධි පාඨමාලාවෙහි අන්තර්ගතය වනුයේ ශ්‍රී ලාංකීය සමාජය හා සංස්කෘතිය පිළිබඳ හැදෑරීම හා පර්යේෂණ කටයුතු වල නියැලීමයි. මේ සදහා ඉතාමත් සුදුසු පරිසරයක් මෙම පීඨය දැනට ස්ථාපිත කර ඇති පරිශ්‍රයේ ඇති බැවින් එය පීඨය ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලෙස තීරණය කරන ලදී. ඒ අනුව මේ වන විටත් පීඨයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨමාලාවට අදාලව මෙම ප්‍රදේශයේ පර්යේෂණ, සමාජ හා ප්‍රජා සත්කාර කටයුතු වල නියැලී සිටිති.
- තවද ජාතික සර්වෝදය ශ්‍රමදාන ආයතනයේ ප්‍රධාන අරමුණ වනුයේ සමාජ හා ප්‍රජා සත්කාර කටයුතු බැවින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් එම ආයතනය සමග ඉදිරියේදී (තුන් වන හා අවසාන වසර තුල) සම්බන්ධ වීමට ඇති හැකියාව මත මෙම තීරණය ගන්නා ලදී.

- තවද එම ගොඩනැගිලි පරිශ්‍රය තුල සිසුන්ට නවාතැන් පහසුකම් සැපයීමට සුදුසු ගොඩනැගිලි අන්තර්ගත වීමද මෙම තීරණය ගැනීමට බලපාන ලදී.

කළමනාකරණ අධ්‍යයන අංශය විසින් නිර්මාණය කරන ලද උපාධි පාඨමාලාව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමැතිය ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කල අතර එය කොමිෂන් සභාවේ අනුමත ක්‍රියාවලියෙහි අවසන් අදියරෙහි පවතී. අදාළ අනුමැතිය ලැබෙන තෙක් අතරතුර කාලයේදී එම අධ්‍යයන අංශය විසින් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවක් නිර්මාණය කර ඇති අතර එම සහතික පත්‍ර පාඨමාලාව සඳහා අධ්‍යයන කටයුතු 2022 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ වල සිසුන් සඳහා ආරම්භ කොට ඇත.
තවද අනෙකුත් පීඨ වල උපාධි පාඨමාලාවල අන්තර්ගත කළමනාකරණ විෂයයන් වල ඉගැන්වීම් කටයුතු ද මෙම අධ්‍යයන අංශය විසින් සිදු කරනු ලබයි. කළමනාකරණ අධ්‍යයන අංශය විසින් කළමනාකරණ විෂයය සම්බන්ධ කෙටි පාඨමාලා කිහිපයක්ම නිර්මාණය කර ඇති අතර ඉදිරියේදී එම පාඨමාලා බාහිර අපේක්ෂකයින් සඳහා ආරම්භ කිරීමට සියලු කටයුතු සූදානම් කර ඇත. (විගණන අධිකාරීගේ 2023.04.06 දිනැති සහ අංක WPCG/GP/D/GWUIM/D/2022/09 දරණ විගණන වීමසුම සඳහා විශ්වවිද්‍යාලය විසින් ලබා දුන් පිළිතුරෙහි අදාළ විස්තර අමුණා ඇත.)

(ආ) වතුපිටිවල ඖෂධ උද්‍යානය හා එහි ඇති ඖෂධ පැල සහ ශාකවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා 2022 වසරේදී එම උද්‍යානය වටා රු 6,802,892.27+ වැටී බදු පමණ වියදමින් ආරක්ෂිත වැවක් සවිකිරීමට කටයුතු කරන ලදී.තව ද වාර්ෂිකව ඖෂධ පැල රෝපනය කිරීමේ වැඩසටහන් දේශීය වෛද්‍ය විද්‍යා පීඨය මඟින් ක්‍රියාත්මක කිරීම ද සිදු කරනු ලබයි.

මෙම උද්‍යානය ආයතනයේ අරමුණු සඳහා උපයෝජනය කරගැනීමේ අරමුණින් 2022.05.27 දින පැවති 12 වන සනාතන සභාවේ හා 2022.07.21 දින පැවති 16 වන පාලක සභාවේ අනුමැතිය පරිදි එම පරිශ්‍රයේ පටක රෝපණ විද්‍යාගාරය (Tissue Culture Lab) සකස් කිරීම සඳහා අදාළ පිටිතරයන්ට අනුව සැලැස්මක් සකස් කර ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. මේ වන විට ඒ සඳහා අවශ්‍ය බිම් සැකසුම් කටයුතු ද වතුපිටිවල පරිශ්‍රය තුළ සිදු කෙරෙමින් පවතී.
තව ද 2023.02.28 දින උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති 02/2023 දරණ ප්‍රගති සමාලෝචන රැස්වීමේදී වතුපිටිවල ඖෂධ උද්‍යානයේ ඉදිරි සංවර්ධන කටයුතු හා උපයෝජනය පිළිබඳ සැලැස්මක් සකස් කර ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් කමිටු සාමාජිකයන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී.

- අංශ ප්‍රධාන - ද්‍රව්‍ය ගුණ විඥාන අධ්‍යයනාංශය -දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
- අංශ ප්‍රධාන - දේශීය වෛද්‍ය සම්පත් අංශය - දේශීය සෞඛ්‍ය විද්‍යා හා නාක්ෂණ පීඨය
- අංශ ප්‍රධාන - දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය

ඒ අනුව එම කමිටුව මඟින් ඉදිරිපත් කරන සැලැසුම් සහ නිර්දේශයන් සලකා එම උද්‍යානයේ ඉදිරි සංවර්ධන කටයුතු සිදුකිරීමට නියමිතව ඇත. තවද, එකී කමිටුවට අදාළ වගකීම් යටතේ එම ඖෂධ උද්‍යානයේ පවතින ඖෂධ පැලෑටි සහ වෘක්ෂලතා පිළිබඳව පූර්ණ හා විධිමත් සංගණනයක් පවත්වා ක්‍රමවත් ලේඛනයක් සකස් කිරීමට නියමිතව ඇත.

(ඉ) පංචකර්ම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කාර්ය එම වර්ෂවලදීම සිදු කර ඇති අතර එම අළුත්වැඩියාව සඳහා මෙම මුදල් භාවිතයට ගැනීමට අවශ්‍යතාවයක් නොමැති වූ බැවින් ඉදිරියේදී එම ගොඩනැගිල්ලේ අළුත්වැඩියාවක් සිදු කිරීමට අවශ්‍ය වුවහොත් භාවිතයට ගැනීමට තබා ඇත.

Professor Ranjana W. Senevirathna
Vice Chancellor
The Gampaha Wickramarachchi
University of Indigenous Medicine, Sri Lanka

මහාචාර්ය රංජන ඩබ්ලිව් සෙනෙවිරත්න
උපකුලපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

පිටපත්: ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව